

වාර්ෂික වාර්තාව
2022

ජල සම්පත් මණ්ඩලය

ජල සම්පාදන අමාත්‍යාංශය

පටුන

	පිටු අංකය
හැඳින්වීම	04
දැක්ම	05
මෙහෙවර	05
අරමුණු	06
කාර්යයන්	07
ආයතනික තොරතුරු	08
ආයතනික පාලන ව්‍යුහය පෙර ගමන්කරුවන් විගණන හා කළමනාකරණ කමිටුව ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්	09
කාර්යය මණ්ඩල තොරතුරු	12
ප්‍රධාන ක්‍රියාකාරකම්	14
2022 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් කාර්යයන්	15
මූල්‍ය ප්‍රකාශනය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය භාණ්ඩාගාර ප්‍රදාන අනාවරණය කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයට සටහන්	53
විගණකාධිපති වාර්තාව	72
විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම	86
2022 ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතියේ සාරාංශ	98

හැඳින්වීම

1964 අංක 29 දරණ ජල සම්පත් පනත යටතේ 1966 දී ස්ථාපිත කරන ලද ජල සම්පත් මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජල සම්පත් පාලනය හා ඵලදායී අයුරින් උපයෝගී කරගැනීම ආදී සියළු කරුණු පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දෙන ආයතනයක් වශයෙන් පැවතිණි.

1978 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූජල අංශය ජල සම්පත් මණ්ඩලයට අනුයුක්ත කරන ලද බැවින් මණ්ඩලයේ කාර්යයන් පුළුල්ව ක්‍රියාත්මක විය. උපදේශක සේවාවක්ව පැවති ජල සම්පත් මණ්ඩලය වාණිජමය කාර්යයන්හි නියැලීමට හැකිවන පරිදි හා ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පතට අදාළ කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට ජල සම්පත් මණ්ඩලයට බලය පවරාදීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත 1999 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සංශෝධනය කරන ලදී.

2017 මාර්තු 16 වන දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍ර අංක 2010/23 අනුව දක්වන ලද කටයුතු සඳහා ස්වභාවික ජල උල්පත් හා භූගත ජලය භාවිතා කිරීමට ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය හා මඟ පෙන්වීම ලබා ගත යුතු බව නියම කරන ලදී.

දැක්ම

පිරිසිදු හා ආරක්ෂිත ජලය සැමට ප්‍රමාණවත් පරිදි ලබාදීම.

මෙහෙවර

පොදු මහජනතාව, අදාල රාජ්‍ය දෙපාර්තමේන්තු/ අධිකාරී/ ආයතන/ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන හා දේශීය මෙන්ම විදේශීය විශේෂඥ සහ වෘතීයවේදී කණ්ඩායම් සමඟ සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගනිමින් ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත තක්සේරු කිරීම, ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සම්බන්ධයෙන් රජයට හා ජනතාවට උපදෙස් ලබාදීම.

අරමුණු

- දිවයිනෙහි භූගත ජල සම්පත් පිළිබඳව පර්යේෂණ සිදු කිරීම
- භූගත ජල සම්පත් පිළිබඳ වූ විද්‍යාත්මක දත්තයන් එක්රැස් කිරීම
- භූගත ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදුකිරීම
- භූගත ජල සම්පත් පරිහරණය පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- භූගත ජල සම්පත් තක්සේරු කිරීම
- වෙනත් ආයතන හා සම්බන්ධීවී මණ්ඩලයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම
- භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය කිරීම

කාර්යයන්

1. රටේ ජල සම්පත් සංරක්ෂණය සහ උපයෝගීකරණය කිරීම ඇතුළත්ව ඒවා පාලනය කිරීම, විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම.

2. ගංඟා ඇළ මාර්ග හා වෙනත් ජල මාර්ග අපවිත්‍ර වීම වැළැක්වීම.

3. පහත සඳහන් අරමුණුවලින් රටේ ජල සම්පත් පාලනය හා පරිහරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම.

- ජල සම්පත් බහු කාර්ය ලෙස සංවර්ධනය හා පරිහරණය කිරීම.
- ගෘහ කටයුතු හා කාර්මික කටයුතු සඳහා කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව ජල සම්පත් ලබාදීම.
- ලවණතාව පාලනය කිරීම.
- වෙනත් යම් සමාන අරමුණු

5. ජල භූ විද්‍යාත්මකව සම්බන්ධව මූලික දත්ත සමීක්ෂණ සහ අනෙකුත් පරීක්ෂණ වලට අනුව රජයේ දෙපාර්තමේන්තු පළාත් පාලන ආයතන සහ රාජ්‍ය සංස්ථාවල ක්‍රියාකාරකම් වල සම්බන්ධීකරණයක් ඇති කිරීම.

6. රටේ භූගත ජල සම්පත් සම්බන්ධයෙන් රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා මඟින් සිදු කරනු ලබන පර්යේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ, සැලසුම් සහ යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම.

7. රටේ භූගත ජල සම්පත් සංරක්ෂණයට, උපයෝගීකරණයට සහ සංවර්ධනයට අදාළව රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ එම ව්‍යාපෘති පවත්වා ගැනීමේ හැකියාව, එල ප්‍රයෝජන සහ ආර්ථික සංඛ්‍යතාව තක්සේරු කිරීම.

8. භූගත ජලය නිසි ලෙස පාලනය හා ආර්ථිකමය පරිහරණය සඳහා රජය විසින් ගතයුතු වන වෙනත් ඕනෑම සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

ආයතනික තොරතුරු

ආයතනය
ජල සම්පත් මණ්ඩලය

නෛතික තත්ත්වය
රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

ස්ථාපිත වර්ෂය
1966 දී 1964 අංක 29 දරණ පාර්ලිමේන්තු පනත මඟින් 1999 දී, 1999 අංක 42 දරණ ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත මඟින් ඉහත පනත සංශෝධනය කරන ලදී.

ප්‍රධාන කාර්යාලය
2021.07.20 සිට 2022.07.19
288/12විල්, රෝයල් ගාඩ්න්ස්,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

2022.07.20 සිට මේ දක්වා
488/ඒ,නාවල පාර, කොස්වත්ත, රාජගිරිය.

දුරකථන: +94 11 2694835, +94 11 2697050
ෆැක්ස්: +94 11 2669517 (පාලන)
ඊමේල්: helpdesk@wrb.gov.lk
වෙබ්:www.wrb.gov.lk

රේඛීය අමාත්‍යාංශය
ජල සම්පාදන අමාත්‍යාංශය

බදු හඳුනාගැනීමේ අංකය
409018017

එ.අ.බ. ලියාපදිංචි අංකය
409018017 - 7000

බැංකුකරුවන්
ලංකා බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ආදායම් බදු උපදේශක
ARS ඇසෝසියේට්
(වරලත් ගණකාධිකාරී)

විගණකවරුන්
විගණකාධිපති දෙපාර්තමේන්තුව
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ජල සම්පාදන අමාත්‍යාංශය)
අභ්‍යන්තර විගණක (ජල සම්පත් මණ්ඩලය)

අධ්‍යක්ෂක මණ්ඩලය
ආචාර්ය ජේ.ඩී.සමරසිංහමහතා - සභාපති
සී.රත්නමලල බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ
එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා - අධ්‍යක්ෂ
ඒ.කේ.ඩී.එස්.පී.මහානාම මහතා - අධ්‍යක්ෂ
ආර්.කේ.එල්.ජාගොඩ මිය - භාණ්ඩාගාර
(2022.03.03 දක්වා) නියෝජිත
එල්.ඒ.වයි ද සිල්වා මිය - භාණ්ඩාගාර
(2022.03.04 සිට මේ දක්වා) නියෝජිත

ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්
ඉංජි. එච්.සී.ජේ.තිලකරත්න මහතා
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)
(අතිරේක ලේකම්
ජල සම්පාදන අමාත්‍යාංශය)
(2022.11.30 දක්වා)
කේ.ජී.ඩී.ප්‍රියංකා මිය
සාමාන්‍යාධිකාරී (වැඩ බලන)
(අධ්‍යක්ෂ (සංවර්ධන)
ජල සම්පාදන අමාත්‍යාංශය)
(2022.12.01 සිට මේ දක්වා)
එම්.ඒ.පුෂ්පකුමාර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මුදල්)
ඒ.ඩී.එම්.චන්ද්‍රසිරි මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
ආර්.එම්.එස්.රත්නායක මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)
(වැඩ බලන)
කේ.එම්.යු.සී.බී. කුලතුංග මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
ඩී.ජී.එස්. වික්‍රම මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)
ආර්.ආර්.ජී. ආර්. රාජපක්ෂ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)

ආයතනික පාලන ව්‍යුහය

පෙර ගමන්කරුවන්

ආචාර්ය ජේ.ඩී.සමරසිංහ මහතා	-	සභාපති
සී.රත්නමලල බණ්ඩාර මහතා	-	අධ්‍යක්ෂ
එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා	-	අධ්‍යක්ෂ
ඒ.කේ.ඩී.එස්.පී.මහානාම මහතා	-	අධ්‍යක්ෂ
ආර්.කේ.එල්.ජාගොඩ මිය	-	භාණ්ඩාගාර නියෝජිත (2022.03.03 දක්වා)
එල්.ඒ.වයි.ද සිල්වා මිය	-	භාණ්ඩාගාර නියෝජිත (2022.03.04 සිට මේ දක්වා)

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝපිත වර්ෂය තුල අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් හයක් (06) පවත්වන ලදී .

විගණන හා කළමනාකරණ කමිටුව


i. ආර්.කේ.එල්.ජාගොඩ මිය - සභාපති - භාණ්ඩාගාර නියෝජිත (2022.03.03 දක්වා)
ii. එල්.ඒ.වයි ද සිල්වා මිය - සභාපති - භාණ්ඩාගාර නියෝජිත (2022.03.04 සිට මේ දක්වා)
iii. සී.රත්නමලල බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ
iv. එච්.ආර්.එම්.කිරිඇල්ල මහතා - අධ්‍යක්ෂ
v. ඊ.ඒ.ඩී.පී.ප්‍රසන්න මහතා - නිරීක්ෂක - රජයේ විගණන අංශය
vi. එස්.ඩබ්.ගුණවර්ධන මිය - නිරීක්ෂක - ජල සම්පාදන අමාත්‍යාංශය

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්


2022 වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වන ලදී.

ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් - 2022 වර්ෂය

i.	ඉංජි. එච්.සී.ජේ.තිලකරත්න මහතා	-	සාමාන්‍යාධිකාරී (වැඩ බලන), අතිරේක ලේකම් ජල සම්පාදන අමාත්‍යාංශය (2022.11.30 දක්වා)
i.	කේ.ජී.ඩී.ප්‍රියංකා මිය	-	සාමාන්‍යාධිකාරී (වැඩ බලන) - අධ්‍යක්ෂ (සංවර්ධන) ජල සම්පාදන අමාත්‍යාංශය (2022.12.01)
iii.	එම්.ඒ.පුෂ්පකුමාර මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මුදල්)
iv.	ඒ.බී.එම්.චන්ද්‍රසිරි මහතා	-	සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
v.	ආර්.එම්.එස්.රත්නායක මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර් හා සං)
vi.	කේ.එම්.යු.සී.බී. කුලතුංග මහතා	-	සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
vii.	ආර්.ආර්.ජී.ආර්. රාජපක්ෂ මහතා	-	සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)
viii.	ඩී.ජී.එස්. වික්‍රම මහතා	-	සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)


මූලික විධායක නිලධාරී
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
කළමනාකාරිය
කණ්ඩායම් කළමනාකාරිය
කළමනාකරණ සහකාර තාක්ෂණික
කළමනාකරණ සහකාර තාක්ෂණික කණ්ඩායම
පි.ලැ/ 111 ශ්‍රාවණික ශිල්පීය
පි.ලැ/ 11 අධ්‍ය ශිල්පීය
පි.ලැ/1 ශිල්පීය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර් හා ප)-(1)
සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) හා හදිසි ආපදාවලට ප්‍රතිචාරදැක්වීම(1)
සහකාර සාමාන්‍යාධිකාරී(භූජල) (1)
සහකාර සාමාන්‍යාධිකාරී (පර් හා ප)(1)
සහකාර සාමාන්‍යාධිකාරී (රසායනාගාර)
සහකාර සාමාන්‍යාධිකාරී (විදුම්)(1)
කළමනාකරු (ප්‍රසම්පාදන) (1)
භූජල විද්‍යාඥ/භූජල විද්‍යාඥ (3)
පළාත් කළමනාකරු (5)
ජ්‍යෙෂ්ඨ භූජල විද්‍යාඥ (01)
ජ්‍යෙෂ්ඨ රසඥ (1)
කළමනාකරු (විදුම්) (3)
ඉංජිනේරු (සිවිල්) (1)
භූජලවිද්‍යාඥ (2)
රසඥ (6)
ජ්‍යෙෂ්ඨ භූජල විද්‍යාඥ/භූජලවිද්‍යාඥ (17)
විමර්ෂණ නිලධාරී (1)
ගබඩා අධිකාරී (1)
ප්‍රසම්පාදන නිලධාරී (1)
ඉංජිනේරු සහකාර (සිවිල්) (3)
විදුම් නිලධාරී (6)
පුස්තකාලාධිපති (1)
තොග නිලධාරී (1)
පුද්. සහකාර (සහාපති) (1)
විමර්ෂණ සහායක (4)
පරීක්ෂ නිලධාරී (1)
ජ්‍යෙෂ්ඨ ජල විශ්ලේෂක (1)
පුද්. සහකාර සාමාන්‍යාධිකාරී (1)
ගබඩා භාරකරු (3)
තාක්ෂණික සහකාර (සිවිල්)(5)
සහකාර විදුම් අධිකාරී (14)
පද්ධති ක්‍රියාකරු (1)
ජල විශ්ලේෂක (10)
තොරතුරු තාක්ෂණ ශිල්පී(1)
කළ.සහකාර (4)
කළ.සහකාර (2)
කළ.සහකාර (5)
කළ.සහකාර (1)
කළ.සහකාර (3
කළ.සහකාර (2)
රියදුරු (10)
විදුම් යන්ත්‍ර/ රියදුරු (7)
විදුම් යන්ත්‍ර ක්‍රියාකරු/ රියදුරු (7)
හඬන්තු සහායක (2)
විදුම් සහායක (7)
කාර්යාල සහකාර (2)
කාර්යාල සහකාර (5)
කාර්යාල සහකාර (2)
කාර්යාල සහකාර (1)
කම්කරු (3)
කම්කරු (5)
කම්කරු (20)
කම්කරු (2)
කම්කරු (3)
කම්කරු (60)

සංවිධාන සටහන


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) (1)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මා ස හා මු) (1)
3
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) (1)
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) (1)
සහකාර සාමාන්‍යාධිකාරී (පාලන හා මුදල්)
8
ඉංජිනේරු (යාන්ත්‍රික) (1)
ඉංජිනේරු (සිවිල්) (1)
ජෙෂ්ඨ තුජල විද්‍යාභෞතික විද්‍යාඥ (1)
ගණකාධිකාරී (1)
කළමණාකරු (පාලන) (1)
නීති නිලධාරී (1)
අභ්‍යන්තර විගණක (1)
47
ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික) (2)
ඉංජිනේරු සහකාර (සිවිල්) (1)
ප්‍රගති සම්බන්ධීකරණ නිලධාරී (1)
ගිණුම් නිලධාරී (1)
bn පාලන නිලධාරී (2)
ප්‍රධාන නිලධාරී (1)
විගණන නිලධාරී (1)
27
තාක්ෂණික සහකාර (යාන්ත්‍රික) (6)
තාක්ෂණික සහකාර (සිවිල්)(2)
ගිණුම් සහකාර (2)
විගණන සහකාර (2)
54
වැඩපල පරීක්ෂණක (2)
වැඩ පරීක්ෂක (2)
කළ.සහකාර(2)
කළ.සහකාර (1)
කළ.සහකාර (1)
කළ.සහකාර (1)
කළ.සහකාර (1)
කළ.සහකාර(6)
කළ.සහකාර (5)
කළ.සහකාර (2)
කළ.සහකාර (1)
ආරක්ෂක නිලධාරී (1)
38
ට්‍රැක්ටර්/පැත්සුමිලැළි (1)
වැල්ඩර්/පැත්සුම් (3)
බර යන්ත්‍ර ක්‍රියාකරු (2)
මෝටර් කාර්මික (2)
කෙඩ වැඩ්පිත්තරු (2)
මෝටර් විදුලි කාර්මික (1)
මේසන් (3)
ජල නල කාර්මික (4)
විදුලි කාර්මික (1)
රියදුරු (40)
83
නඩත්තු සහායක (1)
ප්‍රචාරක නිවාස භාරකරු (1)
11
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (4)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
කාර්යාල සහකාර (1)
142
කම්කරු (10)
කම්කරු (3)
ආරක්ෂක නියාමක (14)
414

2022.12.31 දිනට කාර්යය මණ්ඩලය

වැටුප් තලය	අනුමත කාර්යය මණ්ඩලය ස්ථිර	වර්තමාන කාර්යය මණ්ඩලය ස්ථිර
HM	12	06
MM	47	34
JM	27	10
MA	92	54
PL	236	154
එකතුව	**414**	**258**



2022.12.31 දිනට කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය

තනතුර	වැටුප් තලය	අනුමත සේවක මණ්ඩලය	වර්තමාන සේවක මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
සාමාන්‍යාධිකාරී	HM	1	0	1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	HM	3	1	2
සහකාර සාමාන්‍යාධිකාරී	HM	8	5	3
පළාත් කළමනාකරු	MM	5	0	5
භූජල විද්‍යාඥ / ජ්‍යෙෂ්ඨ භූජල විද්‍යාඥ	MM	24	24	0
ඉංජිනේරු (යාන්ත්‍රික)	MM	1	0	1
ඉංජිනේරු (සිවිල්)	MM	2	1	1
රසඥ	MM	7	6	1
කළමනාකරු (විදුම්)	MM	3	1	2
අභ්‍යන්තර විගණක	MM	1	1	0
ගණකාධිකාරී	MM	1	0	1
කළමනාකරු (පාලන)	MM	1	1	0
කළමනාකරු (ප්‍රසම්පාදන)	MM	1	0	1
නීති නිලධාරී	MM	1	0	1
ජ්‍යෙෂ්ඨ ජල විශ්ලේෂක	JM 1-1	1	0	1
පුද්ගලික සහකාර - සභාපති	JM 1-1	1	1	0
පුද්ගලික සහකාර - සාමාන්‍යාධිකාරී	JM 1-1	1	1	0
පාලන නිලධාරී	JM 1-1	2	2	0
ගිණුම් නිලධාරී	JM 1-1	1	1	0
ප්‍රවාහන / ප්‍රවර්ධන නිලධාරී	JM 1-1	1	0	1
පරිසර නිලධාරී	JM 1-1	1	1	0
විගණන නිලධාරී	JM 1-1	1	1	0
පුස්ථකාලාධිපති	JM 1-1	1	0	1
තොරතුරු තාක්ෂණ නිලධාරී	JM 1-1	1	1	0
ඉංජිනේරු සහකාර (සිවිල්)	JM 1-1	4	0	4
ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික)	JM 1-1	2	0	2
ගබඩා අධිකාරී	JM 1-1	1	0	1
ප්‍රසම්පාදන නිලධාරී	JM 1-1	1	1	0
විදුම් අධිකාරී	JM 1-1	6	1	5
ප්‍රගති අධීක්ෂණ නිලධාරී	JM 1-1	1	0	1
සැලසුම් නිලධාරී සහකාර	JM 1-1	1	0	1
තාක්ෂණික සහකාර (සිවිල්)	MA 2-2	7	1	6
තාක්ෂණික සහකාර (යාන්ත්‍රික)	MA 2-2	6	5	1
සහකාර විදුම් අධිකාරී	MA 2-2	14	10	4
සැලසුම් ශිල්පී	MA 2-2	4	0	4
ජල විශ්ලේෂක	MA 2-2	10	10	0
වැඩ පරීක්ෂක	MA 2-2	2	1	1
වැඩපල පරීක්ෂක	MA 2-2	2	0	2
පද්ධති ක්‍රියාකරු	MA 2-2	1	1	0
ගිණුම් සහකාර	MA 2-2	2	1	1
ගබඩා භාරකරු	MA 2-2	3	3	0
තොරතුරු තාක්ෂණ ශිල්පී	MA 2-2	1	1	0
කළමණාකරණ සහකාර	MA 2-1	2	2	0
කළමණාකරණ සහකාර	MA 1-2	37	19	18
ආරක්ෂක නිලධාරී / සහකාර	MA 1-2	1	0	1
විදුම් යාන්ත්‍රික ශිල්පී රියදුරු	PL 3	7	0	7
මේසන්	PL 3	3	2	1
ජල නල කාර්මික	PL 3	4	0	4
රියදුරු	PL 3	50	33	17
වෑද්දුම් ශිල්පී / පෑස්සුම් ශිල්පී	PL 3	3	2	1
මෝටර් කාර්මික	PL 3	2	1	1
පට්ටල්කරු / පෑස්සුම් ශිල්පී	PL 3	1	1	0
විදුලි කාර්මික	PL 3	1	0	1
මෝටර් විදුලි කාර්මික	PL 3	1	0	1
තහඩු වැඩ ශිල්පී / පින්තාරු ශිල්පී	PL 3	2	0	2
බර යන්ත්‍ර ක්‍රියාකරු	PL 3	2	0	2
විදුම් යන්ත්‍ර ක්‍රියාකරු සහ රියදුරු	PL 3	7	2	5
විදුම් සහායක	PL 2	7	0	7
නඩත්තු සහායක	PL 2	3	2	1
සංචාරක නිවාස භාරකරු	PL 2	1	0	1
කම්කරු	PL 1	105	86	19
කාර්යාල සහායක	PL 1	23	15	08
ආරක්ෂක නිලධාරී	PL 1	14	10	04
එකතුව		414	258	156

ප්‍රධාන ක්‍රියාකාරකම්

නල ළිං ඉදිකිරීම





ජල ධාරිතා පරීක්ෂණ





භූජල පරීක්ෂණ



ජල සාම්පල පරීක්ෂණ





ජල සම්පත් මණ්ඩලය විසින් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් කාර්යයන්

ජල සම්පත් මණ්ඩලයේ විෂය පථය සහ කාර්යභාරය

1965 අංක 29 දරන පනත මගින් ජල සම්පත් මණ්ඩලය පිහිටුවන ලද අතර එම පනතේ 12.1 වගන්තිය අනුව ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන විෂය පථය වූයේ අමාත්‍යවරයාට උපදෙස් දීමයි. ඒ අනුව 1979 වර්ෂයේ සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූගත ජල අංශයට අනුබද්ධව, භූගත ජල ගවේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා සහභාගී වීමත්, පනතේ 12.1 වගන්තිය යටතේ අවශ්‍ය කටයුතු සිදු කිරීමත් ජල සම්පත් මණ්ඩලය මගින් ඉටු කරනු ලබයි. ඒ අනුව මහවැලි සංවර්ධන ප්‍රදේශවල සහ අනෙකුත් වියළි කලාපීය ප්‍රදේශවල රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් ක්‍රියාත්මක වන (මොනරාගල, හම්බන්තොට, පුත්තලම, කුරුණෑගල, උතුරු හා නැගෙනහිර පළාත් වල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති වැනි) භූගත ජල ගවේෂණය, නළ ළිං ඉදිකිරීම්, අත් පොම්ප සවිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය ප්‍රමුඛත්වය ලබා දී ඇත.

බහුවිධ අරමුණු උදෙසා භූගත ජලය සඳහා ඇති ඉල්ලුම වැඩිවීමත් සමඟ, භූගත ජල සංවර්ධන කටයුතු සඳහා එහි විෂය පථය පුළුල් කිරීමට හැකි වන පරිදි 1999 දී, 1964 අංක 29 දරන පනත සංශෝධනය කිරීම හරහා භූගත ජලය පිළිබඳව වැඩි වගකීමක් ජල සම්පත් මණ්ඩලය වෙත පැවරිණි. මෙම සන්දිස්ථානයේදී, නළ ළිං ඉදිකිරීම් සහ අත් පොම්ප සවි කිරීම ආදී කටයුතු වලට අමතරව තව දුරටත් ජල සම්පත් මණ්ඩලය විසින් භූගත ජලය ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘති, අධ්‍යයන, භූගත ජල ගවේෂණ වැඩසටහන් සහ ජාතික ආර්ථික සංවර්ධනයට සහ ප්‍රජාවගේ යහපැවැත්මට දායක වන ඵලදායී ජලධර හඳුනාගැනීම් ආදී පුළුල් පරාසයක් තුල විහිදුනු කටයුතු රාශියක් සිදු කරන ලදී.

සහස්‍රකයේ මුල් දශකය තුළ, කිසිදු විද්‍යාත්මක මාර්ගෝපදේශයක් අනුගමනය නොකර සීමිත ජල සම්පතක් වන භූගත ජල ප්‍රභවයන් ලබා ගැනීම සඳහා පෞද්ගලික පාර්ශව මෙන්ම පෞද්ගලික ආයතන විසින් විවිධ අරමුණු සඳහා රට තුළ නළ ළිං ඉදිකිරීමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. මෙම ප්‍රවණතාවය නිසා භූගත ජලය සීමාවකින් තොරව විවිධ කටයුතු වලට උකහා ගැනීම හේතුවෙන්, මුහුදු ජලය රට තුලට ගලා ඒම නිසා ලවණීකරණය වැඩි වීම, භූගත ජලය ක්ෂය වීම, රටේ විවිධ ප්‍රදේශවල මානව ක්‍රියාවලීන් හරහා භූගත ජලය දූෂණය වීමෙන් ගුණාත්මක භාවය පිරිහීම ආදී හානිදායක කටයුතු සිදු වී ඇති බව මෙම සංවේදී භූගත ජල මූලාශ්‍ර ආශ්‍රිතව ජල සම්පත් මණ්ඩලය විසින් සිදු කරන ලද භූගත ජල අධ්‍යයනයන් මගින් හඳුනාගෙන ඇත.

ඉතා සංවේදී භූගත ජල මූලාශ්‍ර පවතින ප්‍රදේශ වල භූගත ජලයේ ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව පිරිහීම සහ ඒ හේතුවෙන් ඉදිරිපත් කරන ලද මහජන පැමිණිලි නිසා විවිධ කටයුතු හේතුවෙන් භූගත ජලයට සිදු වන බලපෑම් අවම කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් නිසි කළමනාකරණ සැලැස්මක් ඔස්සේ විසඳුම් සෙවීම සඳහා යොමු වන ලදී. ඒ අනුව මෙම කරුණු සැලකිල්ලට ගනිමින්, භූගත ජල සම්පත් නියාමනය, පාලනය සහ කළමනාකරණය කිරීමේ වගකීම ජල සම්පත් මණ්ඩලය වෙත පවරමින් 2017 වර්ෂයේදී අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සමත් විය.

වර්තමානයේදී, රටේ පවතින ඵලදායී ජලධර පිළිබඳ පර්යේෂණ, අධ්‍යයනය, අධීක්ෂණය සහ ගවේෂණය ආදී කටයුතු සිදු කිරීම මගින් එක්රැස් කරගන්නා තොරතුරු අනාගතයේ උපාය මාර්ගික හා ආර්ථික වශයෙන් වැදගත් සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රයෝජනයට ගැනීම ජල සම්පත් මණ්ඩලය මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. මීට අමතරව, සියලුම ආකාරයේ කැණීම් කටයුතු, උමං ඉදි කිරීම, සහ සියලුම ජාතික වශයෙන් වැදගත් සංවර්ධන ව්‍යාපෘති වලදී EIA, IEE, SEA ආදී කටයුතු වලදී භූගත ජලයට සිදුවන බලපෑම් තක්සේරුව හා එම බලපෑම් අවම කිරීම සඳහා නිර්දේශ ලබා දීම ජල සම්පත් මණ්ඩලය මගින් සිදු කෙරේ. ක්‍රමානුකූලව සිදු කරනු ලබන සැලසුම් පාලනයක් සහ නියාමනයක් සහිතව ක්‍රියාත්මක කිරීම මගින් මෙම අධ්‍යනයන් මගින් ලබා දෙන තොරතුරු හා නිර්දේශ , රටේ පවතින භූගත ජලයෙහි තිරසාර කළමනාකරණය සඳහා අඩිතාලම සපයයි.

මීට අමතරව, ජල සම්පත් මණ්ඩලයේ අනාගත සැලසුම් රටේ භූගත ජල සම්පත් නියාමනය හා කළමනාකරණ පිළිවෙත් වෙත යොමු කෙරේ. විශේෂයෙන්ම ප්‍රධාන ගංගා ද්‍රෝණි 03ක් ආශ්‍රිතව (මල්වතු ඔය, මාදුරු ඔය, කුඹුක්කන් ඔය) දැනට ක්‍රියාත්මක වන නියමු ව්‍යාපෘතිය මගින් හදුන්වා දෙන ක්‍රමානුකූල හා දිගු කාලින භූගත ජල නිරීක්ෂණ ජාලය මගින් අනාගත භූගත ජල නියාමන හා සංවර්ධන කටයුතු සඳහා මූලික අඩිතාලම සපයනු ඇත. දිගු කාලින සැලසුම් යටතේ මෙම ව්‍යාපෘතිය රටේ පවතින සියලුම ගංගා ද්‍රෝණි ආවරණය වන පරිදි පුළුල් කෙරේ. මේ අතර ගංගා ද්‍රෝණි 08 ක් ආශ්‍රිතව සිදු කිරීමට නියමිත භූගත ජල කළමනාකරණ අධ්‍යයනය

සඳහා වූ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ මූලික අදියර දැනට ආරම්භ කර ඇත. රටේ පවතින භූගත ජලය කළමනාකරණය හා නියාමනය සඳහා අවශ්‍ය නෛතික රාමුව ශක්තිමත් කිරීම සඳහා දැනට පවතින ජල සම්පත් පනත සංශෝධනය කිරීමේ කටයුතුද සිදු කරමින් පවති.

ජල සම්පත් මණ්ඩලය භූගත ජලය හා සම්බන්ධ සියලුම කටයුතු සඳහා වගකීම දරන ආයතනය වේ. මෙම කරුණ සැලකිල්ලට ගෙන, ජල සම්පත් මණ්ඩලය ප්‍රධාන වශයෙන් ගංගා ද්‍රෝණි ආශ්‍රිතව භූගත ජලය සම්බන්ධව පර්යේෂණ, නිරීක්ෂණ, නියාමන හා තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සකස්කරනු ලබයි. වර්තමානයේදී ජල සම්පත් මණ්ඩලය විසින් මූලික අවධානය යොමු කර ඇත්තේ භූගත ජලය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අවශ්‍ය නෛතික හා කළමනාකරණ ව්‍යුහය සකස් කිරීම සඳහා වේ.

2022 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්

2022 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සැලසුම් කරන ලදී. මූලික වශයෙන් ව්‍යාපෘති හා මෙහෙයුම් කටයුතු කොටස් තුනකට බෙදා දැක්විය හැක.

1) භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදු කරන ව්‍යාපෘති - ආයතන සංවර්ධන කටයුතු ඇතුළු භූගත ජල සම්පත් අධීක්ෂණය සහ කළමනාකරණය සහ ජලධර නැවත ආරෝපණය කිරීමේ ව්‍යාපෘති.

2) උත්පාදිත ක්‍රියාකාරකම් - මෙරට භූගත ජලය භාවිතා කරන්නන්ගේ වාණිජමය ක්‍රියාකාරකම් (නළ ළිං ඉදි කිරීම්, පිරිසිදු කිරීම, ජලධාරිතා පරීක්ෂණ, ජල තත්ත්ව විශ්ලේෂණය) සහ නිශ්චිත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශන තුළින් භූගත ජල සම්පත් නියාමනය.

3) විදේශ අරමුදල් යටතේ සිදු කරන ව්‍යාපෘති - මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ආශ්‍රිතව භූගත ජල අධීක්ෂණ ජාලයක් පිහිටුවීම (නියමු ව්‍යාපෘතිය) ක්‍රියාත්මක වෙමින් පවතින අතර දිගු කාලීන සැලැස්ම යටතේ ජල සම්පත් මණ්ඩලය විසින් එය රටේ සියළුම ගංගා ද්‍රෝණී දක්වා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ.

2022 වර්ෂයේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ඉහත සඳහන් ප්‍රධාන කාණ්ඩ තුන යටතේ පහත දක්වා ඇත.

1.) භාණ්ඩාගාර ප්‍රතිපදන යටතේ සිදු කරන ව්‍යාපෘති (2022) - රු.මි.8.8

#	උප ව්‍යාපෘති/ උප ක්‍රියාකාරකම්	TEC (රු.මි.)	බලාපොරොත්තු වන ප්‍රතිලාභ/ ප්‍රතිඵල
1	දීර්ඝ කාලීන භූගත ජල නියාමන ව්‍යාපෘතිය (LTGM): කොළඹ-මිගමුව, අම්පාර,මන්නාරම, වවුනියාව, කිලිනොච්චි, යාපනය, අනුරාධපුර, පොළොන්නරුව, මාතලේ, පුත්තලම.	3.0	දීර්ඝ කාලීන කළමනාකරණ හා සැලසුම් කටයුතු සඳහා රටේ සංවේදී භූගත ජලධර වල ජලයේ ගුණාත්මක භාවය හා ජල මට්ටම් වල වෙනස්කම් නිරීක්ෂණය කිරීම.
2	භූගත ජල සම්පත් කෙරෙහි දේශගුණ විපර්යාස වල සෘජු හා වක්‍ර බලපෑම් පිළිබඳව අධ්‍යයනය (SICC)	0.7	රටේ මුහුදුබඩ ප්‍රදේශවල පවතින භූගත ජල සම්පත් කෙරෙහි දේශගුණ විපර්යාස වල බලපෑම තක්සේරු කිරීම
3	මා ඔය ගංගා ද්‍රෝණියේ පවතින ජලධර නැවත ආරෝපණය සඳහා හිතකර කලාප හඳුනා ගැනීම (Ma-oya)	1.1	මා ඔය ද්‍රෝණියේ භූ ගත ජල සම්පත් කළමනාකරණය සඳහා භූ ජල විද්‍යාත්මක තක්සේරුව සහ ජලධර සිතියම් ගත කිරීම
4	භූගත ජල සම්බන්ධ පාරිසරික ගැටළු සඳහා සිදු කරන ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ (INSP)	0.2	භූ ගතජලය භාවිතය පිළිබඳ ගැටලු සඳහා පිළියම් යෙදීම සහ ගැටුම් නිරාකරණය සඳහා අනෙකුත් ආයතන හා ඒකාබද්ධව කටයුතු කිරීම
5	ශ්‍රී ලංකාවෙහි භූගත ජලය පැවතීම පිලිබඳ සිතියම් සකස් කිරීම (GW-ATLAS)	0.1	ශ්‍රී ලංකාවෙහි භූගත ජලය පැවතීම පිලිබඳ සිතියම් සකස් කිරීම
6	විද්‍යාත්මක හා අනෙකුත් ප්‍රාග්ධන කටයුතු වැඩි දියුණු කිරීම (ISOC)	1.0	ආයතනය ශක්තිමත් කිරීම මගින් ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.

7	හදිසි ආපදා අවස්ථා වල අවශ්‍යතා සඳහා භූගත ජලය සංවර්ධනය (නියඟ, ගංවතුර, භූගත ජල සම්පත් දූෂණය වීම) (E-USE)	0.3	
8	සේවක පුහුණු (ST)	0.4	මානව සම්පත් වැඩිදියුණු කිරීම
9	ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම (REIMP)	2.0	ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
	එකතුව	**8.8**	

1. භාණ්ඩාගාර ප්‍රතිපදන යටතේ සිදු කරන ව්‍යාපෘති

1.1 භූ ගත ජලය සඳහා සංවේදී ප්‍රදේශ තුළ දීර්ඝ කාලීන භූගත ජල නියාමන ව්‍යාපෘතිය (LTGM)

දිගු කාලීන භූගත ජල නිරීක්ෂණ ව්‍යාපෘතිය යනු ජල සම්පත් මණ්ඩලය විසින් මූලික වශයෙන් භූගත ජල අධ්‍යනය සිදු කළ සහ මූලික සමීක්ෂණ කටයුතු අවසන් කළ ප්‍රදේශ කිහිපයක අඛණ්ඩව භූගත ජල මට්ටම සහ රසායනික තත්ත්ව අධීක්ෂණය සිදු කරන ඒකාබද්ධ වැඩ සටහනකි.

මෙම භූගත ජල අධ්‍යනය ආරම්භයේදීම ඒ ඒ ප්‍රදේශවල දිගු කාලීන භූගත ජල අධීක්ෂණ ජාල පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා එක් එක් ව්‍යාපෘති ප්‍රදේශයේ හඳුනාගෙන තිබූ විවිධ භූගත ජල ගැටලු සැලකිල්ලට ගෙන පරීක්ෂණ නළ ළිං ඉදිකරන ලදි. එක් එක් ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද නළ ළිං පිළිබඳව විස්තර පහත දැක්වේ.

වගුව 01: භාණ්ඩාගාර ප්‍රතිපදන යටතේ සිදු කරන ව්‍යාපෘති - 2022

අංකය	ව්‍යාපෘතිය	ප්‍රදේශය	ඉදිකරන ලද නළ ළිං සංඛ්‍යාව
1.	කොළඹ සිට මිගමුව දක්වා දිවෙන වැලි සහිත ජලධරය සම්බන්ධව සිදු කරන ලද සවිස්තරාත්මක භූ ජල විද්‍යා අධ්‍යයනය	කොළඹ සිට මිගමුව දක්වා දිවෙන වෙරළබඩ වැලි තීරය	78
2.	පුත්තලම දිස්ත්‍රික්කයේ භූගත ජල ආරෝපණය සඳහා සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම	පුත්තලම, කල්පිටිය ප්‍රදේශය	14
3.	කැලණි ගංගා ද්‍රෝණියේ සිදු කරන ලද සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය	කැළණි ගංගා ද්‍රෝණිය (ඉහල)	10
4.	අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින භූගත ජලයේ පවතින අනතුරුදායක බණිජ හඳුනාගැනීම	අනුරාධපුර දිස්ත්‍රික්කය	32
5.	වවුනියාව සහ කිලිනොච්චිය ප්‍රදේශ වල භූ ජල විද්‍යා අධ්‍යයනය	වවුනියාව සහ කිලිනොච්චිය	35
6.	මන්නාරම දිස්ත්‍රික්කය ආශ්‍රිතව පවතින හුණුගල් සහිත ජලධරය සම්බන්ධව සිදු කරන ලද භූ ජල විද්‍යා අධ්‍යයනය	මන්නාරම	55
7	කිරිඳි ඔය ගංගා ද්‍රෝණියේ සිදු කරන ලද සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය	කිරිඳි ඔය ගංගා ද්‍රෝණියේ	25
8	කැළණි ගංගා ද්‍රෝණිය	කැළණි ගංගා ද්‍රෝණිය	25
9	යාපනය ප්‍රදේශයේ පවතින ළිං පිළිබඳව සිදු කරන ලද සමීක්ෂණය	යාපනය අර්ධද්වීපය	43
10	DSWRPP යටතේ සිදු කරන ලද යාපනය භූගත ජල සම්පත් අධ්‍යයනය	යාපනය අර්ධද්වීපය	35
11	පොලොන්නරුව දිස්ත්‍රික්කය ආශ්‍රිතව සිදු කරන ලද භූ ජල විද්‍යාව අධ්‍යයනය	පොලොන්නරුව දිස්ත්‍රික්කය	75
12	මාතලේ දිස්ත්‍රික්කය ආශ්‍රිතව සිදු කරන ලද භූ ජල විද්‍යා අධ්‍යයනය	මාතලේ දිස්ත්‍රික්කය	35

ඉහත අධීක්ෂණ ළිං වලට අමතරව, අවශ්‍යතාවය අනුව දැනට පවතින ළිං ද අදාළ ප්‍රදේශවල දිගු කාලීන අධීක්ෂණ ජාල පද්ධති වලට ඇතුළත් කර ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා අරමුණ වන්නේ ජල සාම්පල එක්රැස් කිරීම, ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීම, ජල මට්ටම අධීක්ෂණය කිරීම, අධීක්ෂණ තොරතුරු යාවත්කාලීන කිරීම සහ භූගත ජල සම්පත් කළමනාකරණය සඳහා අදාළ ප්‍රදේශවල ගුණාත්මකභාවය සහ ප්‍රමාණයේ දිගු කාලීන විචලනය හඳුනා ගැනීමයි.

මෙම කටයුතු යටතේ 2022 වර්ෂයේ ප්‍රගතිය පහතින් දක්වා ඇත.

වගුව 02: LTGM ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2022

	ක්‍රියාකාරකම	2022 වර්ෂයේ ඉලක්කය	ප්‍රගතිය
1	ජල නියදිකරණය	2095	98%
2	ජල සාම්පල රසායනික විශ්ලේෂණය	2095	48%

මෙම ව්‍යාපෘතිය යටතේ එක් එක් ප්‍රදේශය තුල 2022 වර්ෂය තුලදී පහත අධ්‍යයනයන් සිදු කරන ලදී..


1.1.1 කොළඹ සිට මිගමුව දක්වා වූ වෙරළබඩ වැලි සහිත ජල ධරය

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ පරිසරයට හානියක් නොවන පරිදි උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වෙරළබඩ ආශ්‍රිත නොගැඹුරු වැලි සහිත ජලධරය හඳුනා ගැනීම, සංවර්ධනය කිරීම, කළමනාකරණය කිරීම, සහ සංරක්ෂණය කිරීමයි.


වර්ෂය තුල දෙවරක් ජල සාම්පල එක්රැස් කරන ලද අතර (මෝසම් වර්ෂාවට පෙර සහ පසු) ඒවායේ භෞතික හා රසායනික තත්වයන් පරීක්ෂා කිරීම සඳහා රසායනික විශ්ලේෂණයට භාජනය කරන ලදී. මීට අමතරව ප්‍රදේශයේ භූගත ජල මට්ටම් විචලනය පිලිබඳ අධ්‍යයනය කිරීම සඳහා භූ ගත ජල මට්ටමද නිරීක්ෂණය කරන ලදී.

එම විශ්ලේෂණ ප්‍රතිඵල අනුව ප්‍රදේශය තුල පවතින භූගත ජලයේ ගුණාත්මක භාවය ප්‍රදේශය තුල පැතිරී ඇති ආකාරය දැක්වීම සඳහා සිතියම් සකස් කරන ලදී.

උදා: ජලයේ විද්‍යුත් සන්නායකතාවයේ පැතිරීම



රූපය 01: මෝසම් වර්ෂාවට පෙර ජලයේ විද්‍යුත් සන්නායක තාවයේ පැතිරීම - 2022



රූපය 02: මෝසම් වර්ෂාවෙන් පසු ජලයේ විද්‍යුත් සන්නායක තාවයේ පැතිරීම - 2022

මෙම ප්‍රදේශයේ දීර්ඝ කාලීන අධීක්ෂණ ප්‍රතිඵලවලට අනුව වසර 10ක පමණ කාලයක් තුළ භූගත ජලයේ ගුණාත්මකභාවය සහ ජල මට්ටම සැලකිය යුතු ලෙස වෙනස් වී නොමැත. එක් ස්ථානයක පමණක් ඉහළ විද්‍යුත් සන්නායකතා අගයක් පෙන්නුම් කරන අතර එය මුහුදු ජලය කාන්දු වීම නිසා සිදුවී ඇති බව හඳුනාගෙන ඇත.


කෙසේ වෙතත්, මෙම ප්‍රදේශයේ ඉහළ ජනගහනය, අධික කර්මාන්තශාලා ඝනත්වය, අධික ලෙස භූගත ජලය නිස්සාරණය මෙන්ම ජලධරයේ ඉහළ සංවේදීතාව හේතුවෙන් මෙම අධීක්ෂණ වැඩසටහන දිගටම සිදු කරගෙන යාමට නිර්දේශ කෙරේ.

1.1.2 පුත්තලම දිස්ත්‍රික්කය

2011 වසරේ භාණ්ඩාගාර ප්‍රදානය යටතේ මෙම අධ්‍යයනය ආරම්භ කර 2015 දී අවසන් කරන ලදී. ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු ඒ සඳහා තෝරා ගන්නා ලද දීර්ඝ කාලීන භූගත ජල අධීක්ෂණ ජාලය (LTGM) ව්‍යාපෘතිය යටතේ දීර්ඝ කාලීන අධීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදී.

ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ප්‍රදේශයේ පවතින භූගත ජලධරවල පරාමිතීන් හඳුනා ගැනීම සහ ජලධරය සංවර්ධනය කිරීම, භූගත ජලය නැවත ආරෝපණය කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම සහ භූගත ජල විභවය ඉහළ නැංවීම මෙන්ම අධික ලෙස භූ ගත ජලය උකහා ගැනීම, මුහුදු ජලය රට තුලට කාන්දු වීම සහ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් භූගත ජලයට සිදුවන බලපෑම (කෘෂිරසායන හා පළිබෝධනාශක අධික ලෙස භාවිතා කිරීම වැනි) පිළිබඳව අවබෝධ කර ගැනීමයි. එමගින් ප්‍රදේශය සඳහා සුදුසු සහ තිරසාර භූගත ජල සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සිදු කල හැක.

2022 වර්ෂය තුල දෙවරක් ජල සාම්පල එක්රැස් කරන ලද අතර ජල මට්ටම ද නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව දිගු කාලීනව ජල මට්ටමේ උච්චාවචනයන් නිරීක්ෂණය කරන ලද අතර පහත ප්‍රස්ථාරයෙන් ප්‍රදේශයේ ජල මට්ටමේ වෙනස්වීම් දක්වා ඇත.



රූපය 03: 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ප්‍රදේශයේ ජල මට්ටම විචලනය

ඉහත රූපයට අනුව ඇතැම් ළිංවල ජල මට්ටමේ මීටර් 3ක් 4ක් පමණ විචලනයක් පවතී. වර්ෂාපතන ප්‍රමාණය, අධික ලෙස භූගත ජලය උකහා ගැනීම වැනි විවිධ සාධක මේ සඳහා හේතු විය හැක. එබැවින් ප්‍රදේශයේ භූගත ජල හැසිරීම් පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා මෙම ළිංවල ජල මට්ටම සහ ගුණාත්මක භාවය ඉදිරි වර්ෂ තුලදීද අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සඳහා නිර්දේශ කරනු ලැබේ.

1.1.3. කැළණි ජල ද්‍රෝණිය - ඉහළ වෙනස්කම් කොටස

මෙම ව්‍යාපෘතිය 2015 වසරේ ආරම්භ කරන ලද අතර ඉහළ කැලණි ද්‍රෝණියේ නොගැමුරු සහ ගැඹුරු භූගත ජලයෙහි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වෙනස්කම් අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ විය. කැළණි ජල ද්‍රෝණියේ ඉහළ කොටසට කෙහෙල්ගමු ඔය, මස්කෙළිය ඔය, වී ඔය, ගුරුගොඩ ඔය සහ සීතාවක ගඟ නමින් විවිධ උප

ද්‍රෝණි පහක් ඇතුළත් වේ. මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශය තුළ පරීක්ෂණ ළිං 10ක්, වළ ළිං 12ක් සහ ස්වාභාවික උල්පත් සහ ඇළ මාර්ග 3කින් සමන්විත නිරීක්ෂණ ස්ථාන 25ක් තෝරාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කැලණි ගංගා ද්‍රෝණියේ ඉහළ ජල පෝෂක ප්‍රදේශය පිළිබඳව සැලකිලිමත් වන අතර ද්‍රෝණියේ ඉහළ ජල පෝෂක ප්‍රදේශවල භූගත ජලයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පිළිබඳව සැලකිලිමත් වේ.

මෙම අධ්‍යයන ප්‍රදේශය යනු අවිස්සාවේල්ලෙන් ආරම්භ වන කැලණි ගං ද්‍රෝණියේ උඩුගං ප්‍රදේශයයි. තල්දූව, ගැටහැත්ත, දෙහිඕවිට, රුවන්වැල්ල, බුලත්කොහුපිටිය, යටියන්තොට, කිතුල්ගල, ගිනිගත්හේන, දැරණියගල, නෝර්වුඩ් සහ මස්කෙළිය යන නගර කිහිපයක් ව්‍යාපෘති ප්‍රදේශය තුළ පිහිටා ඇත.

එක්රැස් කරන ලද ජල සාම්පල වල රසායනික විශ්ලේෂණ ප්‍රතිඵල වලට අනුව අධීක්ෂණ ළිං සියල්ලම පාහේ පානීය ජල ප්‍රමිතීන් තුළ පවතින බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් ද්‍රෝණියේ ඉහළ කොටසේ භූගත ජලය තිරසාර ලෙස කළමනාකරණය කිරීම සඳහා දිගුකාලීන පදනමින් ජලයේ ගුණාත්මකභාවය සහ ජල මට්ටම අඛණ්ඩව පරීක්ෂා කරගෙන යාම නිර්දේශ කරනු ලැබේ.

1.1.4. අනුරාධපුර දිස්ත්‍රික්කය


මෙම ප්‍රදේශය තුල පවතින නොගැඹුරු හා ගැඹුරු ජලධරවල ජලයේ ගුණාත්මක භාවයේ ව්‍යාපෘතිය හඳුනා ගැනීමත්, ඒ පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කිරීමත්, ඒ ආශ්‍රයෙන් නිසි නිර්දේශ ඉදිරිපත් කිරීමත් අරමුණු කොට 2011 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ බහුලව පැතිර යන නිදන්ගත වකුගඩු රෝග (CKDu) සහ අනෙකුත් ජලයෙන් බෝවන රෝග පාලනය කිරීමේ අදහසින් ග්‍රාමීය ජනතාව ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සහ ඒ සම්බන්ධව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා අනුරාධපුර, කොරකහවැව ජල සම්පත් පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් ජල සායන සංවිධානය කරන ලදී.


මෙම ව්‍යාපෘතියේ මූලික අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් පසු එම අධ්‍යයනයන් සඳහා භාවිතා කරන ලද භූගත ජල නිරීක්ෂණ ජාලය 2015 වසරේ සිට දීර්ඝ කාලීන භූගත ජල නිරීක්ෂණ ව්‍යාපෘතියට සම්බන්ධ කරන ලදී.



රූපය 04: ජල මට්ටම් නිරීක්ෂණය සහ ජලයේ ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම.



රූපය 05: ප්‍රදේශය තුල ක්ලෝරයිඩ් අයන පැතිරීම - 2022, පෙබරවාරි



රූපය 06: ප්‍රදේශය තුල විද්‍යුත් සන්නායකතාවයේ පැතිරීම - 2022, පෙබරවාරි

ජල සාම්පල විශ්ලේෂණ ප්‍රතිඵලවලට අනුව ප්‍රදේශයේ දකුණුදිග සහ බටහිරදිග ප්‍රදේශ වල මෝසම් වර්ෂා කාලයට පසු (පෙබරවාරි - 2022) ඉහළ ක්ලෝරයිඩ් සාන්ද්‍රණයක් පෙන්නුම් කරයි.

ප්‍රදේශයේ විද්‍යුත් සන්නායකතාවය ස්ථාන 3 කදී උපරිම හිතකර සීමාව ඉක්මවා ඇත.

මෙම ජලයේ ගුණාත්මක වෙනස අදාල ස්ථානීය රසායනික ගුණාංග හේතුවෙන් හෝ වෙනත් මිනිස් ක්‍රියාකරකම් හේතුවෙන් සිදුවිය හැක. එම නිසා මෙම වෙනස්කම් දීර්ඝ කාලීනව හෝ කෙටි කාලීනව සිදුවන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා දීර්ඝ කාලීන පදනමින් ජලයේ ගුණාත්මක බව අධීක්ෂණය කිරීම නිර්දේශ කෙරේ.

1.1.5 කිලිනොච්චි දිස්ත්‍රික්කය

මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2013-2014 කාල සීමාව තුළ ඒ සඳහා සැලසුම් කරන ලද මූලික අධ්‍යයනයන් නිම කරන ලදී. මෙහිදී, භූගත ජලය පවතින ප්‍රදේශ හඳුනා ගැනීම, ප්‍රදේශයේ පවතින ජලධර වල පැතිරීම සහ ඒවායේ භූ ජල විද්‍යාත්මක පරාමිතීන් හඳුනා ගැනීම සහ කුඩා පරිමාණ වාරි කෘෂිකර්මය සහ පානීය කටයුතු සඳහා භූගත ජල මූලාශ්‍රව හඳුනා ගැනීම යන කරුණු අරමුණු කර මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ඉන්පසු එම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද භූගත ජල අධීක්ෂණ ජාලය දීර්ඝ කාලින අධීක්ෂණ කටයුතු සඳහා (LTGM) ව්‍යාපෘතිය සමග ඒකාබද්ධ කරන ලදී.

ඒ අනුව 2022 වර්ෂය තුලදී ජල සාම්පල එක්රැස් කිරීමත්, ඒවා රසායනික විශ්ලේෂණයට භාජනය කිරීමත්, ජල මට්ටම් නිරීක්ෂණය කිරීමත් සිදු කරන ලදී.

නිරීක්ෂණ

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ වල ජලයේ මිශ්‍ර ද්‍රවිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය (TDS), විද්‍යුත් සන්නායකතාවය, ක්ලෝරයිඩ් ප්‍රමාණය, ජලයේ කඨිනත්වය, කැල්සියම් ප්‍රමාණය, මැග්නීසියම් ප්‍රමාණය සහ යකඩ ප්‍රමාණය, පානීය ජලය තුල පැවතිය යුතු ප්‍රමාණයන්ට වඩා වැඩි ප්‍රමාණ වලින් පවතී. 2022 වසර තුල සිදු කරන ලද විශ්ලේෂණයන්ට අනුව පානීය ජලය සඳහා හිතකර සීමාවන් තුල භූගත ජලය පවතින්නේ අයියකච්චි-පලෙයි ප්‍රදේශය තුළ පමණි.

නිර්දේශ

ජල සාම්පල විශ්ලේෂණ ප්‍රතිඵල අනුව, මෙම ප්‍රදේශය තුල ජලයෙහි ගුණාත්මක භාවය සම්බන්ධ ගැටළු කිහිපයක් දක්නට ලැබේ. සාමාන්‍යයෙන්, දිස්ත්‍රික්කයේ ගැඹුරු භූගත ජලධරය පානීය ජලය සඳහා වන 614: 2013 දරන ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල නොවේ.

ප්‍රදේශයේ සාමාන්‍ය ජල මට්ටම පොළව මට්ටමේ සිට මීටර් 2 සිට 16.5 දක්වා වෙනස් වන අතර එය සම්පූර්ණයෙන්ම පාලනය වන්නේ ප්‍රදේශයේ වර්ෂාපතන රටාව අනුව වේ.

ගුණාත්මක භාවයෙන් ඉහළ නොගැඹුරු භූගත ජලය පවතින අයියකච්චි-පලෙයි ප්‍රදේශයේ ඝනකම් වැලි ස්තරයක් සහිත ජල ධරයක් පවතී. එබැවින් මෙම ජලධරය මානව ක්‍රියාකාරකම් වලින් හානි වීම වැළැක්වීම අවශ්‍ය වේ.

විශේෂයෙන් භූගත ජලය අධික ලෙස උකහා ගැනීම සහ අහිතකර කෘෂිකාර්මික කටයුතු සහ නාගරීකරණයත් නොගැඹුරු ජලධරය ඉතා ඉක්මනින් දූෂණය වීමට හේතු වේ. එබැවින් මෙම ප්‍රදේශය තුළ නැවත පදිංචි කිරීම හෝ නව ව්‍යාපෘතියක් යෝජනා කරන විට ඉහත කරුණ ඉතා ප්‍රවේශමෙන් සලකා බැලිය යුතුය.


මීට අමතරව කෘෂි රසායන මගින් භූගත ජලය දූෂණය වීම වැළැක්වීමට අවධානය යොමු කල යුතු අතර එසේ නොකළ හොත්, නුසුදුසු කෘෂි කාර්මික ක්‍රම භාවිතය හේතුවෙන් අනාගතයේදී භූගත ජල සම්පතට සැලකිය යුතු තර්ජනයක් ඇති කරනු ඇත.

දිස්ත්‍රික්කයේ භූගත ජල මට්ටම්වල විචලනය සහ භූ ගත ජලයේ රසායනික සාධක සැලකිල්ලට ගනිමින්, දැනට පවතින අධීක්ෂණ වැඩසටහන අඛණ්ඩව සිදු කිරීම නිර්දේශ කරනු ලැබේ.


එමෙන්ම දිස්ත්‍රික්කයේ ඊසානදිග ප්‍රදේශයේ නොගැඹුරු ජලධර හැසිරීම් හඳුනා ගැනීම සඳහා අධීක්ෂණ ජාලයට නොගැඹුරු ළිං කිහිපයක් හඳුන්වා දීමට යෝජනා කෙරේ.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ වල වසරේ පළමු කාර්තුවේදී Ca, Mg, Cl හා කඨිනත්වය නිර්දේශිත පරාසයේ නොමැත. එබැවින් පානීය කටයුතු සඳහා භූගත ජලය භාවිතාකිරීම සඳහා ජලය පිරිපහදු කළ යුතුය.

දිස්ත්‍රික්කය තුළ නළ ළිං ඉදිකිරීමේදී, ප්‍රදේශයේ කරදිය-මිරිදිය අතුරු මුහුණත පවතින ගැඹුර පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර එම ගැඹුර ඉක්මවා නළ ළිං ඉදි කිරීමෙන් මුහුදු ජලය රට තුලට ඇතුළු වීම සිදු විය හැක. මෙය වළක්වා ගැනීම සඳහා ළිංවල ගැඹුර පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුය.



රූපය 07: කිලිනොච්චි දිස්ත්‍රික්කය තුල ක්ලොරයිඩ වල පැතිරීම



රූපය 08: කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ විද්‍යුත් සන්නායක තාවයේ පැතිරීම

1.1.6 වවුනියා දිස්ත්‍රික්කය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ භූගත ජල විභවයක් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම සහ අනාගත පානීය ජලය සහ කුඩා පරිමාණ වාරි කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා භූගත ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ හැකියාව

පරීක්ෂා කිරීම වේ.

මීට අමතරව ජලධරයෙහි පැතිරීම සහ භූ ජල විද්‍යාත්මක පරාමිතීන් හඳුනා ගැනීමද විශේෂ අරමුණක් විය.

මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2013-2014 කාල සීමාව තුළ ඒ සඳහා සැලසුම් කරන ලද මූලික අධ්‍යයනයන් නිම කරන ලදී. ඉන්පසු එම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද භූගත ජල අධීක්ෂණ ජාලය දීර්ඝ කාලීන අධීක්ෂණ කටයුතු සඳහා (LTGM) ව්‍යාපෘතිය සමග ඒකාබද්ධ කරන ලදී.

ඒ අනුව 2022 වර්ෂය තුලදී ජල සාම්පල එක්රැස් කිරීමත්, ඒවා රසායනික විශ්ලේෂණයට භාජනය කිරීමත්, ජල මට්ටම් නිරීක්ෂණය කිරීමත් සිදු කරන ලදී.

නිරීක්ෂණ

වර්ෂයේ පළමු කාර්තුව තුලදී මැග්නීසියම් සාන්ද්‍රණය හැර පරීක්ෂා කරන ලද අනෙකුත් පරාමිතීන් පානීය ජලය සඳහා නිර්දේශිත මට්ටම් වල පවතී. නමුත් වර්ෂයේ තුන් වන කාර්තුව වන විට භූගත ජලයේ ගුණාත්මක භාවයෙහි අඩු වීමක් දක්නට ලැබේ. එනම් තුන් වන කාර්තුව වන විට ජලයේ ද්‍රාවිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය, විද්‍යුත් සන්නායකතාවය, ක්ලෝරයිඩ් ප්‍රමාණය, කඨිනත්වය, කැල්සියම්, මැග්නීසියම්, යකඩ ආදී පරාමිතීන් පානීය ජලය සඳහා නිර්දේශිත මට්ටම් වලට වඩා වැඩි ප්‍රමාණ වලින් පවතී.


නිර්දේශ

ප්‍රදේශයේ සාමාන්‍ය ජල මට්ටම පොළව මට්ටමේ සිට මීටර් 0.4 සිට 15 දක්වා වෙනස් වන අතර එය සම්පූර්ණයෙන්ම පාලනය වන්නේ ප්‍රදේශයේ වර්ෂාපතන රටාව අනුව වේ. දිස්ත්‍රික්කයේ මධ්‍යම ප්‍රදේශයේ පවතින නොගැඹුරු භූ ගත ජලය ගුණාත්මක භාවයෙන් ඉහළවන අතර භූගත ජලය අධික ලෙස උකහා ගැනීම, අහිතකර කෘෂිකාර්මික කටයුතු සහ නාගරීකරණයත් නොගැඹුරු ජලධරය ඉතා ඉක්මනින් දූෂණය වීමට හේතු වේ. එබැවින් මෙම ප්‍රදේශය තුළ නැවත පදිංචි කිරීම හෝ නව ව්‍යාපෘතියක් යෝජනා කරන විට ඉහත කරුණු ඉතා ප්‍රවේශමෙන් සලකා බැලිය යුතුය.


මීට අමතරව කෘෂි රසායන මගින් භූගත ජලය දූෂණය වීම වැළැක්වීමට අවධානය යොමු කල යුතු අතර එසේ නොකළ හොත්, නුසුදුසු කෘෂි කාර්මික ක්‍රම භාවිතය හේතුවෙන් අනාගතයේදී භූගත ජල සම්පතට සැලකිය යුතු තර්ජනයක් ඇති කරනු ඇත.

දිස්ත්‍රික්කයේ භූගත ජල මට්ටම්වල විචලනය සහ ජලයේ රසායනික සාධක සැලකිල්ලට ගනිමින්, දැනට පවතින අධීක්ෂණ වැඩසටහන අබණ්ඩව සිදු කිරීම නිර්දේශ කරනු ලැබේ.

එමෙන්ම දිස්ත්‍රික්කයේ මධ්‍යම ප්‍රදේශයේ නොගැඹුරු ජලධර හැසිරීම් හඳුනා ගැනීම සඳහා අධීක්ෂණ ජාලයට නොගැඹුරු ළිං කිහිපයක් හඳුන්වා දීමට යෝජනා කෙරේ.




රූපය 09: වවුනියා දිස්ත්‍රික්කය තුල භූගත ජලයේ විද්‍යුත් සන්නායක තාවයේ පැතිරීම




රූපය 10: වවුනියා දිස්ත්‍රික්කය තුල භූගත ජලයේ මැග්නීසියම් සාන්ද්‍රණයේ පැතිරීම

1.1.7 මන්නාරම දිස්ත්‍රික්කය

මන්නාරම දිස්ත්‍රික්කයේ නොගැඹුරු හා ගැඹුරු භූගත ජලයේ (නොගැඹුරු හා ගැඹුරු ජලධර) ගුණාත්මක භාවයෙහි ව්‍යාප්තිය හඳුනාගැනීම සඳහා 2011 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී.



රූපය 11: විද්‍යුත් සන්නායකතාවයේ පැතිරීම



රූපය 12: නයිට්‍රේට සාන්ද්‍රණයේ පැතිරීම

චික්රැස් කරන ලද මුළු සාම්පල සංඛ්‍යාවෙන් 20% ක් ඉහළ විද්‍යුත් සන්නායකතා අගයන් පෙන්වයි. මෙම ප්‍රදේශය මුහුදට ආසන්න ප්‍රදේශයක් බැවින් මුහුදු ජලය රට තුලට කාන්දු වීම වීම මේ සඳහා හේතුව විය හැකිය.

තවද, මෙම ප්‍රදේශයේ ජල සාම්පල චික් රැස් කරන ලද ස්ථාන 3 ක භූ ගත ජලයේ නයිට්‍රේට සාන්ද්‍රණය ඉහළ අගයක් ගනී. මෙය ප්‍රදේශය පුර පැතිරී නොමැති නිසා එම ස්ථාන වල පවතින භෞතික හා රසායනික තත්ත්ව හේතුවෙන් සිදු වන්නට ඇති බව අනුමාන කල හැක. කෙසේ නමුත් මෙම තත්වයන් දීර්ඝ කාලීනව පවතින්නේද යන්න සොයා බැලීමටත්, මෙම ජලධරයේ තිරසාර සංවර්ධනය සහ භාවිතය සහතික කිරීම සඳහා මෙම ස්ථාන දිගුකාලීනව අධීක්ෂණය කිරීම නිර්දේශ කෙරේ.

1.1.8 කිරිඳි ඔය


කිරිඳිඔය ද්‍රෝණි ප්‍රදේශයේ (තිස්සමහාරාම, තණමල්විල, ලුණුගම්වෙහෙර සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ) භූගත ජලය සංවර්ධනය පිළිබඳ සවිස්තරාත්මක භූ ජල විද්‍යාමත්මක අධ්‍යයනය 2015 වසරේ ආරම්භ කරන ලදී. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වූයේ භූගත ජලයේ ගුණාත්මක භාවය සහ ජල මට්ටම් උච්චාවචනයන් පිළිබඳ දත්ත චික් රැස් කිරීම සඳහා සකස් කරන ලද පරීක්ෂණ නළ ළිං සහිත භූගත ජල අධීක්ෂණ ජාලයක් ස්ථාපිත කිරීමයි. කිරිඳිඔය ගංගා ද්‍රෝණියේ ප්‍රජාව ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ ගෘහස්ථ හා පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා අත් පොම්ප නළ ළිං සහ කුඩා පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රම භාවිතා කරයි. මහා පරිමාණ කෘෂිකාර්මික කටයුතු බොහොමයක් තම ජල අවශ්‍යතා සඳහා භූගත ජලය භාවිතා කරයි. මෙම ළිං නිරීක්ෂණය කිරීම සඳහා නිසි සැලැස්මක් නොමැති වීම, කෘෂිකාර්මික කටයුතු සඳහා අධික ලෙස භූ ගත ජලය උකහා ගැනීම ආදී කරුණු හේතුවෙන් ඇති වන භූ ගත ජල හිඟය නිසා එම ප්‍රදේශවල ග්‍රාමීය ප්‍රජාවන්ට භූ ගත ජලයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. එබැවින් ඉහත ප්‍රදේශවල භූගත ජලය නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා විධිමත් වැඩසටහනක් හඳුන්වාදීම අවශ්‍ය වේ.

1.1.9 යාපනය අර්ධද්වීපය


මෙම ව්‍යාපෘතිය වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය යටතේ 2011 වසරේ ආරම්භ කරන ලද අතර 2015 වසරේ ඉලක්කගත ක්‍රියාකාරකම් අවසන් කරන ලදී. ඉන් අනතුරුව දීර්ඝ කාලීන පදනමින් ජල මට්ටම් සහ ජලයේ ගුණාත්මකභාවය මැනීම සඳහා භූගත ජල නිරීක්ෂණ ජාලය (LTGM) ව්‍යාපෘතියට ඒකාබද්ධ කරන ලදී.

- යාපනය දිස්ත්‍රික්කයේ ජල මට්ටමේ උච්චාවචනය ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය මගින් පාලනය වන අතර, වියළි කාලවලදී ජල මට්ටම ක්‍රමයෙන් අඩු වන අතර තෙත් කාලවලදී භූගත ජල මට්ටම ක්‍රමයෙන් වැඩි වේ. පසේ ඉහළම ස්ථරයේ ජලය රඳවා ගැනීමේ හැකියාව ඉහළ මට්ටමක පවතී. වර්ෂා කාලවලදී එය වැසි ජලයෙන් සංතෘප්ත වන අතර වර්ෂාව නතර වූ වහාම ක්‍රමයෙන් ඉවතට ගලා යාම හෝ වාෂ්ප වීම සිදු වේ.
- එම නිසා වර්ෂාපතනයෙන් පසු වාෂ්පීකරණය අවම කරමින් වැසි ජලය භූගත ජලය ලෙස රඳවා ගැනීමට නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.
- යාපනය දිස්ත්‍රික්කයේ වෙරළබඩ කලාප බොහොමයක භූගත ජලයේ විද්‍යුත් සන්නායකතාවය, සල්ෆේට, මැග්නිසියම් සහ කැල්සියම් සාන්ද්‍රණය පානීය ජලය සඳහා නිර්දේශිත සීමාවන් ඉක්මවා ගොස් ඇති අතර මෙය වර්ෂය පුරාම දක්නට ලැබේ.
- එම නිසා භූගත ජලය සීමාව ඉක්මවා උකහා ගැනීම පාලනය කිරීම සහ භූගත ජලය දූෂණය වීම වැළැක්වීම අවශ්‍ය වේ.
- දිස්ත්‍රික්කයේ නයිට්‍රේට් ව්‍යාපෘතිය පානීය ජලය සඳහා ශ්‍රී ලංකාව තුල නිර්දේශිත මට්ටම ඉක්මවා නොපෙන්වයි. නමුත් කාලයත් සමඟ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීම සඳහා නයිට්‍රේට් ප්‍රමාණයන් අඛණ්ඩව අධීක්ෂණය කළ යුතු අතර අතිරික්ත පොහොර භාවිතය පාලනය කළ යුතුය.
- වර්ෂය තුළදී සිදුවන කාළගුණික විපර්යාස සමඟ අර්ධද්වීපයේ භූගත ජලයේ ගුණාත්මක භාවය තරමක් වෙනස් වන අතර එය විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් තව දුරටත් වෙනස් වේ. එබැවින් ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් සමඟ භූගත ජලයේ ගුණාත්මක භාවයේ සහ ප්‍රමාණාත්මක භාවයේ විචලනය ඇගයීමට හා ඇස්තමේන්තු කිරීමට භූගත ජල අධීක්ෂණ කටයුතු තව දුරටත් අඛණ්ඩව සිදු කළ යුතුය.
- අර්ධද්වීපයේ මධ්‍ය කොටස ගුණාත්මක භාවයෙන් ඉහළ භූගත ජලධරයකින් සමන්විත වන අතර වඩමාරච්චි නැගෙනහිර සහ පච්චිලෙයිපල්ලෙයි ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ වලද වඩාත් හොඳ තත්ත්වයේ ජලය පවතී.
- ප්‍රදේශයට ඇතිවන අධික වර්ෂාව හේතුවෙන් දූෂිත ද්‍රව්‍යයයන් වැසි ජලයේ දිය වී භූගත ජලයට කාන්දු වීම නිසා භූගත ජලයේ සුළු ගුණාත්මක වෙනස්කම් සිදු විය හැක.
- වැසි ජලය මගින් භූගත ජලය තනුක කරන අතර එමගින් අර්ධද්වීපයේ මධ්‍ය කොටස තුළ විද්‍යුත් සන්නායකතාවය, ක්ෂාරීතාවය, සහ ජලයේ ගුණාත්මක භාවයට බලපාන අනෙකුත් පරාමිතීන් නිර්දේශිත සීමාවන් තුල පවත්වා ගැනීමට උපකාරී වේ.

මෙම සියලු නිරීක්ෂණ සහ නිගමනවලට අනුව මෙම ප්‍රදේශය තුළ ජලයේ ගුණාත්මක භාවය සහ ජල මට්ටම දීර්ඝ කාලීනව නිරීක්ෂණය කිරීම නිර්දේශ කෙරේ.




රූපය 13: ප්‍රදේශය තුල නයිට්‍රේට සාන්ද්‍රණයේ පැතිරීම - මෝසම් වර්ෂාවට පෙර



රූපය 14: ප්‍රදේශය තුල නයිට්‍රේට සාන්ද්‍රණයේ පැතිරීම - මෝසම් වර්ෂාවට පසු

1.1.10 පොළොන්නරුව දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකාවේ වියළි කළාපය තුල භූගත ජලය භාවිතා කිරීම ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. එම ප්‍රදේශ වල බොහෝ ජනතාව ඔවුන්ගේ එදිනෙදා ගෘහස්ත කටයුතු සහ කෘෂිකාර්මික කටයුතු සඳහා බහුල වශයෙන් භූ ගත ජලය භාවිතා කරනු ලබයි. මෙම අධ්‍යයනය යටතේ, මූලික වශයෙන්,පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවතින භූ ගත ජලයේ ගුණාත්මක භාවය හඳුනා ගැනීම සඳහා ජල නියැදි එක් රැස් කර විශ්ලේෂණය කරන ලදී. එම ප්‍රතිඵල අනුව ජල සම්පත් මණ්ඩලය විසින් විවිධ අවස්ථා වලදී ඉදි කරන ලද නළ ළිං 21ක් ද, ගෘහස්ත වළලිං 54ක්ද ජලයේ ගුණාත්මක භාවය හා ජල මට්ටම් නිරීක්ෂණය කිරීම සඳහා තෝරා ගන්නා ලදී. 2022 වර්ෂයේ පළමුවන හා තුන් වන කාර්තු වලදී මෙම ජල සාම්පල එක් රැස් කරන ලදී.



රූපය 15: ප්‍රදේශයේ භූ ගත ජලයෙහි කඨිනත්වය පැතිරී ඇති ආකාරය - 2022 (පළමු කාර්තුව).

එක්රැස් කරන ලද ජල සාම්පලවල රසායනික විශ්ලේෂණයන් සිදු කරන ලදී.

2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පසුගිය වසර හතරේ පවතින ජල මට්ටම් නිරීක්ෂණ දත්තවලට අනුව, ප්‍රදේශයේ භූගත ජල මට්ටම ප්‍රදේශයේ වර්ෂාපතන රටාවට අනුව උච්චාවචනය වේ.

ප්‍රදේශය තුල පවතින භූගත ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ සැලකූ විට සියලුම ජල සාම්පල පාහේ පානීය ජල ප්‍රමිති සීමාවන් තුල පිහිටයි. (පානීය ජලය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති-SLS614:2013)

අධ්‍යයන ප්‍රදේශයේ අනෙකුත් ප්‍රදේශ හා සසඳන විට ලංකාපුර කලාපයේ සමහර පරාමිතිවල (විද්‍යුත් සන්නායකතාවය, TDS, කඨිනත්වය, ෆ්ලෝරයිඩ්, සෝඩියම්, ක්ලෝරයිඩ්, මැග්නීසියම් සහ ක්ෂාරියතාවය) ඉහළ අගයන් ගන්නා බව පෙනේ. සිදු කරන ලද අධ්‍යනයට අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ භූගත ජලයේ ප්‍රධාන ගැටලුවක් ලෙස ජලයේ කඨිනත්වය ඉහළ මට්ටම් වාර්තා වේ. 1993 ලෝක සෞඛ්‍ය සංවිධානයේ පානීය ජල

ප්‍රමිතියට අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රදේශවලින් බහුතරයක් අධික කඨිනත්වය යුතු ජලය ලෙස වාර්තා වී ඇත.

මේ දක්වා සිදු කරන ලද අධ්‍යයනයෙන් පෙනී යන්නේ මෙම ප්‍රදේශයේ භූගත ජලයෙහි ගුණාත්මක භාවයට මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ජල දූෂණය හේතු නොවන බව වේ. කඨිනත්වය වැනි පරාමිතිවල ඉහළ මට්ටම් සඳහා ප්‍රදේශය තුල පවතින භූ විද්‍යාත්මක තත්වයන් හේතු වේ.

1.1.11 මාතලේ දිස්ත්‍රික්කය


ජල සම්පත් මණ්ඩලය 2012 වසරේ මාතලේ දිස්ත්‍රික්කයේ දිගුකාලීන භූගත ජල නිරීක්ෂණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය යටතේ, මාතලේ දිස්ත්‍රික්කයේ පවතින භූගත ජල සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු කළමනාකරණ සැලැස්ම සහ මාර්ගෝපදේශන පිළිබඳව ගවේෂණය කිරීම සඳහා මෙමෙ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මාතලේ ප්‍රදේශයේ භූගත ජලය ප්‍රධාන වශයෙන් ගෘහාශ්‍රිත කෘෂිකාර්මික සහ කාර්මික අරමුණු සඳහා භාවිත කෙරේ. මේ අතර, වැඩිවන කෘෂි රසායන භාවිතයන්, ආර්ථික සංවර්ධනය සහ ජනගහනය වැඩිවීමත් නිසා ප්‍රදේශය තුළ භූ ගත ජලය සඳහා ඇති ඉල්ලුම ඉහළ ගොස් ඇත.


මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් පවතින කෘෂි වගා ළිං හේතුවෙන් භූගත ජලයට වන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා සඳහා මෙම ප්‍රදේශයේ කෘෂි ළිං 252ක් නිරීක්ෂණය කරන ලදී. නොගැඹුරු හා ගැඹුරු ජලධර අතර පවතින සම්බන්ධතාවයන් හඳුනා ගැනීම සඳහා කලින් අධ්‍යයනය කරන ලද කෘෂි ළිං ආසන්නයේ පිහිටි ගැඹුරු නල ළිං 82 ක් නිරීක්ෂණය කරන ලදී.

මෙම අධ්‍යනයනයේ ප්‍රතිඵල අනුව දීර්ඝකාලීන අධ්‍යයනය සඳහා විශාල වශයෙන් ජලය උකහා ගන්නා ස්ථාන, සහ බහුල වශයෙන් කෘෂි කාර්මික කටයුතු සිදු කරන ස්ථාන ආදී භූගත ජලයට බලපෑම් විල්ල විය හැකි ස්ථාන නියෝජනය වන පරිදි වළ ළිං හා නළ ළිං 35කින් සමන්විත භූගත ජල අධීක්ෂණ ජාලයක් ස්ථාපිත කරන ලදී. මෙහිදී භූගත ජල මට්ටම් විචලනය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලද අතර වර්ෂයක් තුල අවස්ථා 4කදි ජල මට්ටම් නිමානය කරන ලදී.


එක්රැස් කරන ලද ජල සාම්පල රසායනික විශ්ලේෂණය සිදු කිරීමෙන් අනතුරුව සකස් කරන ලද සිතියම පහත පරිදි වේ. (2021 හා 2022 වර්ෂ වල පළමු කාර්තුව තුල)



රූපය 17: ජලයේ ද්‍රාව්‍ය ඝන ප්‍රමාණය ප්‍රදේශය තුල විචලනය වන ආකාරය (2022 පළමු කාර්තුව)



රූපය 18: ජලයේ ආම්ලිකතාවය ප්‍රදේශය තුල විචලනය වන ආකාරය (2021 පළමු කාර්තුව)



රූපය 19: ජලයේ ආම්ලිකතාවය ප්‍රදේශය තුල විචලනය වන ආකාරය (2022 පළමු කාර්තුව)

ජල සාම්පල රසායනික විශ්ලේෂණයට අනුව වැඩි ප්‍රමාණයක් පානීය ජලය සඳහා පවතින ශ්‍රී ලංකා ප්‍රමිති තත්ත්ව සීමාවන් තුල පවතී. කෙසේ නමුත් කෘෂි රසායන ද්‍රව්‍ය බහුල වශයෙන් භාවිතා කිරීම සහ කෘෂි කර්මාන්තය සඳහා අධික ලෙස භූගත ජලය ලබා ගැනීම හේතුවෙන් භූගත ජලය දූෂණය සහ ජල මට්ටම ක්‍රමයෙන් පහළ බැසීම සිදු විය හැකි නිසා දීර්ඝකාලීනව ජලයේ ගුණාත්මක භාවය සහ ජල මට්ටම පරීක්ෂා කල යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

1.2 කාළගුණික වෙනස්වීම් මත ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ජලධරයන් වලට සෘජුව හා වක්‍රකාරව සිදුවන බලපෑම් පිලිබඳ අධ්‍යයනය

ගෝලීය කාලගුණික වෙනස්වීම් මත සිදුවන මුහුදු ජලය ගොඩබිම දෙසට ගමන් කිරීමේ නැඹුරුතාවය නිසා භූගත ජලයේ සිදුවන රසායනික වෙනස්වීම් අධ්‍යයනය කිරීම සඳහා බටහිර හා නැගෙනහිර වෙරළ තීරය තුළ අධ්‍යයන කටයුතු සිදුකරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා 2022 ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා පහත දක්වා ඇති ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

ජල මට්ටම් මිණුම් කිරීම, ජල නියදි ලබා ගැනීම හා ජල සාම්පල විශ්ලේෂණය

2014 සිට 2020 දක්වා සිදුකරන ලද අධ්‍යයනයන්ගේ ප්‍රතිපල වලට අනුව, ඉදිකරන ලද නොගැඹුරු නළ ළිං හා දැනට පවතින නළ ළිං භාවිතා කරමින්, පිරිසිදු භූගත ජලධරයන් තුළට මුහුදු ජලය ඇතුල්වීම හා වෙරල තීරයට සිදුවන අනෙකුත් පාරිසරික බලපෑම් අධ්‍යයනය කිරීම සඳහා තවදුරටත් නිමාන කටයුතු සිදු කරන ලදී.

මෙහිදී වර්ෂය තුළ, අඛණ්ඩ රසායනික හා භූගත ජල මට්ටම් නිමාන කටයුතු සඳහා වැඩසටහනක් සකස් කරන ලදී. නිමාන කටයුතු ආරම්භ කිරීමට පෙර අමතර ළිං ඉදිකිරීම සඳහා යෝජනා කරන ලද අතර නව ළිං 10 මඟින් වෙරළ තීරයේ ජල ධරයන්ගේ ගුණාංග අධ්‍යයනය හා නිමානකට යුතු සිදු කරනු ලබයි. ඒ අනුව 2022 වසරට නියමිත ජල නිමාන කටයුතු සහ ළිං ඉදි කිරීමේ කටයුතු අවසන් කර ඇත.



රූපය 20: ස්ථාපිත කරන ලද භූගත ජල නිමාන පද්ධතිය (කොළඹ සිට වැලිගම වෙරළ තීරය).



රූපය 21: ස්ථාපිත කරන ලද භූගත ජල නිමාන පද්ධතිය (ත්‍රිකුණාමල වෙරළ තීරය).

ජල සාම්පල විශ්ලේෂණ හා ජල මට්ටම් නිමාන ප්‍රතිඵල අනුව දේශගුණික විපර්යාසයන් නිසා මෙම ප්‍රදේශ තුල සිදුවන භූගත ජලයෙහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්වයන්ගේ විචලනයන් හඳුනා ගැනීම පිණිස දීර්ඝ කාලීන අධ්‍යයනය සිදු කල යුතු අව නිර්දේශ කරනු ලැබේ. විශේෂයෙන්, මුහුදු ජලය රට තුලට කාන්දු වීම වැලක් වීම පිණිස ලවණ ජලය රට තුලට ඇතුල් වීම වැළක්වීමේ බාධක ස්ථාපනය කිරීම සඳහා අදාල ආයතන හා පුද්ගලයින් දැනුවත් කිරීම මෙමගින් සිදු කල යුතුය.

වගුව 3 : SICC ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2022

	ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය
1	භූ ජල විද්‍යා සමීක්ෂණ සහ පරීක්ෂණ නළ ළිං ඉදි කිරීම	10	100%
2	ජල මට්ටම් නිමානය සහ ක්ෂේත්‍රය තුලදී ජල සාම්පල රසායනික විශ්ලේෂණය (160) , බැර ලෝහ සඳහා ජල සාම්පල එක්රැස් කිරීම (60)	220	84%
3	ජල සාම්පල රසායනික විශ්ලේෂණය (රසායනාගාරය) (160) හා බැර ලෝහ සඳහා ජල සාම්පල රසායනික විශ්ලේෂණය (60 Nos)	220	31%
4	දත්ත විශ්ලේෂණය සහ වාර්තා සකස් කිරීම		65%

1.3 මා ඔය ගංගා ද්‍රෝණිය තුල භූ ජල විද්‍යාත්මක තක්සේරුව හා භූගත ජල ආරෝපණය සඳහා සුදුසු ස්ථාන හඳුනාගැනීම (Ma-Oya)

මා ඔය ද්‍රෝණියේ ඉහළ කොටසට වර්ෂය පුරා ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබුනද මා ඔය ගංගා ද්‍රෝණියේ මධ්‍යයම කොටස, වියළි කාලයේදී දැඩි ජල හිඟයකට මුහුණ දෙනු ලැබේ. මේ නිසා, ද්‍රෝණියේ මධ්‍යයම කොටසෙහි සුදුසු ස්ථාන වල කෘතිම භූගත ජල ආරෝපණ පද්ධතීන් සකස් කිරීම ඉතා යෝග්‍ය වේ. මෙම කාර්යය සඳහා සවිස්තරාත්මක භූජල විද්‍යා අධ්‍යයනයක් සිදු කිරීම වැදගත්වේ. එම නිසා මා ඔය ද්‍රෝණිය තුළ පවතින ජලධර ආරෝපණය කිරීමේ අරමුණ ඇතිව මා ඔය ගංගා ද්‍රෝණිය තුළ සවිස්තරාත්මක භූජල විද්‍යා අධ්‍යයනයන් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනයේදී, උල්පත් අධ්‍යයනය හා භූ ගත ජලය කෘතිමව ආරෝපණය සිදු කිරීම සඳහා ස්ථාන හඳුනා ගැනීම ප්‍රධාන කාර්යයන් විය.

භූගත ජල උල්පත්, භූගත ජල ද්‍රෝණි නිර්මාණය කිරීමෙහිලා සුවිශේෂී කාර්ය භාර්යයක් ඉටුකරනු ලබයි. ශ්‍රී ලංකාව පුරා භූගත ජල ද්‍රෝණිවල ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිතව උල්පත් විශාල ප්‍රමාණයක් පිහිටා ඇත. මෙම

උල්පත් දැනට නාමගතකර හෝ කිසියම් ආයතනයක් මඟින් සංරක්ෂණය කර නොමැති නිසා බොහොමයක් සංවර්ධන ව්‍යාපෘති මෙම උල්පත් හෝ ප්‍රදේශයේ පවතින භූජල විද්‍යාත්මකතත්වයන් සැලකිල්ලට නොගෙන ක්‍රියාත්මක කරනු ලබයි. මේනිසා, විවිධ ප්‍රදේශ වල පවතින භූ ජල විද්‍යාත්මක තත්වය අධ්‍යයනය කිරීම සහ හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. සම්පූර්ණ ශ්‍රී ලංකාවම ආවරනය වන පරිදි ව්‍යුහාත්මක හා භූ පරිභෝග සිතියම් නිර්මාණයවී ඇති නිසා රටෙහි විවිධ ප්‍රදේශවල පවතින ව්‍යුහාත්මක හා භූ පරිභෝජනය පිළිබඳව පහසුවෙන් හඳුනාගත හැකිවේ. නමුත් රටෙහි ඇති ගංගා ද්‍රෝණි ආවරණය වන පරිදි භූ ජල විද්‍යාත්මක සිතියම් සකස් වී නොමැති නිසා විවිධ ප්‍රදේශයන් තුළ පවතින භූ ජල විද්‍යාත්මක තත්වයන් හඳුනා ගැනීම ඉතා අසීරුවේ. එමෙන්ම ලංකාවේ පවතින උල්පත්, දත්ත ගබඩාවකට ඇතුලත් වී නොමැති නිසා විවිධ ව්‍යාපෘති මඟින් ආවරණයවන ප්‍රදේශ භූ ජල විද්‍යාත්මකව සංවේදී ප්‍රදේශද යන වග හෝ භූගත ජල ආරෝපණය සඳහා යෝග්‍ය වන ස්ථානද යනවග හඳුනා ගැනීම ඉතා අසීරු වේ. එම නිසා සමස්ත රටම ආවරණය වන පරිදි භූජල විද්‍යාත්මක සිතියම් නිර්මාණය කිරීම, උල්පත් හා අනෙකුත් භූජල විද්‍යාත්මකව සංවේදී ස්ථාන සිතියම් ගත කිරීම, ආරක්ෂා කිරීම ඉතා වැදගත් වන නමුත් එය දිගුකාලයක් වැයවන කාර්යයක් වේ. එම නිසා නියමු ව්‍යාපෘතියක් ලෙස මා ඔය ජල ද්‍රෝණිය තෝරා ගන්නා ලද අතර එහි සවිස්තරාත්මක භූ ජල විද්‍යා අධ්‍යයනයක් සිදු කිරීම, කෘත්‍රිම භූ ගත ජල ආරෝපණය සඳහා යෝග්‍ය වන ස්ථාන හඳුනා ගැනීම සහ කෘත්‍රිම භූගත ජල ආරෝපණ ව්‍යුහ සකස් කිරීම ආදී කටයතු සිදු කරනු ලැබේ.


විශේෂිතඅරමුණු

- උල්පත්වල උල්පත් ජලය ගලා යන සීග්‍රතතාවය අධ්‍යයනය කිරීම, උල්පත්වල සමාජීය වටිනාකම හඳුනා ගැනීම, සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම හා උල්පත් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක හඳුනා ගැනීම
- ප්‍රදේශයේ පවතින භූගත ජලධරයන් හඳුනා ගනිමින් භූ ජල විද්‍යාත්මක සිතියම් සකස් කිරීම හා ජල සම්පත් මණ්ඩලය සතුව පවතින ජලධාරිතා පරීක්ෂන දත්ත භාවිතයෙන් ප්‍රදේශයේ පවතින එක් එක් ජලධරයන්ගෙන් උකහා ගත හැකි ජල ප්‍රමාණය තක්සේරු කිරීම.
- වියළි කාලයේදී ජලය අඩු ප්‍රදේශ හඳුනා ගැනීම හා කෘතීම ආරොපණය සඳහා සැළසුම් සකස් කිරීම


2022 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම්

- මා ඔය ද්‍රෝණිය තුළ පවතින භූ විද්‍යාත්මක හා භූ ජල විද්‍යාත්මක තත්වයන් හඳුනා ගැනීම සඳහා මූලික අධ්‍යනයේදී තෝරා ගන්නා ලද ප්‍රදේශ වල භූ ජල විද්‍යා සමීක්ෂණ සිදු කරන ලදී.
- තව දුරටත් සවිස්තරාත්මක භූ විද්‍යා සහ භූ ජල විද්‍යාත්මක දත්ත අධයයනය කිරීම සඳහා ද්විමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ සිදු කිරීම
- වික්රැස් කරන ලද දත්ත ආධාරයෙන් ප්‍රදේශය තුල පවතින භූ ගත ජලය කෘත්‍රිමව ආරෝපණය කිරීම සඳහා සුදුසු ස්ථාන තොරා ගන්නා ලද අතර එම ස්ථාන වලට සුදුසු භූ ගත ජල ආරෝපණ ව්‍යුහයන් සැලසුම් කිරීම
- සිදු කරන ලද භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ ප්‍රතිපල අනුව ප්‍රදේශය තුල වඩාත් ගැඹුරින් පවතින භූ ජල විද්‍යාත්මක තත්වයන් හඳුනා ගැනීම සඳහා ගැඹුරු නළ ළිං ඉදි කිරීම.






රූපය 22: බෙම්මුල්ල ශ්‍රී වර්ධන පිරිවෙනෙහි සකස් කිරිඅට සැලසු කරන ලද ගැඹුරු භූ ගත ජල ආරෝපණ නළ ළිදෙහි විදුම් කටයුතු ආරම්භ කිරීම සහ යෝජිත භූගත ජල ආරෝපණ ව්‍යුහයේ සැලැස්ම.



රූපය 23: ද්විමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ ප්‍රතිපල - අලව්ව, පල්ලෙමෝරුව ප්‍රදේශය



රූපය 24: ද්විමාන ප්‍රතිරෝධකතා සමීක්ෂණ ප්‍රතිපල



රූපය 25: අලව්ව පල්ලෙමෝරුව ප්‍රදේශයේ ගැඹුරු නළ ළිදෙහි විදුම් කටයුතු ආරම්භ කිරීම

වගුව 04: මා ඔය ව්‍යාපෘතියේ ප්‍රගතිය -2022

	ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය
1	මූලික ජල මට්ටම් නිමානය සහ ක්ෂේත්‍රය තුළදී ජලයේ ගුණාත්මක බව පරීක්ෂා කිරීම	100	100%
2	භූ ජල විද්‍යා සමීක්ෂණ	50	100%
3	ගැඹුරු නළ ළිං ඉදි කිරීම සහ භූගත ජල ආරෝපණ ව්‍යුහය සකස් කිරීම	නළ ළිං 03	50%

1.4 භූගත ජලය සම්බන්ධ ගැටළු පිළිබඳ සංයුක්ත පරීක්ෂණ- 1.0 Mn

ඉහත සඳහන් ප්‍රධාන භූගත ජලය සම්බන්ධ අධ්‍යයනයන්ට අමතරව, විවිධ පාර්ශවයන්ට අයත් ආයතන සම්බන්ධීකරනය කරමින් භූගත ජල සම්පත් සම්බන්ධ ගැටළු පිළිබඳ පරීක්ෂණ සිදුකරන ලදි. භූගත ජලය සම්බන්ධයෙන් දක්නට ලැබෙන ප්‍රමුඛ ගැටළු සමහරක් වනුයේ කළු ගල්, පස් ආදී කැණීම් කටයුතු ආශ්‍රිතව භූගත ජලයට සිදුවිය හැකි බලපෑම්, නීති විරෝධී නළ ලිං ඉදිකිරීම සහ නිසි නිර්දේශ ලබා ගැනීමකින් තොරව වාණිජමය වශයෙන් භූගත ජලය අවභාවිතා කිරීම, ජල අයිතිය සහ බෙදා හැරීම සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලය මගින් නිකුත් ලබාදනු ලබන මාර්ගෝපදේශයන්ට අනුව ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් ඇතිවන මහජන ගැටළු ආදියයි.

මේ වන විටදී, මෙම වර්ෂය තුල ජල සම්පත් මණ්ඩලය වෙත ගැටළු නිරාකරණය කිරීම සඳහා අවස්ථා 72 කට සහභාගී වී ඇත. කොළඹ, ගම්පහ, පුත්තලම, අනුරාධපුර, මොණරාගල, කෑගල්ල සහ කළුතර යන දිස්ත්‍රික්ක තුල, මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වැනි ආයතන වල නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් මෙම සමීක්ෂණ කටයුතු සිදුකරන ලදි.



රූපය 26: ඇහැළියගොඩ ප්‍රදේශයේ මැණික් පතල් ආශ්‍රිතව සිදු කරන ලද වීකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක්



රූපය 27: මඩබාවිට ප්‍රදේශයේ පස් කැණීමේ ව්‍යාපෘතියක් ආශ්‍රිතව සිදු කරන ලද වීකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක්

වගුව 05: INSP ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2022

	ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය
1	භූගත ජල කළමනාකරණය සම්බන්ධ රැස්වීම් සහ වීකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ	100	80%
2	භූගත ජල නියාමන කටයුතු සඳහා ප්‍රජාව සහ අදාල ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන්	15	12%

1.5 ශ්‍රී ලංකාව සඳහා භූගත ජල සිතියම් සකස් කිරීම.

මෑත දශක කිහිපය තුළ භූගත ජල සම්පත ආර්ථික හා සමාජීය වශයෙන් වැදගත් ජාතික සම්පතක් බවට පත්ව ඇත. එසේ වුවද, විවිධ අවස්ථා වල උත්සාහයන් කිහිපයක් ගන්නා ලද නමුත්, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල සම්පත් පිළිබඳ ක්‍රමානුකූල හා සම්පූර්ණ සිතියමක් තවමත් සකස් කර නොමැත. දැනට ජල සම්පත් මණ්ඩලය විසින් ජල සම්පත් මණ්ඩලය සතු දත්ත සහ තොරතුරු භාවිතා කරමින් ශ්‍රී ලංකාව සඳහා භූ ගත ජල සිතියම් සකස් කරමින් පවතී. මෙම සිතියම් විවිධ කටයුතු වලදී සහ, දීර්ඝ කාලින භූගත ජල සම්පත් කළමනාකරණ කටයුතු වලදී බොහෝ උපකාරී වනු ඇත. මෙම ව්‍යාපෘතිය ජල සම්පාදන අමාත්‍යාංශයේ භූගත ජල සම්පත් අධ්‍යයනය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් 2022 වර්ෂයේදී ආරම්භ කරන ලදී. භූගත ජලය සබන්ධව තීන්දු තීරණ ගැනීමේදී ඒ සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදකයින්, ජල කළමනාකරුවන් සහ අදාළ තාක්ෂණික නිළධාරීන් හට මෙම සිතියම් ඉතා වැදගත් වන අතර සාමාන්‍ය

ජනතාවටද භූගත ජලය සම්බන්ධව තොරතුරු ලබා ගැනීමට වැදගත් වනු ඇත.

මෙම සිතියම් භූගත ජලය සම්බන්ධ විශේෂ දැනුමක් නොපවතින පුද්ගලයින් හටද අවබෝධ වන පරිදි ප්‍රකාශයට පත් කිරීමට නියමිත වේ. තාක්ෂණික තොරතුරු විස්තර කිරීම සඳහා සරල භාෂාවක් යොදා ගනු ලැබේ. එමෙන්ම විවිධ දේශගුණික සහ භූගෝලීය පරිසරයන්හි භූගත ජලය පැවතීම, ගලායාම සහ ගුණාත්මකභාවය පාලනය කරන මූලධර්ම විස්තරාත්මකව නිරූපණය කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාසල් මට්ටමින් භූ ජල විද්‍යා නව පිළිබඳ පාඨමාලා සඳහා ඉගැන්වීමේ මෙවලමක් ලෙසත්, විශේෂිත ජලධර/ප්‍රදේශයක් පිළිබඳ තොරතුරු සොයන පුද්ගලයින් සඳහා භූගත ජල තත්ත්වයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් ලෙසත් මෙම සිතියම් වටිනා මූලාශ්‍රයක් වනු ඇත. එමෙන්ම එය නීති සම්පාදකයින්, විවධ ආයතනවල පුද්ගලයින් සහ භූගත ජලය ඇතිවීම, චලනය සහ ගුණාත්මකභාවය පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම කෙනෙකුට ප්‍රාදේශීය සහ ජාතික භූගත ජල සම්පත් පිළිබඳ හැඳින්වීමක් ද සපයයි.


විශ්වාසදායක භූගත ජල දත්ත සහ තොරතුරු නොමැතිකම ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් සංවර්ධනයට බරපතල බාධාවක් මෙන්ම ඒ පිළිබඳව පර්යේෂණ කිරීමට අමතර බාධාවකි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය වූයේ ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් පිළිබඳ සවිස්තරාත්මක සහ නිවැරදි තොරතුරු විවිධ පාර්ශ්වකරුවන් වෙත ලබා දීමයි. මේ සඳහා හඳුනා ගන්න ලද පාර්ශවකරුවන් පහත පරිදි වේ.

- විවිධ ප්‍රදේශවල හෝ රටෙහි භූගත ජල තත්ත්වයන් පිළිබඳ දැනුම සහ දත්ත සොයන භූ ජල විද්‍යාඥයින් සහ අනෙකුත් වෘත්තිකයන්.
- භූගත ජල තත්ත්වයන් සහ විශ්ලේෂණයන් සඳහා උත්සුක වන ප්‍රතිපත්ති සම්පාදකයින් සහ තීරණ ගන්නන්.

ජල සම්පත් මණ්ඩලය විසින් වසර ගණනාවක් පුරා එක්රැස් කරන ලද වැදගත්ම භූගත ජල දත්ත වලින් සමන්විත වන ශ්‍රී ලංකාවේ භූගත ජල සිතියම ස්ථාවර ආකාරයකින් තනි ප්‍රකාශනයකින් සම්පාදනය කිරීමට අපේක්ෂා කරයි.


භූගත ජල සම්පත් පිළිබඳ පවතින සියලු තොරතුරු රැස් කිරීම, නිසි පරිදි සකස් කිරීම, පවතින තොරතුරු පිරික්සීම, දත්ත විශ්ලේෂණය සහ සිතියම් සකස් කිරීම, භූගත ජල සම්පත සඳහා ඇති අවදානම පිළිබඳ සිතියම් සකස් කිරීම සහ සැකසූ සිතියම් ක්ෂේත්‍ර සත්‍යාපනය කිරීම යන ක්‍රියාකාරකම් සමඟ අධ්‍යයනය පියවරෙන් පියවර ඉදිරියට යමින් පවතී. දැනට රටේ පවතින මූල්‍යමය තත්වය හේතුවෙන් වියදම් කපා හැරීම නිසා එක් රැස් කරන ලද සහ විශ්ලේෂණය කරන ලද දත්ත ක්ෂේත්‍ර තුලදී සත්‍යාපනය කිරීම සිදු නොකරන ලදී.

භූ ගත ජලයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක බව ප්‍රදේශය තුල පැතිරී පවතින ආකාරය දක්වන සිතියම් සකස් කිරීම සඳහා විවිධ නියැදි ලබාගන්නා ලද ස්ථාන 7746 ක් සලකා බලන ලදී. යාපනය අර්ධද්වීපය, දිවයිනේ නැගෙනහිර සහ බටහිර වෙරළ තීරයන්, වියළි කලාපය වැනි සංවේදී ප්‍රදේශ සඳහා වසර කිහිපයක් ඇතුළත රට පුරා මෙන්ම පූර්ව සහ පසු මෝසම් කාලසීමාවන් සැලකිල්ලට ගනිමින් භූ ගත ජලයේ ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බවෙහි පැතිරීම පිළිබඳ සිතියම් සකස් කෙරේ.



රූපය 28: යාපනය අර්ධද්වීපය තුල භූගත ජලයේ ගුණාත්මක භාවය විචලනය වන ආකාරය

මුල් වර්ෂ වලදී යාපනය අර්ධද්වීපය තුල භූ ගත ජල සමීක්ෂණ හා විශ්ලේෂණ කටයුතු සඳහා තෝරා ගන්නා ලද ස්ථාන වක් ප්‍රදේශයකට පමණක් සීමා වූ අතර වම නිසා ජලයේ ගුණාත්මක බවෙහි පැතිරීම අර්ධ ද්වීපයේ වක් ප්‍රදේශයක් තුල පමණක් නිරූපනය කල හැක.




රූපය 29: ශ්‍රී ලංකාව තුළ භූගත ජලයෙහි විවධ ප්‍රමිතින්ගේ ගුණාත්මක බව පැතිරී ඇති ආකාරය..

මෙහිදී සකස් කරන ලද සිතියම් මගින් භූ විද්‍යාව, භූ ජල විද්‍යා, භූගත ජල ප්‍රවාහ පද්ධතිය, සාමාන්‍ය ජලයේ ගුණාත්මක භාවය සහ ජලය උකහා ගැනීමේ භාවිතය පිළිබඳ දළ විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ.

අනාගත තිරසාර ජල සැපයුම සහ ආර්ථික සංවර්ධනය සඳහා භූගත ජල සම්පත් සාර්ථකව සහ තිරසාර ලෙස සංවර්ධනය කළ යුතුය. මේ සඳහා භූ ජල විද්‍යාව සහ භූගත ජලය පිළිබඳ දැඩි අවබෝධයක් අවශ්‍ය වේ. එසේ වුවද, ශ්‍රී ලංකාව තුල භූගත ජලය බහුල ලෙස පවතින විට පවා ඒ පිළිබඳ යාවත්කාලින, නිවැරදි තොරතුරු සොයා ගැනීම සහ ලබා ගැනීම ඉතා අභියෝගාත්මක ය. වම නිසා ශ්‍රී ලංකා භූගත ජල සිතියම රටේ භූගත ජලය පිළිබඳ තොරතුරු වඩාත් තේරුම් ගත හැකි සහ පහසුවෙන් පරිශීලනය කළ හැකි වන පරිදි සකස් කිරීමෙන්, මෙම ගැටලුව විසඳීමට දායක වේ.

දැනට ජල සම්පත් මණ්ඩලය සතු දත්ත හා තොරතුරු භාවිතා කර සකස් කරන මෙම සිතියම් තව දුරටත් නිවැරදි හා විශ්වාසනීය ලෙස සකස් කිරීම සඳහා, පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඔස්සේ තවදුරටත් පුළුල් කිරීම සිදු කල යුතුය.

- රටේ විවිධ ප්‍රදේශ සහ ප්‍රාදේශීය ජල කළමනාකරණ අධිකාරීන්ගෙන් භූගත ජලය පිළිබඳ තව දුරටත් අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබා ගැනීම සහ වමගින් සකස් කරන ලද සිතියම්වල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම.
- ක්ෂේත්‍ර අධ්‍යයනයන් සංවිධානය කිරීමෙන්, සකස් කරන ලද සිතියම් වල පවතින ගැටළුකාරී ස්ථාන පිළිබඳ අධ්‍යයනය කොට ලබා ගන්නා තොරතුරු මගින් වම සිතියම් යාවත්කාලින කල යුතුය.
- මෙම වාර්තාව අවසන් කිරීමට පෙර, භූගත ජල විශේෂඥයින්ගෙන් සමන්විත ශාස්ත්‍රීය වෘත්තිකයන් ගෙන් සැදුම්ලත් කර්තෘ මණ්ඩලයකින් අත්‍යවශ්‍ය උපදෙස් ලබා ගත යුතුය.
- භූ ගත ජල සිතියම් වලට සමගාමිව ඒ පිළිබඳව විස්තර අඩංගු අත් පොතක් සකස් කල යුතුය.



No.	District	No.of tested samples	Suitability for all parameters
1	Ampara	237	33
2	Anuradhapura	474	25
3	Badulla	216	53
4	Batticaloa	25	0
5	Colombo	142	25
6	Galle	102	13
7	Gampaha	336	124
8	Hambanthota	814	10
9	Jaffna	382	82
10	Kalutara	76	27
11	Kandy	41	3
12	Kegalle	31	17
13	Kilinochchi	90	25
14	Kurunegala	110	17
15	Mannar	95	1
16	Matale	247	46
17	Matara	31	2
18	Monaragala	328	29
19	Mullaitivu	57	9
20	Nuwaraeliya	35	25
21	Polonnaruwa	351	46
22	Puthlulama	998	57
23	Rathnapura	72	5
24	Trincomalee	179	19
25	Vavuniya	288	13

රූපය 30: ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්ක වල පවතින භූ ගත ජලයෙහි යෝග්‍යතාවය දක්වන සිතියම

වගුව 06 : GW ATLAS ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2022

	ක්‍රියාකාරකම	ප්‍රගතිය
1	මූලික අධ්‍යයනය ලෙස භූ ගත ජල සම්පත පිලිබඳ පවතින සියලුම දත්ත හා තොරතුරු එක් රැස් කිරීම	100%
2	පවතින තොරතුරු මගින් දත්ත සම්පාදනය, ආවරණයසහ සකස් කිරීම.	100%
3	දත්ත විශ්ලේෂණය සහ භූගත ජලයේ ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව පිළිබඳව සිතියම් සකස් කිරීම.	100%
4	රටේ භූ ගත ජල සම්පත පිළිබඳව අවදානම් තත්ත්ව සිතියම් සහ ඵලදායිතාවය පිළිබඳව සිතියම් සකස් කිරීම	70%
5	අවසාන සිතියම් හා වාර්තාව සකස් කිරීම	60%

1.6 යටිතල පහසුකම් සංවර්ධනය, විද්‍යාත්මක උපකරනවල ක්ෂමතාවය වර්ධනය කිරීම සහ ආයතනය තුල නිපුණතා සංවර්ධනය කිරීම

අනුරාධපුර කොරකහ වැව පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු අවසන් කරන ලද නමුත් රටේ පවතින ආර්ථික අර්බුධය හේතුවෙන් ආරම්භ කර තිබූ අනුරාධපුර කාර්යාලයේ නිළධාරී නිළ නිවාස පුළුල් කිරීමේ කටයුතු නවතා දැමීමට සිදු විය.

ජල ධාරිතා පරීක්ෂණ සඳහා භාවිත කරන ජලයේ ගිල්විය හැකි පොම්ප, විවිධ පර්යේෂණ හා අධ්‍යනයන වලදී යොදා ගන්නා ජල මට්ටම නිමානන උපකරණ ආදී විද්‍යාත්මක උපකරණ කිහිපයක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. නමුත් රටේ පවතින ආර්ථික අර්බුධය හේතුවෙන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා එම ප්‍රසම්පාදන කටයුතු නවතා දැමීමට සිදු විය.

කෙසේ නමුත් ජලයේ ආම්ලිකතාවය මැනීමේ උපකරණ (pHmeters) 02 ක් පමණක් ප්‍රසම්පාදන කටයුතු අවසන්

කර මණ්ඩලය වෙත මිල දී ගන්නා ලදී.

ආයතනයේ සේවකයින්ගේ ශක්‍යතා වර්ධනය කිරීම සඳහා සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් වැඩි ප්‍රමාණයක් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් නවතා දැමීමට සිදු විය. කෙසේ නමුත් මෙම තත්වය මගහරවා ගැනීම සඳහා මාර්ගස්ථ ක්‍රමය යටතේ සිදු කරන පුහුණු වැඩසටහන් පිලිබඳ අවධානය යොමු කරනු ලැබේ.

1.7 ජල අංශයට අදාල හදිසි ආපදා තත්ත්ව සඳහා ක්‍රියාත්මක වීම (නියඟ, ගංවතුර, භූ ගත ජලය දූෂණය වීම ආදී,) (E-USE)

2022 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ආපදාවට ලක්වූ ප්‍රදේශවල ප්‍රජාවගේ අවශ්‍යයතා අනුව භූගත ජල ගවේෂණය, නිෂ්පාදන නළ ළිං ඉදිකිරීම සහ ජල ධාරිතා පරීක්ෂණ පැවැත්වීම සිදු කරන ලදී.



රූපය 31: මාතර ප්‍රදේශය තුල ජල ධාරිතා පරීක්ෂණ පැවැත්වීම.



රූපය 32: බෙම්මුල්ල සහ මාතර ප්‍රදේශ වල නළ ළිං සඳහා අත් පොම්ප සවි කිරීම.

වගුව 07 : EM USE ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2022

	ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය
1	අවශ්‍යතාවය අනුව අදාල ප්‍රදේශ තුල මූලික සමීක්ෂණ සිදු කිරීම සහ භූ ගත ජලය පවතින ස්ථාන හඳුනා ගැනීම	10	40%
2	හඳුනා ගන්නා ලද ජල අවශ්‍යතාවයන් පවතින ප්‍රදේශ වල පනිය ජලය සඳහා විකල්ප ප්‍රභව ලෙස භාවිතා කිරීම සඳහා නිෂ්පාදන නළ ළිං ඉදි කිරීම.	10	60%

2. උත්පාදන මූල්‍ය ක්‍රියාකාරකම්

2.1 වාණිජ ක්‍රියාකාරකම්

රාජ්‍ය හා අනෙකුත් ආයතන මෙන්ම පොදු ජනතාවගෙන් කරන ලද ඉල්ලීම් හා අවශ්‍යතාවයන්ට අනුව පහතින් දැක්වෙන ක්‍රියාකාරකම් සිදුකරන ලදී. 2022 ඔක්තෝබර් මාසය දක්වා ප්‍රගතිය පහතින් දක්වා ඇත.

1. භූ ජල විද්‍යා සමීක්ෂණ - (නළ ළිං ඉදි කිරීම සඳහා සුදුසු ස්ථාන සලකුණු කිරීම, පස්, ගල්, වැලි කැණීම් කටයුතු හා අනෙකුත් සංවර්ධන කටයුතු වලදී භූගත ජලයට හානියක් නොවන සේ එම ව්‍යාපෘති සිදු කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම)



රූපය 33: පස් කැණීමේ ව්‍යාපෘතියක භූ ජල විද්‍යා සමීක්ෂණ සිදු කිරීම



රූපය 34: කළු ගල් කැණීමේ ව්‍යාපෘතියක් පවතින ප්‍රදේශයක් අධ්‍යයනය

2. නළ ළිං ඉදි කිරීම

3. ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම - මෙමගින් නිෂ්පාදන නළ ළිං වලින් අවට භූ ගත ජලයට හානි නොවන පරිදි උකහා ගත හැකි ජල පරිමාව නිර්ණය කරනු ලැබේ.



4. පවතින නළ ළිං සංවර්ධනය කිරීම

5. ජල සාම්පල රසායනික විශ්ලේෂණය
   මෙම ක්‍රියාකාරකම් වලට අදාලව 2022 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

මෙම ක්‍රියාකාරකම් වලට අදාලව 2022 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.


වගුව 08 : ප්‍රගති සාරාංශය - 2022

අංකය	ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය	ප්‍රගතිය
1	**භූ ජල විද්‍යා සමීක්ෂණ**	425	451	106%
2	**නළ ළිං ඉදි කිරීම**	100	55	55%
3	**ජල ධාරිතා පරීක්ෂණ**	175	159	91%
4	**පවතින නළ ළිං සංවර්ධනය කිරීම**	10	04	44%
5	**ජල සාම්පල රසායනික විශ්ලේෂණය**	900	1044	116%


2.2 භූ ජල නියාමන කටයුතු

2022 වර්ෂයේදී ජල සම්පත් මණ්ඩලය විසින් ආරම්භ කරන ලද භූගත ජල නියාමන කටයුතු වල සාරාංශ ප්‍රගතිය පහත දක්වා ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වාණිජ, කෘෂිකාර්මික සහ ගෘහාශ්‍රිත කටයුතු සඳහා යොදා ගන්නා භූගත ජල මූලාශ්‍ර පිළිබඳ තොරතුරු රැස් කිරීම මෙම වසරේ ප්‍රධාන වශයෙන් අරමුණු කරන ලදී. ඉහත ක්‍රියාකාරකම් සාර්ථක කර ගැනීම සඳහා, ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි තොරතුරු රැස්කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛයක් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිකුත් කරන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජල සම්පත් මණ්ඩලය වෙත අදාළ තොරතුරු ලැබීමෙන් පසු අදාළ දත්ත විශ්ලේෂණයට ලක් කල අතර එම තොරතුරු අනුව අදාළ සිතියම් සකස් කරන ලදී. වාණිජමය වශයෙන් භූ ගත ජලය ලබාගන්නා ජල මූලාශ්‍ර පිළිබඳව ප්‍රධාන වශයෙන් දත්ත පද්ධතියක් සකස් කරනු ලැබීය. මෙතෙක් ලැබුණු දත්තවල ප්‍රගතිය පහත පරිදි වේ.



රූපය 36: භූගත ජල මූලාශ පිළිබඳ තොරතුරු ලැබී ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල



රූපය 37: කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූගත ජලය පරිභෝජන ප්‍රමාණයන් වල ව්‍යාප්තිය .

වගුව 09: වක් වක් දිස්ත්‍රික්කයෙන් ලැබුණු තොරතුරු වල සාරාංශය

දිස්ත්‍රික්කය	දත්ත ලැබී ඇති ප්‍රා.ලේ කොට්ඨාශ ගණන	ජල මූලාශ්‍ර ගණන
මහනුවර	19	16,337
මාතලේ	2	1,658
කුරුණෑගල	14	53,696
පුත්තලම	11	30,779
බදුල්ල	4	1,010
කෑගල්ල	7	42,616
රත්නපුර	17	29,718
කොළඹ/ ගම්පහ/ රත්නපුර	8	281
අනුරාධපුර/ පොලොන්නරුව	3	5898
මාතර	9	5,799
අම්පාර	3	633
යාපනය	15	109,030
එකතුව		**296,406**

තවද, නල ළිං ඉදිකිරීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා ලියාපදිංචි බාහිර විදුම් නිලධාරීන් 15 දෙනෙකු ජල සම්පත් මණ්ඩලයේ පළපුරුදු විදුම් නිලධාරීන් විසින් පුහුණු කරන ලදී.





රූපය 38: බාහිර විදුම් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන

ඊට අමතරව පහත සඳහන් කටයුතු සිදුකරනු ලැබීය.

වගුව 10: ප්‍රගති සාරාංශය - 2022

SN	ක්‍රියාකාරකම	ගණන
1	පුද්ගලික විදුම් සමාගම් ලියාපදිංචි කිරීම	52
2	විදුම් යන්ත්‍ර සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම.	72
3	බාහිර භූජල විද්‍යාඥයින් ලියාපදිංචි කිරීම	10
4	භූ ජල විද්‍යා සමීක්ෂණ වාර්තා සඳහා අනුමැතිය ලබාදීම (නල ළිං ඉදිකිරීමට පෙර අනුමැතිය ලබා ගැනීම සඳහා ලියාපදිංචි බාහිර ජල විද්‍යාඥයින් විසින් සකස් කර ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද භූ ජල විද්‍යා වාර්තා)	583
5	භූගත ජලය භාවිත කරන සමාගම්වල දෛනික භූගත ජල පරිභෝජනය මැනීම සඳහා චීම නිෂ්පාදන නළ ළිං සඳහා ජල මනු සවි කිරීම.	4
6	භූගත ජලය භාවිතා කරන සමාගම්වල තොරතුරු රැස් කිරීම (මෙම සමාගම් තම වාණිජ කටයුතු සඳහා නළ ළිං හා වල ළිං වලින් භූගත ජලය ලබා ගනී).	600
7	භූගත ජල ගැටළු සම්බන්ධව පැමිණිලි සඳහා චීකාබද්ධ පරීක්ෂණ හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්	20
8	පුහුණු කිරීමට ලක්කළ විදුම් නිලධාරීන් ගණන	15

2.3 පර්යේෂණ නැඹුරු වාණිජ කටයුතු

2.3.1 දියවන්නා ඔයේ ජල පෝෂක ප්‍රදේශය තුළ භූගත ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය. (පාර්ලිමේන්තු වැව් පෝෂක ප්‍රදේශයේ ජලයේ ගුණාත්මකභාවය යථා තත්ත්වයට පත් කිරීමේ කළමනාකරණ සැලැස්ම යටතේ)


පාර්ලිමේන්තු වැව් පෝෂක ප්‍රදේශයේ ජලයේ ගුණාත්මකභාවය යථා තත්ත්වයට පත් කිරීමේ කළමනාකරණ සැලැස්ම යටතේ මෙම ප්‍රදේශයේ භූගත ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය සිදු කෙරේ. දියවන්නා ඔය යනු ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක නගරය වන කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුරයේ පිහිටි ප්‍රධාන කුඩා ජලාශයකි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ගොඩනැගිල්ල වැව මධ්‍යයේ කෘතිම දූපතක ඉදිකර ඇත.

ජන ඝනත්වය, කාර්මීකරණය සහ සීඝ්‍ර නාගරීකරණය යනාදිය හේතුවෙන් පසුගිය දශකය තුළ දියවන්නා ඔය ජලාශයේ ජලයේ ගුණාත්මකභාවය පිරිහීම සම්බන්ධ පාරිසරික ගැටලු රාශියකට මුහුණ පෑමට සිදු විය. 2021 වර්ෂයේදී දී ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත ආසන්නයේ දියවන්නා ඔය වැවේ ඇල්ගී විශාල වශයෙන් පවතින බව නිරීක්ෂණය විය. දියවන්නා ඔය ආශ්‍රිත ජල මාර්ගවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ දූෂණය පාලනය කිරීම සඳහා කාර්ය සාධක බලකාය නිර්මාණය කරමින් චීම ගැටලුව නිරාකරණය කිරීමට ශ්‍රී ලංකා රජය වහාම පියවර ගන්නා ලදී.


මෙම භූගත ජල නිරීක්ෂණ අධ්‍යයනය, කාර්ය සාධක බලකායේ ප්‍රධාන වැඩසටහන වන "පාර්ලිමේන්තු වැව් පෝෂක ප්‍රදේශයේ ජලයේ තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කළමනාකරණ සැලැස්ම" යටතේ ඇතුළත් වන අතර චීහි ප්‍රධාන අරමුණ වන්නේ අවට ප්‍රදේශයේ භූ ගත ජලයේ ගුණාත්මකභාවය විචලනය වීම පිළිබඳව අධ්‍යයනය කිරීම මගින් භූ ගත ජලය දූෂණය වීම කෙරෙහි බලපාන මූලාශ්‍රයන් හඳුනාගැනීමත්ය. ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත උප ක්‍රියාකාරකම් පහත පරිදි සැලසුම් කරනු ලැබීය.

- මූලික හඳුනාගැනීමේ පරීක්ෂණ කටයුතු මගින් ස්ථානීය පරීක්ෂණ කටයුතු සිදුකර භූගත ජල මූලාශ්‍ර වල ජලයේ රසායනිකයන් සොයා බැලීම
- ප්‍රදේශයේ භූගත ජලයේ ගුණාත්මකභාවයේ විචලනයන් අධ්‍යයනය කිරීම හා චීවායේ වෙනස්වීම් හඳුනාගැනීම.
- උප පෝෂකය තුළ භූගත ජලය ගලායාමේ හැසිරීම අධ්‍යයනය කිරීම.
- උප ජල පෝෂකය තුළ ඇති ජලය දූෂණය වීමේ මූලාශ්‍ර හාඳුනා ගැනීම.
- සොයාගැනීම් හා තත්වයන් පාලනය කිරීමේ උපක්‍රම.


සොයාගැනීම් හා සිතියම් :



රූපය 39: අධ්‍යයන ප්‍රදේශය: දියවන්නා ඔය වැවේ ජල පෝෂක ප්‍රදේශය, ජල සාම්පල ලබාගත් ස්ථානයන් සහ ඇතැම් නියැදින් ලබාගත් ස්ථාන



රූපය 40: අධ්‍යයන ප්‍රදේශය තුල භූගත ජලයේ pH අගය වෙනස්වීම



රූපය 41: ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය - ජලයේ ද්‍රාව්‍ය ඇමෝනියා හා නයිට්‍රේට්

වගුව 11: ප්‍රගති සාරාංශය- 2022

අංකය	ක්‍රියාකාරකම	ඉලක්කය	ප්‍රගතිය
1	දත්ත රැස් කිරීම සහ භූගත ජල නිරීක්ෂණ ජාලය සැලසුම් කිරීම (අධීක්ෂණ ස්ථාන 40)	40	100%
2	භූගත ජල මට්ටම නිරීක්ෂණය කිරීම (2022 වසරේ තෙවන සහ හතරවන කාර්තුව ආවරණය වන ලෙස පදනම් කරගනිමින්)	40	50%
3	අධික්ෂණය සඳහා තෝරාගත් ස්ථාන සඳහා මුහුදු මට්ටමේ සිට උස ගණනය කිරීම් (40)	40	28%
4	එකතු කරන ලද සාම්පල 80 ක භෞතික, රසායනික, බැර ලෝහ සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරාමිතීන් සඳහා ජල සාම්පල විශ්ලේෂණය (ස්ථාන 40 සඳහා තෙවන සහ හතරවන කාර්තුව ආවරණය වන ලෙස)	80	50%
5	දත්ත විශ්ලේෂණය සහ අවසන් වාර්තාව සකස් කිරීම (පිටපත් 03)		40%

භෞතික රසායනික පරාමිතීන්, ජීව විද්‍යාත්මක පරාමිතීන් (සනීපාරක්ෂක දර්ශක) සහ බැර ලෝහ ඇතුළුව ජල තත්ත්ව පරාමිතීන් 17ක් විශ්ලේෂණය කරන ලදී. අවසාන වශයෙන්, pH සහ ජලයේද ද්‍රාව්‍ය ඇමෝනියා ප්‍රධාන ගැටළුකාරී පරාමිතීන් බව අධ්‍යයනයෙන් පෙනීයන ලදී.

අධ්‍යයන කාලය තුළ සියලුම සාම්පලවල සිදු කරන ලද pH මිනුම් අනුව එම pH අගය 3 - 6.8 අතර වේ. නියැදියෙන් 77.5% ක් ජලයේ ආම්ලික ස්වභාවය පෙන්නුම් කරන අතර පානීය අවශ්‍යයතා සඳහා ආරක්ෂිත pH මට්ටමට වඩා අඩු අගයන් වේ.

සාමාන්‍ය ඔක්සිජන්කරණ ක්‍රියාවලියේදී අස්ථායී වුවද, අනාවරණය කරගත් ආකාරයට ජලයේ ද්‍රාව්‍ය ඇමෝනියා ප්‍රමාණය ශ්‍රී ලංකාවේ පානීය ජලය තත්ත්ව ප්‍රමිතියේ (0.06 mg/L) සම්මත මට්ටමට වඩා බෙහෙවින් වැඩි අගයක් ගනී. කෙසේ වෙතත්, අධ්‍යයන ප්‍රදේශය තුළ ඇති භූගත ජල තත්ත්ව විචලනයන්ගේ රටා අර්ථ නිරූපණය කිරීම සඳහා වැඩිදුර අධ්‍යයනයන් අවශ්‍යය වේ.

2.3.2 නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ පර්යන්ත ප්‍රදේශය පිළිබඳ සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක සහ භූ ගත ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව අධ්‍යයනය.

නොරොච්චෝලේ බලාගාරය ලෙසද හඳුන්වන ලක්විජය බලාගාරය ශ්‍රී ලංකාවේ විශාලතම බලාගාරය වේ. මෙම බලාගාරය පුත්තලම, කල්පිටිය අර්ධද්වීපයේ දකුණු දෙසින් පිහිටා ඇත. ලංකා විදුලිබල මණ්ඩලයට අනුව, ඇමරිකානු ඩොලර් මිලියන 455 ක පළමු අදියර වාර්ෂිකව TWh 1.7 කට ආසන්න විදුලිය ජනනය කරයි; 2011 වසරේ ශ්‍රී ලංකාවේ මුළු නිෂ්පාදනය වූ 11.5 TWh හා සසඳන විට සැලකිය යුතු ප්‍රමාණයකි. මෙම බලාගාරය වේයන්ගොඩ දක්වා කිලෝමීටර 115 (සැතපුම් 71) 220-කිලෝවෝල්ට් සම්ප්‍රේෂණ මාර්ගයක් හරහා විදුලිබල පද්ධතියට සම්බන්ධ කර ඇත. මිනිසා විසින් සාදන ලද රටේ උසම ව්‍යුහයන්ගෙන් එකක් වන මීටර් 150 (අඩි 492) උස චිමිනියක් හරහා බලාගාර පිටාර විමෝචනය වේ. බලාගාරයේ මූලික වශයෙන් විදුලිය නිපදවනු ලබන්නේ මෙගාවොට් 300ක් නිපදවිය හැකි වාෂ්ප ටර්බයිනයක් භාවිතා කරමිනි. ගල් අඟුරු, වාෂ්ප නිපදවීමට ඉන්ධන ලෙස භාවිතා කරන අතර එය ටර්බයිනය 3000 rpm වේගයෙන් කරකැවීමට භාවිතා කරයි.

ලක්විජය බලාගාරය අක්කර 100ක පමණ විශාලත්වයකින් යුත් තම පරිශ්‍රයේ භූමි අලංකරණ කටයුතු සඳහා භූගත ජලය භාවිතා කරයි. බලාගාරයේ ඉදිකිරීම් සඳහා ජල අවශ්‍යතාවය සඳහා මුලින් ඉදිකරන ලද මෙම බලාගාර පරිශ්‍රයේ පවතින නොගැඹුරු ළිං පද්ධතිය මගින් අවශ්‍ය ජලය ලබා ගනී. සමස්තයක් වශයෙන්, මිලිමීටර් 225 ක විෂ්කම්භයක් සහිත ආසන්න වශයෙන් මීටර් 6 ක් ගැඹුරින් යුත් නොගැඹුරු නල ළිං ළිං 74 ක් පමණ ඉදිකර ඇත. මෙම ප්‍රදේශයේ ස්ථිතික භූගත ජල මට්ටම බිම් මට්ටමේ සිට මීටර් 2.50-3.50 ක් පමණ ගැඹුර පරාසයක් පමණ වේ. නල ළිං 74 ක් ඉදිකර තිබියදීත්, භූමි අලංකරණ කටයුතු සඳහා භූගත ජලය ලබාගැනීම සඳහා ක්‍රමානුකූල භාවිතයකින් තොරව විවිධ ආකාරයෙන් ළිං වරින් වර භාවිතා කර ඇත. කෙසේ වෙතත්, ලක්විජය බලාගාරයේ ඉල්ලීම මත, ජල සම්පත් මණ්ඩලය විසින් මෙම අධ්‍යයනයේ පළමු අදියරේදී තෝරාගත් ළිං සඳහා ජලය පොම්ප කිරීමේ සැලැස්මක් හා ආරක්ෂිධත ජල ධාරිතාවයන් නිර්ණය කිරීම සඳහා පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී.



රූපය 42: නොරොච්චේලි බලාගාරයේ සහ ඒ අවට අධ්‍යයන ප්‍රදේශයේ ගූගල් සිතියම සහ නිමානන ස්ථානයන්



රූපය 43: ජල සාම්පල රැස් කිරීම


අවසාන වශයෙන් ළිං පද්ධතිය සඳහා ජල මනු සවිකිරීම මගින් භූගත ජලය උකහා ගැනීම තවදුරටත් අධීක්ෂණය කිරීම නිර්දේශ කරන ලදී. ප්‍රදේශයේ භූගත ජල සම්පත් භාවිතය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සහ අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම මගින් ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් මගින් සිදුවිය හැකි ජල දූෂණය වීම් අවම කරගනිමින් ජලධරය දිගු කාලීන ලෙස සංරක්ෂණය කිරීම ඉතාමත් ඵලදායී කටයුත්තක් වේ.

3. විදේශ ආධාර යටතේ සිදු කරන ලද ව්‍යාපෘති:

මෙම ව්‍යාපෘතිය මඟින් මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ද්‍රෝණීන් ආවරණය වන අතර නිරීක්ෂණ ස්ථාන 125 ක් සහ වර්ෂාපතන 14 ක් ස්ථාපිත කෙරේ. තවද, විෂය පථය පුළුල් කිරීමේ අදියරේදී යාපනය අර්ධද්වීපය සහ පුත්තලම ප්‍රාදේශය (වනාතවිලු සහ මදුරන්කුලිය භූගත භූජල ද්‍රෝණි) ද ඇතුළත් වේ.

ව්‍යාපෘති ප්‍රදේශය පුළුල් කරන ලද ප්‍රදේශය තුල නිරීක්ෂණ ස්ථාන 65ක්ද, වර්ෂාපතන මාන 6ක් ද ස්ථාපිත කෙරේ.

භූගත ජල මට්ටම සහ ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක හා තත් කාලීන දත්ත රැස් කිරීම සඳහා ශ්‍රී ලංකාව සඳහා ජාතික භූගත ජල අධීක්ෂණ ජාලය පිහිටුවීමේ මූලික පියවර වශයෙන් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අරමුණයි.



රූපය 44: මූලික ව්‍යාපෘතිය සඳහා යෝජිත ගංගා ද්‍රෝණි


වගුව 12: ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2022

ක්‍රියාකාරකම	මල්වතු ඔය		මාදුරු ඔය		කුඹුක්කන් ඔය	
	TGT	CML	TGT	CML	TGT	CML
මූලික අධ්‍යයනය	Completed					
හදුනාගත් අධීක්ෂණ කලාප	90	90	25	25	25	25
භූ භෞතික විද්‍යා සමීක්ෂණ	85	98	20	24	20	22
බිම් අනුමැතිය	85	88	20	20	20	20
නිරීක්ෂණ ළිං ඉදිකිරීම	85	85	20	20	20	20
දත්ත ලොජර් ස්ථාපනය කිරීම	85	85	20	20	20	20
මූලික අධ්‍යයනය	සම්පූර්ණ කරන ලදී (100%)					
හදුනාගත් අධීක්ෂණ කලාප	සම්පූර්ණ කරන ලදී					

අධීක්ෂණ ස්ථාන තෝරා ගැනීම පදනම් වී ඇත්තේ මානව ක්‍රියාකාරකම් සහ භූජල විද්‍යාත්මක තත්ත්වයන් මත භූගත ජලයේ ගුණාත්මකභාවය පහල බැසීමේ අවධානමට ලක්ව ඇති ප්‍රදේශ මතය. ජල මට්ටම, විද්‍යුත් සන්නායකතාවය, නයිට්‍රේට් සහ උෂ්ණත්වය මෙම ස්වයංක්‍රීය පද්ධති සමඟ අධීක්ෂණය කරන මූලික පරාමිතීන් වේ. ඊට අමතරව, මෙම ජල ද්‍රෝණි තුළ කාලයත් සමඟ භූගත ජලය අපවිත්‍ර වීමේ නැඹුරු තාවය අවබෝධ කර ගැනීම සඳහා භූගත ජලයේ බැර ලෝහ සාන්ද්‍රණයන් වරින් වර පරීක්ෂා කෙරේ.

වගුව 13: අතිරේක නියමු ප්‍රදේශ වල ක්‍රියාකාරකම් වල ප්‍රගතිය - 2022

ක්‍රියාකාරකම	පුත්තලම		යාපනය අර්ධද්වීපය	
	TGT	CML	TGT	CML
මූලික අධ්‍යයනය	සම්පූර්ණ කරන ලදී			
හදුනාගත් අධීක්ෂණ කලාප	25	30	40	43
භූ භෞතික විද්‍යා සමීක්ෂණ	සම්පූර්ණ කරන ලදී			
බිම් අනුමැතිය	25	25	40	40
නිරීක්ෂණ ළිං ඉදිකිරීම	25	25	08	08
දත්ත ලොජර් ස්ථාපනය කිරීම	සම්පූර්ණ කරන ලදී			





රූපය 45 : මිහින්තලේ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ජල සම්පාදන ව්‍යාපෘතිය ආශ්‍රිතව ඉදි කරන ලද පරීක්ෂණ නළ ළිඳ සහ එය වෙබ් ද්වාරය ඔස්සේ පෙන්වන ආකාරය

ගිවිසුම් ගත වී ඇති ආකාරයට නෙදර්ලන්තයේ විශේෂඥයින්ගේ තාක්ෂණික සහයෝගය ලබා ගනිමින් ජල සම්පත් මණ්ඩලයේ තත්වයන් සහ ක්‍රමවේදයන්ට අනුව මෙම ව්‍යාපෘතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කරමින් පවතී. 2022 ඔක්තෝබර් දක්වා කාලය සඳහා වූ ව්‍යාපෘතියේ මූලික භෞතික හා මූල්‍ය සාරාංශය පහත දැක්වේ.

වෙන්කිරීම 2022	**රු.මි. 350 n**	
මූල්‍යමය ප්‍රගතිය	**රු.මි. 238 (ඉලක්කගත)**	**රු.මි. 106 (ලගාකරගත්)**
භෞතික ප්‍රගතිය	**100% (ඉලක්කගත)**	**100% (ලගාකරගත්)**

විදුම් අංශය

ප්‍රධාන කාර්යයන්

- නල ළිං ඉදිකිරීම්
- නල ළිං පිරිසිදු කිරීම්
- නල ළිං අත්පොම්ප සවි කිරීම්
- නල ළිං පුනරුත්තාපනය සහ නඩත්තු කිරීමේ කටයුතු
- පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සඳහා නල ළිං ඉදිකිරීමේ කටයුතු

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ ජල අවශ්‍යවතාවය සඳහා විවිධ ප්‍රමාණ වල නල ළිං ඉදි කිරීම ප්‍රධාන කාර්ය භාරය වේ. විදුම් අංශය මඟින් නල ළිං විදුම් කටයුතු සිදු කරනු ලබන අතර ඒ සඳහා මෙහෙයුම් අංශය මඟින් ලබාදෙනු ලබන විදුම් කිරීම සඳහා අදාල නිර්දේශ අඩංගු ලිපිය මත නළ ලිං විදුම් සිදුකරනු ලබයි. (Job Order) ජල සම්පත් මණ්ඩලය මගින් ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණවත් සහ නිපුන විදුම් කණ්ඩායමක් මෙන්ම ඒ සඳහා අවශ්‍ය) කරන විදුම් යන්ත්‍ර සහ උපකරණද පවතී. මඩ විදුම් සහ වායු විදුම් යන දෙවර්ගයම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ඕනෑම භූ විද්‍යාත්මක ස්ථරයන් යටතේ නල ළිං ඉදි කිරීමේ හැකියාව පවතී.

දැනට මෙම අංශය සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශය සතුව නල ළිං විදුම් පිළිබඳව මනා පුහුණුවකින් යුතු නිපුන විදුම් නිලධාරීන් 11 යටතේ ක්‍රියාත්මක වේ. ඉහත සඳහන් කරන ලද විදුම් අංශයේ කාර්ය භාරයන් අනුව 2022 වර්ෂය සඳහා පහත කාර්ය භාරය සිදුකර ඇත. (වගුව1)

සොනික් විදුම්

සොනික් විදුම් යනු නවීන විදුම් ක්‍රමවේදයකි. ඉහළ සංඛ්‍යාතයකින් හා චලනයන් සම්බන්ධ වී භ්‍රමනය සිදුවන විශේෂ විදුම් ක්‍රමයකි.

මෙම ක්‍රමය මඟින් පාංශු ස්ථර වල භූ විද්‍යාත්මක වශයෙන් විදුම් සඳහා යොදන ද්‍රවන සහ අනෙකුත් ද්‍රව්‍ය මිශ්‍ර වීමකින් තොරව ලබා ගැනීමට ඇති හැකියාව පවතී.

මෙම විදුම් ක්‍රමය මඟින් නොබැදුනු පාංශු ස්ථරවල නියැදිමිශ්‍ර වීමෙන් තොරව අධ්‍යයනය කල හැකි වේ. නමුත් දැනට පවතින තාක්ෂණය අනුව සමහර අවස්ථාවලදී ගැඹුරු කලාපයන්ට යාමේ හැකියාවන් දැනට සීමාවී ඇත.

දැනට ක්‍රියාත්මක භූගත ජල නිරීක්ෂණ ජාල ව්‍යාපෘතිය භාර දීමෙන් පසු, ජල සම්පත් මණ්ඩලය මගින් සොනික් (SONIC) කැණීම් ශිල්පිය ක්‍රම ආරම්භ කෙරේ. සහකාර විදුම් අධිකාරීවරුන් 04 දෙනෙකු දැනටමත් ඉහත ව්‍යාපෘතියෙන් විදුම් තාක්ෂණ පුහුණුව ලබා ඇත. ව්‍යාපෘතියේ වැඩ අවසන්ව ඇති අතර භාණ්ඩ භාර දීමේ කටයුතු සිදුවෙමින් පවතී. මෙය 2023 ජනවාරි මස අවසන්වීමට නියමිතව ඇත.

2022 විදුම් අංශයේ වැඩ පිළිබඳ විස්තරය
විදුම් අංශයේ ප්‍රගතිය - 2022
නළ ළිං විදුම් කිරීම සහ ළිං පිරිසිදු කිරීම.

මාසය	වොසිප් ව්‍යාපෘතිය	අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි	මා ඔය	වාණිජ ව්‍යාපෘතිය	ළිං පිරිසිදු කිරීම	ප්‍රතිසංස්කරණය කරන	ඉදි කරන ලද අත්පොම්ප බේසම්	එකතුව
ජනවාරි	1	-	-	14	1	-	-	16
පෙබරවාරි	-	-	-	6	1	-	-	7
මාර්තු	1	1	2	10	2	-	-	16
අප්‍රේල්	-	-	-	3	-	-	-	3
මැයි	-	-	-	-	3	-	-	3
ජුනි	1	-	-	2	-	-	-	3
ජුලි	-	-	-	-	-	-	-	0
අගෝස්තු	1	-	-	-	-	-	-	1
සැප්තැම්බර්	-	-	-	10	2	1	-	13
ඔක්තෝබර්	-	-	-	11	-	-	-	11
නොවැම්බර්	-	-	-	7	2	-	**8**	**17**
දෙසැම්බර්	1	-	-	8		1	**1**	**11**
එකතුව	**5**	**1**	2	**71**	**11**	**2**	**9**	**101**

නළ ළිං - 79
ළිං පිරිසිදු කිරීම - 11
ප්‍රතිසංස්කරණය කරන ලද - 01
ඉදි කරන ලද අත්පොම්ප බේසම් - 08

ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාරවල 2022වසරේ වාර්ෂික ප්‍රගතිය

2022 වසරේදී ජල සම්පත් මණ්ඩලයට අයත් රසායනාගාර හතර (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය) හි ජල සාම්පල විශ්ලේෂණය පිළිබඳ වාර්තාව පහත පරිදි වේ.

ජල විශ්ලේෂණය පිළිබඳ විස්තරය

	විශ්ලේෂණ වර්ගය	විශ්ලේෂණය කල ජල සාම්පල ගණන	ආදායම (රු.)
1	රසායනික විශ්ලේෂණ (සම්පූර්ණ විශ්ලේෂණ සහ පරාමිතීන් කීපයක්) (වාණිජ)	500 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)	**2,654,891.00**
2	ක්ෂුද්‍රජීව විශ්ලේෂණය (වාණිජ)	47 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)	**92,620.00**
3	රසායනික සහ ක්ෂුද්‍රජීව විශ්ලේෂණය (භාණ්ඩාගාර දීමනා යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති)	1479 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)	
4	බැර ලෝහ විශ්ලේෂණය (වාණිජ)	165 (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය)	**495,000.00**
5	සමස්ථ ආදායම	භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හැර	**3,242,511.00**

ජල විශ්ලේෂණය පිළිබඳ විස්තරය

1. රසායනික හා ක්ෂුද්‍රජීව විශ්ලේෂණය

2022 වසරේදී වාණිජ ජල සාම්පල 712 (සම්පූර්ණ, තෝරාගත් ජල පරාමිති සහ ක්ෂුද්‍රජීවී පරීක්ෂාව, heavy metal සඳහා) විශ්ලේෂණය කරන ලද අතර, ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාර හතරේ සමස්ත වාණිජ ආදායම මිලියන 3.2 විය.

ජල සම්පත් මණ්ඩලයේ අනුරාධපුර රසායනාගාරයේ ජාත්‍යන්තර තත්ව සහතිකය රසායනික විශ්ලේෂණය සඳහා (ISO 17025 2005) ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.



Fig 1 : Microbiology Laboratory

2. බැර ලෝහ පරීක්ෂාව (ආසනික්, කැඩ්මියම්, ක්‍රෝමියම්, ලෙඩ්, මැංගනීස්, සොඩියම්, පොටෑසියම්, සිනික්)

- බැර ලෝහ විෂ්ලේෂණය සඳහා ව්‍යාපෘති සහ පුද්ගලික අංශ වලින් ලැබෙන ජල සාම්පල කොළඹ රසායනාගාරයේ (AAS) සහ අනුරාධපුර රසායනාගාරයේ (ICP-MS) විශ්ලේෂණය කටයුතු සිදු කිරීම.



Fig 2: Instrument (Atomic Absorption Spectrophotometer) using for Heavy metal analysis in water samples.

3. ප්‍රගතිය

අප ජලය (WASTE WATER) විශ්ලේෂණය කිරීමේ රසායනාගාරයේ නව ජල පරාමිති කිහියක් ආරම්භ කිරීම.

ප්‍රධාන කාර්යාලය

පාලන අංශය, මුදල් අංශය, සැපයුම් අංශය, භූජල අංශය, රසායනාගාරය, විදුම් අංශය, මෙහෙයුම් අංශය, විගණන අංශය, ප්‍රවාහන අංශය යන අංශයන්ගෙන් ප්‍රධාන කාර්යාලය සමන්විත වන අතර පුත්තලම, අනුරාධපුර, මොණරාගල හා යාපනය යනුවෙන් පළාත් කාර්යාල 4 කින් සමන්විත වේ.

මුදල් අංශය
සමාලෝචිත වසර තුළදී මුලු ආදායම රුපියල් මිලියන 98.7 ක් විය. 2022 වර්ෂය වෙනුවෙන් පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් මහාභාණ්ඩාගාරයෙන් ලැබූ මුදල පිළිවෙලින් රුපියල් මිලියන 191.6 සහ රුපියල් මිලියන 7.4 කි. වර්ෂය සඳහා වාර්තාවූ අලාභය රුපියි මිලියන 27.5

පාලන අංශය
2022 වර්ෂයේ ජල සම්පත් මණ්ඩලයේ මුළු සේවක මණ්ඩලය 258 කි. මෙම වසරේදී ස්ථිර සේවකයින් 06 දෙනෙකු බඳවා ගන්නා ලදී සේවකයින් 07 දෙනෙකු ඉල්ලා අස්වී ඇති අතර, සේවකයින් 03 දෙනෙකු විශ්‍රාම ගොස් ඇත.

මානව සම්පත් සංවර්ධනය
මණ්ඩලයේ ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා සේවකයින් පුහුණු පාඨමාලා වෙත යොමු කිරීමට පියවර ගන්නා ලදී. විධායක ශ්‍රේණියේ නිලධාරීන් 02 කු ඇතුළු සේවකයින් කෙටි පුහුණුවකට යොමු කරන ලදී.

ප්‍රවාහන ඇනිය
සමාලෝචිත වසර තුළදී මණ්ඩලයේ ප්‍රවාහන ඇනිය වාහන හැත්තෑ තුනකින් (73) යුක්ත විය. මේවා අතරින් වාහන 63 ක් හොඳ තත්ත්වයේ පැවතිනි. ඒවා ප්‍රධාන වශයෙන් ද්විත්ව කාර්ය වාහන, මෝටර් රථ, ජීප්, ලොරි සහ බර ඔසවන යන්ත්‍ර වේ.

භූජල අංශය
ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබන්නේ භූජල අංශය මඟිනි.

මෙහෙයුම් අංශය
ජල සම්පත් මණ්ඩලයේ සියලුම මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන්නේ මෙහෙයුම් අංශය මඟිනි.

සැපයුම් අංශය
ජල සම්පත් මණ්ඩලයේ සියලුම භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් හා සැපයුම් කටයුතු වලට අදාල සියලුම ඉලක්ක සපුරා ගැනීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

පළාත් කාර්යාල
ජල සම්පත් මණ්ඩලය පළාත් කාර්යාල 4 කින් සමන්විත වේ. (අනුරාධපුර, පුත්තලම, යාපනය සහ මොණරාගල) ප්‍රාදේශීය කාර්යාල මඟින් එම පළාතට අයත් රජයේ සහ පෞද්ගලික ආයතන වල භූගත ජලය උකහා ගැනීම සම්බන්ධ කටයුතු සිදු කිරීම, ජල සංරක්ෂණ කටයුතු සහ භූගත ජලය සම්බන්ධව වාර්තා ලබාදීම. අනුරාධපුර, පුත්තලම සහ යාපනය කාර්යාල තුළ රසායනාගාර පවත්වාගෙන යන අතර ජල සාම්පල රසායනික, ක්ෂුද්‍රජීවී විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබන අතර බැරලෝහ විශ්ලේෂණ කටයුතු අනුරාධපුර පළාත් කාර්යාලයෙන් පමණක් සිදු කරනු ලබයි.

සංචාරක නිවාසය - අනුරාධපුරය

මණ්ඩලයේ නිලධාරී මහතුන්ගේ හා වෙනත් රාජ්‍ය ආයතන වල නිලධාරීන්ගේ රාජකාරී හා පුද්ගලික කටයුතු වලදී නවාතැන් ගැනීම සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශයේ මහත්ම මහත්මීන්ට සිය සංචාරක කටයුතු වලදී නැවතී විවේක ලබා ගැනීම සඳහාත් මෙම සංචාරක නිවාසය ප්‍රයෝජනයට ගැනේ.

ස්තූතිය

මණ්ඩලයේ කාර්ය ඉටු කිරීමේදී ඊට විශේෂ අනුග්‍රහය දැක්වූ ගරු ජල සම්පාදන අමාත්‍යතුමාට සහ ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් එම අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරීන්ටද රජයේ වෙනත් දෙපාර්තමේන්තු රාජ්‍ය සේවා මණ්ඩල හා විදේශීය ආයතන වල විවිධ නිලධාරීන්ට හා උපදේශකයින්ට සිය ස්තූතිය සටහන්කොට තැබීම මණ්ඩලයට සතුටකි. ජල සම්පත් මණ්ඩලයට පක්ෂපාතීව සිය සේවාවන් ඉටු කිරීම ගැන ජල සම්පත් මණ්ඩලයේ සේවක මණ්ඩලයටද කෘතඥතාවය හිමිවේ.

ආචාර්ය ජේ.ඩී.සමරසිංහ
සභාපති
ජල සම්පත් මණ්ඩලය



මූල්‍ය ප්‍රකාශන

ජල සම්පත් මණ්ඩලය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් 2022 වර්ෂය සඳහා	සටහන් අංක	නැවත ප්‍රකාශිත 2022 රු. 000	2021 රු. 000	2021 රු. 000	අයවැයගත 2022 රු. 000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම්	01	88,060	60,493	53,597	74,825
භාණ්ඩාගාර ප්‍රතිපාදන - පුනරාවර්තන		191,600	171,800	171,800	195,400
භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රාග්ධන - (මෙහෙයුම්)	02	6,904	6,594	6,594	8,300
වෙනත් ආදායම්	03	10,592	7,592	7,562	10,900
මුළු ආදායම		**297,156**	**246,479**	**239,553**	**289,425**
පරිපාලන වියදම්	4.1	(218,801)	(192,276)	(192,276)	(202,700)
සැපයුම් සහ අවශ්‍යතා	4.2	(42,019)	(20,506)	(20,506)	(27,200)
කොන්ත්‍රාත් ගත සේවා හා නඩත්තු වියදම්	4.3	(44,147)	(27,189)	(27,185)	(36,245)
වෙනත් මෙහෙයුම් වියදම්	4.4	(4,100)	(6,658)	(6,658)	(4,280)
වෙනත් ව්‍යාපෘති වියදම්	4.5	-	(1,374)	(1,374)	-
භාණ්ඩාගාර ප්‍රතිපාදන(ප්‍රාග්ධන පර්යේෂණ අධ්‍යයනයන්)	4.6	(6,904)	(6,594)	(6,594)	(8,300)
ක්ෂයවීම්		(8,691)	(8,870)	(8,870)	(9,000)
මුළු වියදම්		**(324,662)**	**(263,467)**	**(263,463)**	**(287,725)**
මෙහෙයුම් වලින් අතිරික්තය(ඌණතාවය)		**(27,506)**	**(16,988)**	**(23,910)**	**1,700**
බදු		-	-	-	(500)
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය(ඌණතාවය)		**(27,506)**	**(16,988)**	**(23,910)**	**1,200**

ජල සම්පත් මණ්ඩලය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනට	සටහන් අංක	2022 රු.000	නැවත ප්‍රකාශිත 2021 රු.000	2021 රු. 000
වත්කම්				
ජංගම වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	05	74,350	93,988	93,988
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	06	36,224	40,044	39,859
තොග	07	131,946	132,209	132,209
ඉදිරියට කල ගෙවීම්	08	225	4,496	4,496
		242,745	**270,737**	**270,552**
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	09	1,824,502	369,225	369,225
		1,824,502	369,225	369,225
මුළු වත්කම්		**2,067,247**	**639,962**	**639,777**
වගකීම්				
ජංගම වගකීම්				
වෙනත් වෙන්කිරීම් හා ගෙවිය යුතු දෑ	10	11,605	21,167	21,027
විලම්භිත ආදායම් (සේවා අත්තිකාරම්)	11	16,847	22,935	29,812
		28,452	**44,102**	**50,839**
ජංගම නොවන වගකීම්				
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	12	60,783	61,205	59,089
විලම්බිත ආදායම් (රජයේ ප්‍රදාන සඳහා)	13	1,796,809	334,244	334,244
		1,857,592	**395,449**	**393,333**
මුළු වගකීම්		**1,886,044**	**439,551**	**444,172**
ශුද්ධ වත්කම්		**181,203**	**200,411**	**195,605**
ශුද්ධ වත්කම් /ස්කන්ධය				
ප්‍රාග්ධන හා සංචිත				
සමුච්චිත අරමුදල	14	489,891	489,891	489,891
සමුච්චිත ලාභ/ (අලාභ)	14	(328,188)	(308,980)	(313,786)
ප්‍රත්‍යාගණන සංචිතය	14	19,500	19,500	19,500
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		**181,203**	**200,411**	**195,605**

මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සමස්ත පරිපූරණය සඳහා අවශ්‍ය වන ගිණුම්කරණ ප්‍රමිතීන් හා සටහන් පිටු අංක 06 සිට 20 තෙක් ඇතුලත් වේ.

මණ්ඩලයේ පවත්නා වාර්තාවලට අනුව ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා නිවැරදි බවට මා විසින් සහතික කරමි.

අත්සන් කළේ. සී.අබේසූරිය
වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

කේ.ජී.ඩී.ප්‍රියංකා
වැඩ බලන සාමාන්‍යාධිකාරී

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකීම පැවරේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කලෙමි.

අත්සන් කළේ- ආචාර්ය ජේ.ඩී. සමරසිංහ
සභාපති
2023.03.03

එල්.ඒ.වයි.දර්ශනී ද සිල්වා
භාණ්ඩාගාර නියෝජිත

එච්.එම්.ආර්.කිරිඇල්ල
අධ්‍යක්ෂ මණ්ඩලය

ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
2022 දෙසැම්බර් 31 දිනට

සටහන් : 14

	සමුච්චිත අරමුදල	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්චිත ලාභ/අලාභ	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000
2021 වර්ෂය				
2020 දෙසැම්බර් 31 දිනට ඉ/ගෙ ශේෂය	**489,891**	**19,500**	**(300,819)**	**208,572**
පෙර කාලපරිච්ඡේද වල සිදුවීම් සඳහා කරන ලද ගැලපීම්	-	-	-	-
නැවත ප්‍රකාශිත ශේෂය	489,891	19,500	(300,819)	208,572
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)	-	-	(23,910)	(23,910)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මතවූ ලාභය/අලාභය	-	-	10,943	10,943
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**489,891**	**19,500**	**(313,786)**	**195,605**
2021 වර්ෂය (නැවත ප්‍රකාශිත)				
2021 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය	**489,891**	**19,500**	**(300,819)**	**208,572**
පෙර කාලපරිච්ඡේද වල සිදුවීම් සඳහා කරන ලද ගැලපීම්	-	-	(2,116)	**(2,116)**
නැවත ප්‍රකාෂිත ශේෂය	489,891	19,500	(302,935)	206,456
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)	-	-	(16,988)	(16,988)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත වූ ලාභය/(අලාභය)	-	-	10,943	10,943
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**489,891**	**19,500**	**(308,980)**	**200,411**
2022 වර්ෂය				
2021 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය	**489,891**	**19,500**	**(308,980)**	**200,411**
පෙර කාලපරිච්ඡේද වල සිදුවීම් සඳහා කරන ලද ගැලපීම්	-	-	-	-
නැවත ප්‍රකාෂිත ශේෂය	489,891	19,500	(308,980)	200,411
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)	-	-	(27,506)	(27,506)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත වූ ලාභය/(අලාභය)	-	-	8,298	8,298
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**489,891**	**19,500**	**(328,188)**	**181,203**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2022 දෙසැම්බර් 31

		නැවත ප්‍රකාශිත	
	2022	2021	2021
	රු.000	රු.000	රු.000
මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය			
භාණ්ඩාගාර ප්‍රතිපාදන (පුනරාවර්ථන) වලට පෙර වර්ෂයේ ලාභය/(අලාභය)	(219,106)	(195,710)	(195,710)
එකතු කළා භාණ්ඩාගාර ප්‍රතිපාදන - (ප්‍රත්‍යාවර්ථන) ලැබීම්	191,600	171,800	171,800
වර්ෂය සඳහා බදු පෙර ලාභය / (අලාභය)	**(27,506)**	**(23,910)**	**(23,910)**
කෙරීගෙන යන වැඩ ගැලපීම්			-
අඩුකලා - පෙර වසරේ ගැලපීම්	-	(864)	(864)
	(27,506)	**(24,774)**	**(24,774)**
මූල්‍ය නොවන සංචලනයන්			
ක්ෂයවීම්	8,691	8,870	8,870
පාරිතෝෂිත වෙන් කිරීම වැඩි කිරීම.	11,201	9,942	9,942
ගෙවිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම)	(17,433)	4,673	4,673
වෙනත් ජංගමවත්කම් වැඩිවීම / (අඩුවීම)	4,534	(3,852)	(3,852)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය / (පාඩුව)	(638)	(20)	(20)
ලැබිය යුතු දෑ වැඩි වීම / (අඩුවීම)	3,819	(5,190)	(5,190)
	(17,332)	**(10,351)**	**(10,351)**
පාරිතෝෂිත ඉතිරිකිරීම් වලින් ලද පොලි ලැබීම්	(7,046)	(3,178)	(3,178)
බදු ගෙවීම	-	-	-
මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(24,378)**	**(13,529)**	**(13,529)**
ආයෝජන කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල	637	-	-
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	(1,896)	(2,489)	(2,489)
පාරිතෝෂිත ඉතිරි කිරීම් වලින් ලද පොලිය	7,046	3,178	3,178
පාරිතෝෂිත ගෙවීම්	(1,541)	(11,428)	(11,428)
ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**4,246**	**(10,739)**	**(10,739)**
මූල්‍යන කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය			
රජයේ ප්‍රදාන (දේපල පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධනය)	494	1,579	1,579
මූල්‍යන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**494**	**1,579**	**1,579**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**(19,638)**	**(22,689)**	**(22,689)**
වර්ෂයේ මුල මුදල් හා මුදල් සමාන දෑ	**93,988**	**116,677**	**116,677**
වර්ෂයේ අග මුදල් හා මුදල් සමාන දෑ	**74,350**	**93,988**	**93,988**

◆ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්

01 මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් හා බැංකු වල පවත්නා ශේෂයන්ගෙනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි අඩංගු වන මුදල් හා මුදල් සමාන දෑ සඳහා ඇතුලත්ව ඇති මූල්‍ය තත්ව ප්‍රමාණය පහත දැක්වේ.

		නැවත ප්‍රකාශිත	
	2022	2021	2021
	රු.000	රු.000	රු.000
බැංකු වල ඇති ජංගම ගිණුම් ශේෂයන්	**56,299**	**82,575**	**82,575**
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීම්	**18,051**	**11,413**	**11,413**
	74,350	**93,988**	**93,988**

02 මෙහෙයුම් කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන (ප්‍රාග්ධන) වලින් වූ මුදල් ප්‍රවාහය අන්තර්ගත වී ඇත්තේ මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය තුළයි

භාණ්ඩාගාර ප්‍රතිපාදන නිදහස් කිරීම් සැසඳුම - 2022 වසර

හෙලිදරව් කිරීමේ ප්‍රකාෂය

	මුදා හැරීම්	භාණ්ඩාගාර මුද්‍රණ පිටපතට අනුව	වර්ෂය සඳහා වෙන් කිරීම්
	(රු.000')	(රු.000')	(රු.000')
01 පුනරාවර්ථන වැය ප්‍රතිපාදන			
වැයශීර්ෂ අංක : 166-01-02-4-1503			
මූල්‍ය කාර්යය සාධනය	183,100	183,100	184,000
වැයශීර්ෂ අංක: 166-01-02-4-1509			
මූල්‍ය කාර්යය සාධනය	8,500	8,500	11,400
	191,600	**191,600**	**195,400**
02 ප්‍රාග්ධන වැය ප්‍රතිපාදන			
වැයශීර්ෂ අංක: 166-01-02-4-2201			
මූල්‍ය කාර්යය සාධනය - මෙහෙයුම්	6,904	7,400	20,000
මූල්‍ය තත්වය වෙනස් වීමේ ප්‍රකාශනය	496	-	-
(වත්කම් මිලදී ගැනීම සඳහා)	**7,400**	**7,400**	**20,000**

මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අදාල සටහන්

1. සංස්ථාපිත තොරතුරු

සාමාන්‍ය

ජල සම්පත් මණ්ඩලය 1964 අංක 29 දරණ පනතේ විධිවිධාන යටතේ 1966 දී පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. 2022 වසරේ සිට ජල සම්පාදන අමාත්‍යාංශයේ යටතේ පවතී.

ප්‍රධාන ක්‍රියාකාරම් සහ මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුලදී මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වලට භූ ජල සමීක්ෂණ සිදු කිරීම, නළ ළිං ඉදි කිරීම, ජල නියැදිවල රසායනික විශ්ලේෂණය, නළ ළිං පිරිසිදු කිරීම සහ භූගත ජල සිතියම් සැකසීම ආදිය ඇතුලත් විය.

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳේ.

මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යාලයේ ලිපිනය

2022 ජනවාරි 01 සිට 2022 ජුලි 31 දක්වා නො. 288/12 විල්, රෝයල් ගාඩ්න්ස්, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය

2022 අගෝස්තු 01 සිට මේ දක්වා නො. 488/ඒ, නාවල පාර, රාජගිරිය

2. වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1. අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත කමිටුව හා මුදල් අමාත්‍යාංශයේද එකඟතාවය මත නිකුත් කරන ලද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. (යොමුව : 2013.10.02 දිනැති අංක PED/03/2013 දරණ චක්‍රලේඛණය)

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 04,05,13,16,17,18 හා 20 යන ගිණුම්කරණ ප්‍රමිත වර්තමානයේදි මණ්ඩලයට අදාල නොවේ.

2.2. සකස් කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.3. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය මණ්ඩලයේ කටයුතු කරන මුදල් වර්ගය වන අතර සියලු මූල්‍ය තොරතුරු විශේෂයෙන් සඳහන් කර නොමැති නම් හැරෙන්නට ආසන්න දහස් ගණනට ඉදිරිපත් කර ඇත

3. වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

3.1 දේපළ , පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ මුල් වරට පිරිවැයට ගණන් ගෙන ඇති අතර සමුච්චිත ක්ෂය අඩුකල අගය වාර්තා කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැය යනු මිලදීගැනීම් / ප්‍රත්‍යාගණන අගය හෝ ඉදිකිරීම සඳහා වැය වන වියදම හා බැදුණු මූලික වියදම් ද සමඟ වේ.

ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණන අගය අනුව ඉදිරියට ගෙනයනු ලබන අතර පසුකාලීන ක්ෂයවීම් අඩුකරනු ලැබේ.

ගොඩනැගිලි - බදු පදනම මත ඉඩම්

වසර 30ක බදු පදනම මත ලබාගත් ඉඩම් වල ප්‍රදාන ලෙස හෝ ස්වකීය අරමුදල් භාවිතා කර ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි/ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර ඇත.

3.2 ප්‍රත්‍යාගණනය

මණ්ඩලය විසින් නිදහස් ඉඩම් මූලික අගය කිරීම සඳහා ප්‍රත්‍යාගණනය ක්‍රමය යොදාගනු ලබයි. අනෙකුත් වත්කම්, ශුද්ධ වත්කම් අගය බින්දුව හෝ සාධාරණ අගය හා රැගෙනයාමේ අගය අතර සාධනීය වෙනසක් පවතින විට ප්‍රත්‍යාගණනය කරනු

ලබයි. වත්කම් බැහැර කරන විට වත්කමට අදාල ප්‍රත්‍යාගණන සංචිතය රඳවාගත් ලාභයට මාරු කරනු ලබයි.

3.3 ක්ෂයවීම්

වත්කම් භාවිතයට ගැනීම සූදානම් වන අවස්ථාවේදී ක්ෂය කරනු ලබන අතර භාවිතයෙන් ඉවත් කරන වත්කම් එසේ හඳුනාගන්නා දිනයේදී ක්ෂයවීම් නතර කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ වල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ ඒවායේ පිරිවැය/ප්‍රත්‍ය ගණන අගය ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගෙන සරල මාර්ග ක්‍රමයටයි. මෙම අරමුණ ඇතිව යොදා ගනු ලබන ප්‍රධාන වාර්ෂික ක්ෂය අනුපාත මෙසේය.

ගොඩනැගිලි	5%
මෝටර් වාහන	25%
යන්ත්‍රෝපකරණ	20%
රසායනාගාර උපකරණ	20%
විද්‍යාත්මක උපකරණ	20%
පරිෂණක සහ උපාංග	20%
ගෘහභාණ්ඩ සවිකිරීම් හා කාර්යාල උපකරණ	10%

3.4 රජයේ ප්‍රදාන

භාණ්ඩාගාරයෙන්, රේඛීය අමාත්‍යාංශයෙන් සහ වෙනත් අදාල රාජ්‍ය, ව්‍යාපෘති වලින් ලබා ගන්නා ලද වත්කම් ආදායම් ප්‍රවේශය යටතේ හඳුනාගනු ලැබේ. වත්කම් වල ජීවිත කාලය අනුව ක්‍රමානුකූල පදනමක් මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය තුල ක්ෂය කිරීමේ ගිණුමට හිලව් වල පරිදි විලම්බිත ආදායම (රජයේ ප්‍රධාන වලට සම්බන්ධ) කපාහැරේ.

3.5 ඉතිරි තොග

වාහන අමතර කොටස්, ගබඩා ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ අමතර කොටස්, ඉන්ධන සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය, යනාදියෙන් ඉතිරි තොග සමන්විත වේ. තොග පිරිවැය සමන්විත වන්නේ පළමුව ලබාගත් තොග පළමුව නිකුත්කිරීමේ (FIFO) පදනම මතය.

3.6 ලැබිය යුතු දෑ

3.6.1 උපලබ්ධි විය හැකි බවට ඇස්තමේන්තුගත කරන ලද ප්‍රමාණයන්ගෙන් ලැබිය යුතු දෑ ප්‍රකාශ වේ.

3.6.2 බොල්ණය හා අඩමාණ ණය

මෙම ණය සඳහා ඇස්තමේන්තු කල අලාභ පදනම් වී ඇත්තේ සියලු ඉන්වොයිසි වල සහ ගෙවීම් පිළිබඳ සිදුකල අබණ්ඩ ඇගයීම් ක්‍රමය පදනම් කරගෙනය.

4. ගෙවිය යුතු දෑ සහ උපචිත වියදම්

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ පිරිවැයට ඉදිරිපත් කෙරේ.

4.1 විලම්බිත ආදායම

සේවා ලබා ගැනීම සඳහා ලද අත්තිකාරම්, ආදායම් ලෙස හඳුනාගන්නා තෙක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ කලින් ලද ආදායම් ලෙස දැක්වේ.

4.2 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්ථමානයේ පවත්නා බැඳීම් (නෛතික හෝ සම්මුතික) වෙනුවෙන් විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කල හැකි වීම මත ප්‍රසතිපාදන හඳුනාගනු ලැබේ. වියදම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රතිපාදනයන් ප්‍රතිපූර්ණය කිරීම මූල්‍ය කාර්ය සාධනයෙන් ඉදිරිපත් කෙරේ.

5. ආදායම් හඳුනාගැනීම

ආදායම් හඳුනාගනු ලබන්නේ ආර්ථික ප්‍රතිලාභ ජල සම්පත් මණ්ඩලයට ගලා එනු ලැබීමේ හැකියාව ඇති වීම සහ ඒවා විශ්වාසනීය ලෙස මැනිය හැකි වීම මත මිස ගෙවීම් සිදුකල විට නොවේ.

ප්‍රධාන ආදායම් මාර්ග

භූ විද්‍යාත්මක සමීක්ෂණ, නළ ළිං ඉදිකිරීම, අත් පොම්ප සවි කිරීම, පොම්ප පරීක්ෂණ, නළ ළිං පිරිසිදු කිරීම, නළ ළිං විශ්ලේෂණය සහ ජලයේ අඩංගු යකඩ නිශ්සාරණ පෙරණ සවිකිරීම ආදියෙන් වන

අතර අදාල කාර්යයන් ඉටු කිරීමෙන් පසු ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

වෙනත් ආදායම්

සංචාරක බංගලා වෙන්කිරීම්, දඩ, අධිභාර, යෝග්‍යතා සහතික ආදායම් හා විවිධ ආදායම් වලින් වෙනත් ආදායම් සමන්විත වන අතර ඒවා උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

පොලී ආදායම්

පොලී ආදායම් මූලික වශයෙන් ආපදා ණය සඳහා පොළිය, පාරිතෝෂික ගෙවීම් සඳහා ඉතිරි කිරීම් වල පොළිය හා බැංකුවේ තැන්පතු සඳහා පොළිය යනාදියෙන් සමන්විත වේ.

6. විශ්‍රාමික පාරිතෝෂික බැඳීම

6.1 පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම

1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව ජල සම්පත් මණ්ඩලය විසින් පාරිතෝෂික ගෙවීම් සිදු කල යුතුව ඇත. මේ සඳහා වූ වගකීම මූල්‍ය ප්‍රකාශන තුල අර්ථ ගැන්වූ ප්‍රතිලාභ සැලැස්ම ලෙස පාරිතෝෂික වගකීමේ වර්ථමාන අගය සේවකයන් අනුව වාර්තා කරන දිනට හඳුනාගනු ලබයි. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත ඔස්සේ අනුමත කර ඇති පරිදි අර්ථ ගැන්වූ ප්‍රතිලාභ වගකීම, සුදුසුකම්ලත් ආයුගණකවරයෙකු වන Actuarial & Management Consultants (Pvt) Ltd විසින් වාර්තා කරන දිනට පුරෝකථන ඒකක ක්‍රමය මඟින් ගණනය කරනු ලබයි. මෙම ආයුගණක තක්සේරු කිරීම සෑම වර්ෂයකම ක්‍රියාත්මක කරනු ලබයි. සේවකයා සේවයට බැදුණු දින සිට මෙම පාරිතෝෂික වගකීම හටගනී.

ජල සම්පත් මණ්ඩලය විසින් පාරිතෝෂික වගකීම ආයුගණක තක්සේරු ක්‍රමයට අනුකූලව පාරිතෝෂික වගකීමෙහි වර්ථමාන අගය මනිනු ලබයි. රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 19 සේවක ප්‍රතිලාභ 01.01.2018 දින සිට බල පැවැත්වේ.

සැලසුම් වත්කම්

බාහිර වශයෙන් මූල්‍ය සපයා නොමැති වගකීමකි. ජල සම්පත් මණ්ඩලය විසින් වෙනමම ජාතික ඉතිරි කිරීමේ ගිණුමක් මෙම පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබයි.

6.2 සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් දායක සැලසුම

සේ.අ.අරමුදල් හා සේ.නි.භා අරමුදලේ දායක මුදල් අදාල ප්‍රඥප්ති සහ රෙගුලාසි වලට අනුකූල වන සේවකයන් සුදුසුකම් ලබයි. සේ.අ.අරමුදල් හා සේ.නි.භා අරමුදල් සඳහා මණ්ඩලයේ දායකත්වය පිළිවෙලින් 12% ක සහ 3% ක් වේ.

7. බදුකරණය

බදු වියදම, ප්‍රවර්තන සහ පෙර වර්ෂ සඳහා වන ගැලපීම් වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල් වලින් සමන්විත වේ

8. පර්යේෂණ අධ්‍යයන වියදම

භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රවර්ධන වැය ශීර්ෂ යටතේ පර්යේෂණ අධ්‍යයන සඳහා සෘජුව හඳුනාගෙන ඇති මෙහෙයුම් පිරිවැය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙන් ඉදිරිපත් කෙරේ.

9. රු. 1,526,335/- ක් වූ අධ්‍යක්ෂ චේතන වටිනාකම සටහන් අංක 4.1 වැටුප් හා චේතන වියදම් ගිණුමෙහි ඇතුළත් වේ.

10. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ට අනුව වක්‍ර ක්‍රමය උපයෝගී කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත. මෙහෙයුම් කටයුතු වලින්, ආයෝජන කටයුතු වලින් හා මූල්‍ය කටයුතු වලින් ලද දළ මුදල් ගලාඒම් සහ ලැබීම් හා ගෙවීම් භාවිතයන් එහි හඳුනාගෙන ඇති අතර මුදල් හා මුදල් සමාන දෑ ප්‍රධාන වශයෙන් බැංකුවේ පවතින ශේෂයන්ගෙන් සමන්විත වේ.

11. වාර්තාකරන දිනෙන් පසු සිදුවීම

වාර්තා කරන දිනෙන් පසු හඳුනාගනු ලබන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් අදාල පරිදි මූල්‍ය ප්‍රකාශන වල ගැලපිම් කිරීමත් අනාවරණය කිරීමත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අදාල සටහන්

12. විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති.

භූගත ජල නිරීක්ෂණ ජාලයක් පිහිටුවීම - මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණි සඳහා නියමු ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් මල්වතු ඔය, මාදුරුඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණි ආවරණය වන අතර, පුත්තලම සහ යාපනය අර්ධද්වීපය යන නව නියමු ප්‍රදේශ වෙත ද ව්‍යාප්ත වේ. මෙහිදී භූගත ජල මට්ටම, විද්‍යුත් සන්නායකතාවය සහ උෂ්ණත්වය ස්වයංක්‍රීයව මැන බැලීමේ භූගත ජල නිරීක්ෂණ පද්ධති ස්ථාන 190 ක ස්ථාපිත කෙරේ. මීට අමතරව, භූගත ජලයෙහි බැර ලෝහ සාන්ද්‍රණය වරින් වර තක්සේරු කරනු ලැබේ.

ශ්‍රී ලංකාව සඳහා ජාතික භූගත ජල නිරීක්ෂණ ජාලයක් පිහිටුවීම සඳහා මූලික පියවරක් ලෙස (අ) භූගත ජල මට්ටම (ආ) ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ තත්යම කාලීන දත්ත රැස් කිරීම ක්‍රියාත්මක කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. එමෙන්ම මධ්‍යගත දත්ත කළමනාකරණ මධ්‍ය ස්ථානයක් කොළඹ පිහිටුවීමට නියමිතය. මීට අමතරව, භූගත ජල සම්පත් භාවිතය සහ ආරක්ෂා කිරීම පිළිබඳ ආකල්ප වෙනස් කිරීම සඳහා බිම් මට්ටමේ ප්‍රජාව දැනුවත් කිරීම සිදු කෙරේ.

මෙම නියමු ව්‍යාපෘතියේ මුළු පිරිවැය යුරෝ මිලියන 20.63ක් වන අතර එය නෙදර්ලන්තයේ රබෝ බැංකුව (Rabo Bank) විසින් මෘදු ණයක් ලෙස අරමුදල් සපයන ලදී. ව්‍යාපෘති කටයුතු 2018 වසරේදී ආරම්භ කර 2022 දෙසැම්බර් මාසයේදී නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ නෙදර්ලන්තයේ “Royal Eijkelcamp” කොන්ත්ත්‍රාත්කරු විසින් “Turn-key” ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලද අතර එහිදී අමාත්‍යාංශය සහ කොන්ත්‍රාත්කරු නෙදර්ලන්තයේ “Royal Eijkelkamp” අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන ලදී. කාර්තුමය වශයෙන් වැඩ සැලැස්මට අනුව සාර්ථකව නිම කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ගෙවීම් නිර්දේශ කරනු ලැබීය. ව්‍යාපෘති ප්‍රගතියට අනුව ගෙවීම් 2022 දෙසැම්බර් මාසයේදී අවසන් කර ඇත. ව්‍යාපෘති මෙහෙයුම් කාලය තුළ (2018-2022) භාවිතා කරන ලද ස්ථාවර වත්කම් සහ පරිභෝජන භාණ්ඩ සහ සංවර්ධන කටයුතු වසර අවසානයේ ජල සම්පත් මණ්ඩලයට ඉදිරිපත් කළේ නැත.

ගංගා ද්‍රෝණි තුන තුළ අධීක්ෂණ විභවයක් සහිත ස්ථාන හඳුනා ගැනීම අවසන් කරන ලදී.

මේ වන විට මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ද්‍රෝණිවල අදාල අධීක්ෂණ ළිං ඉදිකිරීම් අවසන් කර ඇත. මීට අමතරව පුත්තලම ප්‍රදේශයේ ළිං කැණීමේ කටයුතු ද සිදුවෙමින් පවතී. යාපනය අර්ධද්වීපයේ ප.ස.ම. විසින් දැනටමත් ඉදිකර ඇති දැනට පවතින අධීක්ෂණ ළිං ස්වයංක්‍රීය අධීක්ෂණ ළිඳක් (40ක්) ලෙස සංවර්ධනය කිරීමට යොදා ගෙන ඇත. මල්වතු ඔය, මාදුරු ඔය සහ කුඹුක්කන් ඔය ගංගා ද්‍රෝණිවල ස්වයංක්‍රීය සංවේදක පද්ධති 121ක් සවිකිරීම අවසන් කර ඇත. ඉතිරි නිරීක්ෂණ පද්ධති සහ මධ්‍යගත දත්ත මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම 2022 දෙසැම්බර් වන විට අවසන් කිරීමට නියමිතය.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම

		නැවත ප්‍රකාශිත		අයවැයගත
	2022	2021	2021	2022
සටහන් අංක : 01	**රු.000**	**රු.000**	**රු.000**	**රු.000**
භූ ජල සමීක්ෂණ /භූගත ජල ගවේෂණය				
භූ ජල සමීක්ෂණ	16,077	15,398	13,958	17,000
නල ළිං ඉදිකිරීම	36,308	19,859	15,831	30,000
ජල ධාරිතා පරීක්ෂණ	26,146	13,036	12,277	17,500
නල ළිං පිරිසිදු කිරීම	1,091	249	198	500
ජල නියැදි විශ්ලේෂණය	4,284	2,171	1,712	3,600
අත් පොම්ප සවිකිරීම්	-	109	-	-
උප එකතුව	**83,906**	**50,822**	**43,976**	**68,600**
භූගත ජල නියාමනයන් ක්‍රියාත්මක කිරීම.				
විදුම් යන්ත්‍ර ලියාපදිංචිය	3,218	5,610	5,560	4,500
බාහිර භූ විද්‍යාඥ ලියාපදිංචිය	329	455	455	375
භූජල විද්‍යා වාර්තා ආදායම	574	684	684	800
ජල මාපක ස්ථාපිත කිරීමේ ආදායම	33	54	54	300
බාහිර විදුම් පුහුණුවීම්	-	-	-	250
උප එකතුව	**4,154**	**6,803**	**6,753**	**6,225**
භූජල සංවර්ධනය				
භූජල අධ්‍යයනය - යාපනය අර්ධද්වීපය	-	1,235	1,235	-
භූජල නියාමන ව්‍යාපෘතිය - මල්වතු ඔය	-	58	58	-
භූජල නියාමන ව්‍යාපෘතිය - යාන් ඔය	-	66	66	-
මල්වතු ඔය ගං ඉවුරේ භූගත ජල කළමනාකරණය	-	1,509	1,509	-
උප එකතුව	**-**	**2,868**	**2,868**	**-**
මුළු එකතුව	**88,060**	**60,493**	**53,597**	**74,825**
සටහන් අංක : 02				
භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන				
(පර්යේෂණ අධ්‍යයනයන් - මෙහෙයුම්)				
සංවේදී භූවිෂමතා පිළිබඳ වූ භූ ජල අධීක්ෂණය	3,000	3,000	3,000	3,000
කාලගුණ විපර්යාසයේ සෘජු හා වක්‍ර බලපෑම පිළිබඳව අධ්‍යයනය	322	1,093	1,093	700
භූජල ජල සම්පත් ක්ෂයවීම හා දූෂණය පිළිබඳ පරීක්ෂාව	254	236	236	200
විද්‍යාත්මක සහ අනෙකුත් ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම	378	1,191	1,191	1,000
ස්වාභාවික ජල උල්පත් පර්යේෂණ අධ්‍යයනය - මාඔය	839	355	355	1,100
වෙනත් වැඩිදියුණු කිරීම් හා පුනරුත්ථාපන කටයුතු	1,313	579	579	1,500
භූගත ජල සම්පත් සිතියම් ගත කිරීම.	62	-	-	100
ආපදාගත තත්වයන්හිදී භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම	347	-	-	300
සේවක පුහුණුවීම්	389	140	140	400
මුළු එකතුව	**6,904**	**6,594**	**6,594**	**8,300**
සටහන් අංක : 03				
වෙනත් ආදායම්				
සංචාරක නිවාස ආදායම	190	68	68	100
දඩ මුදල් හා අධිභාර	302	3,322	3,322	400
වත්කම් අපහරණය කිරීමේ ආදායම	73	21	21	2,000
ණය හා බැංකු තැන්පතු මත පොලී ආදායම	7,045	3,178	3,178	5,500
සේවක නේවාසික කුළී ආදායම	89	90	90	100
දත්ත සැපයීම	1,764	-	-	1,800
විවිධ ආදායම්	1,129	913	883	1,000
මුළු එකතුව	**10,592**	**7,592**	**7,562**	**10,900**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

	නැවත ප්‍රකාශිත		අයවැයගත
	2022	2021	2021	2022
	රු.000	රු.000	රු.000	රු.000
සටහන් අංක : 4.1				
පරිපාලන වියදම්				
වැටුප් හා වේතන	172,623	148,170	148,170	158,500
සේවක අර්ථසාධක අරමුදලට ගෙවීම (12%+3%)	20,826	19,970	19,970	21,200
සේවක ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය (පාරිතෝෂිත)	11,201	9,942	9,942	10,000
අතිකාල හා නිවාඩු දින වැටුප්	6,633	9,468	9,468	7,500
අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු	227	205	205	400
වෙනත් දීමනා	113	145	145	150
ගමන් වියදම් - දේශීය	5,092	2,709	2,709	3,000
සුභසාධක වියදම් හා ක්‍රීඩා පහසුකම්	195	231	231	250
වෛද්‍යාධාර ගෙවීම්	752	712	712	800
සංග්‍රහ කිරීම්	1,035	558	558	800
විවේක නිවාඩු සඳහා ගෙවීම්	104	166	166	100
මුළු එකතුව	**218,801**	**192,276**	**192,276**	**202,700**
සටහන් අංක : 4.2				
සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය				
ඉන්ධන හා ලිහිසි තෙල්	28,688	13,307	13,307	15,000
විදුම් පාරිභෝජන ද්‍රව්‍ය	9,817	6,408	6,408	9,000
රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය හා වෙනත්	3,420	697	697	3,000
වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය	94	94	94	200
මුළු එකතුව	**42,019**	**20,506**	**20,506**	**27,200**
සටහන් අංක: 4.3				
ගිවිසුම්ගත සේවාවන් හා නඩත්තු වියදම්				
තැපැල් හා දුරකථන	1,906	1,757	1,757	1,900
විදුලිය	3,076	2,477	2,477	2,800
ගෙවල් කුලී, ගොඩනැගිලි කුලී හා බදු	17,186	9,369	9,369	16,000
වර්ජනම් හා බදු	747	634	634	700
මාර්ගස්ථ මුදල් රක්ෂණය	12	12	12	10
විගණන ගාස්තු	458	504	504	500
මුද්‍රණ	1,111	364	364	800
වැඩමුළු හා සම්මන්ත්‍රණ	194	77	77	150
ජල බිල්පත්	642	332	332	485
නවාතැන් පහසුකම්	333	238	238	500
උපදේශක ගාස්තු	968	613	613	900
විවිධ වියදම්	1,446	1,206	1,206	800
මෝටර් වාහන නඩත්තු වියදම්	5,705	2,775	2,911	3,500
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	5,227	3,297	3,157	3,500
කාර්යාල උපකරණ නඩත්තු වියදම්	4,007	2,095	2,095	2,500
ගොඩනැගිලි නඩත්තුව වියදම්	1,129	1,439	1,439	1,200
මුළු එකතුව	**44,147**	**27,189**	**27,185**	**36,245**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

	නැවත ප්‍රකාශිත		අයවැයගත
	2022	2021	2021	2022
	රු.000	රු.000	රු.000	රු.000
සටහන් අංක : 4.4				
වෙනත් මෙහෙයුම් වියදම්				
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	1,009	708	708	1,000
නිල ඇඳුම්	169	368	368	250
වාර ප්‍රකාශන හා පුවත්පත්	14	47	47	10
ප්‍රචාරණය	549	670	670	675
බැංකු ගාස්තු	151	118	118	130
වෛද්‍ය පරීක්ෂණ ගාස්තු	166	207	207	300
නීති වියදම්	239	67	67	150
මුද්දර බදු	282	75	75	225
වාහන සේවා කිරීම - රත්මලාන	45	74	74	50
කුලී ගාස්තු	41	5	5	10
දඩ හා අධිභාර	10	43	43	20
මෙහෙයුම් කල්බදු වාරික	1,425	4,276	4,276	1,430
දත්ත එකතු කිරීමේ වියදම්	-	-	-	30
මුළු එකතුව	**4,100**	**6,658**	**6,658**	**4,280**
සටහන් අංක: 4.5				
වෙනත් ව්‍යාපෘති වියදම්				
භූජල අධ්‍යයනය - යාපනය අර්ධද්වීපය	-	1,235	1,235	-
භූජල නියාමන ව්‍යාපෘතිය - මල්වතු ඔය	-	58	58	-
භූජල නියාමන ව්‍යාපෘතිය - යාන් ඔය	-	66	66	-
භූජල කළමනාකරණය - මල්වතු ඔය ඉවුර	-	15	15	-
මුළු එකතුව	**-**	**1,374**	**1,374**	**-**
සටහන් අංක : 4.6				
භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන				
(පර්යේෂණ අධ්‍යනයන් - මෙහෙයුම්)				
සංවේදී භූ විෂමතා පිළිබඳ වූ භූ ජල සමීක්ෂණය	3,000	3,000	3,000	3,000
කාලගුණ විපර්යාසයේ සෘජු හා වක්‍ර බලපෑම අධ්‍යනය	322	1,093	1,093	700
භූජල සම්පත් හායනය හා දූෂණය පිළිබඳ පරීක්ෂාව	254	236	236	200
විද්‍යාත්මක සහ අනෙකුත් ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම්	378	1,191	1,191	1,000
ස්වාභාවික උල්පත් පිළිබඳ පර්යේෂණ අධ්‍යනය - මාඔය	839	355	355	1,100
පුනරුත්ථාපනය හා වැඩිදියුණුකිරීම් සඳහා මුදාහැරීම්	1,313	579	579	1,500
භූගත ජල සම්පත් සිතියම් ගත කිරීම.	62	-	-	100
ආපදාගත තත්වයන්හිදී භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම	347	-	-	300
කාර්යය මණ්ඩල පුහුණුව	389	140	140	400
මුළු එකතුව	**6,904**	**6,594**	**6,594**	**8,300**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

		නැවත ප්‍රකාශිත	
	2022	2021	2021
	රු.000	රු.000	රු.000
සටහන් අංක : 05			
මුදල් හා මුදල් සමාන දෑ			
(1) ලංකා බැංකුව යෝක් වීදිය ශාඛාව (0002026295)	245	5,028	5,028
(2) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0002323267)	55,818	76,390	76,390
(3) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0002323268)	17	615	615
(4) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0005342839)	219	542	542
උප එකතුව	**56,299**	**82,575**	**82,575**
සේවක ප්‍රතිලාභ - වත්කම් සැලැස්ම			
(5) ජාතික ඉතිරි කිරීමේ බැංකුව බම්බලපිටිය ශාඛාව (100230211818)	18,051	11,413	11,413
මුළු එකතුව	**74,350**	**93,988**	**93,988**

සටහන - අරමුදල් කළමණාකරන ගිණුම

ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාවේ දැනට පවතින අංක 0002323267 දරණ ජංගම ගිණුම හා ඒකාබද්ධව අංක 83141035 දරණ අරමුදල් කළමනාකරණ ගිණුමක්, ජංගම ගිණුමේ පවතින මුදල් ශේෂය සඳහා පොලියක් ඉපයීමේ අරමුණින් 2018.09.07 දින ආරම්භ කරන ලදි. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක - 1203)

		නැවත ප්‍රකාශිත	
	2022	2021	2021
	රු.000	රු.000	රු.000
සටහන් අංක : 06			
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ			
සේවක			
(01) ආපදා ණය	23,869	22,410	22,410
(02) උත්සව අත්තිකාරම්	25	30	30
උප එකතුව	**23,894**	**22,440**	**22,440**
වෙනත්			
(03) වෙළඳ	5,027	10,460	10,462
(04) සැපයුම් අත්තිකාරම්	185	189	189
(05) ලැබිය යුතු රඳවා ගැනීම්	3,956	3,846	3,846
(06) ලැබිය යුතු චිකතු කල අඟය මත බදු (ආපසු ගෙවීම්)	1,263	1,263	1,263
(07) වෙනත් ලැබිය යුතු දෑ	1,899	1,846	1,659
උප එකතුව	**12,330**	**17,604**	**17,419**
ලැබිය යුතු දෑ මුළු එකතුව	**36,224**	**40,044**	**39,859**

		නැවත ප්‍රකාශිත	
	2022	2021	2021
	රු.000	රු.000	රු.000
සටහන් අංක : 07			
තොග			
ද්‍රව්‍ය හා අමතර කොටස්			
වාහන අමතර කොටස්	3,182	2,435	2,435
වාහන අමතර කොටස්(වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය)	1,964	1,992	1,992
ඉන්ධන හා ලිහිසි තෙල්	1,237	1,681	1,681
විදුම් පාරිභෝජන ද්‍රව්‍ය	28,114	26,538	26,538
ගොඩනැගිලි ද්‍රව්‍ය	783	723	723
ලිපිද්‍රව්‍ය	296	367	367
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (2 කේ. ආර් අමතර කොටස්)	56,319	56,211	56,211
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය)	35,942	37,110	37,110
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (අමාත්‍යාංශ)	2,208	2,411	2,411
රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය	1,901	2,741	2,741
මුළු එකතුව	**131,946**	**132,209**	**132,209**

සටහන් අංක : 08

ඉදිරියට කල ගෙවීම්

බලපත්‍ර සහ රක්ෂණ	183	24	24
මාර්ගස්ථ මුදල්	10	9	9
කාර්යාල උපකරණ නඩත්තු කිරීම	32	4,463	4,463
මුළු එකතුව	**225**	**4,496**	**4,496**

දේපළ, පිරියත උපකරණ

සටහන් අංක : 09

පිරිවැය	**01.01.2021 දිනට ශේෂය**	**එකතු කිරීම්**	**ඉවත් කිරීම් / ගැලපීම්**	**31.12.2021 දිනට ශේෂය**
	රු. 000	**රු. 000**	**රු. 000**	**රු. 000**
ඉඩම්	1,897	-	-	1,897
ගොඩනැගිලි	50,590	-	-	50,590
මෝටර් වාහන	130,500	40,947	-	171,447
යන්ත්‍රෝපකරණ	486,211	1,409,728	-	1,895,939
රසායනාගාර උපකරණ	90,271	189	-	90,460
ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	28,097	13,306	-	41,403
පරිගණක හා උපාංග	11,477	5,793	-	17,270
විද්‍යාත්මක උපකරණ	88,000	112,469	(3)	200,466
ගොඩනැගිලි (කෙරිගෙන යන වැඩ)	1,198	591	-	1,789
මුළු එකතුව	**888,241**	**1,583,023**	**(3)**	**2,471,261**

සටහන - 2023 වර්ෂයේදී ලැබුණු වසරකට වැඩි වෙළඳ ණයගැතියන්ගේ අරමුදල්

ක්ෂය කිරීම්	01.01.2022 දිනට ශේෂය රු.000	වර්ෂය තුළ එකතු කිරීම් රු.000	අපහරණය / ගැලපීම් රු.000	31.12.2022 දිනට ශේෂය රු.000
ගොඩනැගිලි	1,892	2,527	-	4,419
මෝටර් වාහන	32,603	32,603	-	65,206
යන්ත්‍රෝපකරණ	352,173	56,364	4	408,541
රසායනාගාර උපකරණ	49,126	14,443	-	63,569
ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	6,891	2,837	-	9,728
පරිගණක හා උපාංග	8,483	1,377	-	9,860
විද්‍යාත්මක උපකරණ	67,848	17,590	(2)	85,436
මුළු එකතුව	**519,016**	**127,741**	**2**	**646,759**
ශුද්ධ පොත් අගය	**369,225**			**1,824,502**

දේපළ, පිරියත උපකරණ
සටහන් අංක : 09

01 මූල්‍ය කාර්ය සාධනයෙහි ඇතුලත් ක්ෂයවීම් පහත සඳහන් පරිදි සිදුකර ඇත.

ක්ෂය කිරීම්	වර්ෂය සඳහා අයකිරීම් රු.000	වර්ෂය සඳහා විලම්භිත ආදායම රු.000	අනාවරණය කරන ලද රු.000
ගොඩනැගිලි	2,527	(2,215)	312
මෝටර් වාහන	32,603	(28,830)	3,773
යන්ත්‍රෝපකරණ	56,364	(56,177)	187
රසායනාගාර උපකරණ	14,443	(14,348)	95
ලීබඩු,සවිකිරීම් හා කාර්යාල උපකරණ	2,837	(1,255)	1,582
පරිඝණක හා උපාංග	1,377	(491)	886
විද්‍යාත්මක උපකරණ	17,590	(15,734)	1,856
මුළු එකතුව	**127,741**	**(119,050)**	**8,691**

02 වාර්ෂික බදු කුලී ගෙවීමේ පදනම මත බදු ගිවිසුමක් කොරකහවැව පුහුණු මධ්‍යස්ථානයේ ඉඩමට ඇත. (හෙක්ටයාර් 2.166)

03 වර්ෂ 30 ක කාලයක්සඳහා නාමික කුලී ගෙවීම් පදනම මත බත්තරමුල්ලේ පිහිටි පර්චස් 40.0 ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ඇත.

04 සංචාරක නිවාසය-අනුරාධපුර ඉඩම (හෙක්ටර් 0.0759) 1982 අංක දරණ ගැසට් නිවේදනය මඟින් අවුරුදු 30 ක කල්බදු ගිවිසුමකට 26.08.2016 පවරා දෙන ලදී. වාර්ෂික තක්සේරු නිවේදනය නොපැවතීම හේතුවෙන් වෙන්කිරීම් සිදුකර නැත.

05 යාපනය පළාත් කාර්යාලයේ පවත්වාගෙන යන ඉඩම වෙනුවෙන් වාර්ෂික කුලිය ලෙස රු. 50,000.00 ක් ගෙවනු ලැබේ. (2,500,000/- ඔ 2%) (0.0506 හෙක්ටයාර්)

06 ජල සම්පත් මණ්ඩලය විසින් භාවිතය සිදු කරන නමුත් නීතිමය අයිතිය නොමැති ඉඩම් හා ගොඩනැගිලි විස්තර 31.12.2022 දිනට පහත පරිදි වේ.

ඉඩම	**ගොඩනැගිලි (ආසන්න)**
රත්මලාන වැඩබිම	1.79378 හෙක්ටයාර
වව්නියාව වැඩබිම	0.1050 හෙක්ටයාර

07 වර්ෂය තුල වත්කම් මිලදී ගැනීම් /වත්කම් ප්‍රදාන/ප්‍රත්‍යාගණන ශුද්ධ අගය/සාධාරණ අගය ගැලපීම් සටහන් එකතුකිරීම් ලෙස සටහන් අංක 09 හි එකතුකිරීම් යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

		නැවත ප්‍රකාශිත	
	2022	2021	2021
	රු.000	රු.000	රු.000
සටහන් අංක : 10			
වෙනත් වෙන් කිරීම් හා ගෙවිය යුතු දෑ			
(1) විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	464	450	450
(2) උපචිත වියදම් (කරුණාකර පිටු අංක 21 බලන්න)	5,161	9,339	9,339
(4) වෙනත් ගෙවිය යුතු දෑ	5,942	11,378	11,238
(5) රඳවාගත් මුදල්	38	-	-
මුළු එකතුව	**11,605**	**21,167**	**21,027**

සටහන් අංක 11

විලම්භිත ආදායම

ජල මාපක අත්තිකාරම්	903	-	-
සේවා අත්තිකාරම්	15,920	22,896	29,773
සමීක්ෂණ වාර්තා අත්තිකාරම්	24	39	39
මුළු එකතුව	**16,847**	**22,935**	**29,812**

		නැවත ප්‍රකාශිත	
	2022	2021	2021
	රු.000	රු.000	රු.000
සටහන් : 12			
සේවක ප්‍රතිලාභ			
12.1 අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්			
වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට පහත සඳහන් පරිදි දායක මුදල් ගෙවීම් සිදු කර ඇත.			
සේවක අර්ථසාධක අරමුදල			
සේවයාගේ දායකත්වය - 12%	16,661	15,976	15,976
සේවකයාගේ දායකත්වය - 10%	13,884	13,313	13,313
		-	-
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල - 3%	4,165	3,994	3,994
12.2 අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්			
වර්ෂය ආරම්භය දැනට අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැදීම්	59,089	72,644	72,644
කාලපරිච්ඡේදය සඳහා පොලී පිරිවැය	6,795	5,812	5,812
ප්‍රවර්ථන සේවා පිරිවැය	4,406	4,130	4,130
පසුගිය සේවා පිරිවැය	2,116	2,116	-
ආයුගණක ලාභ/(අලාභ)	(8,298)	(10,943)	(10,943)
වර්ෂය තුල ප්‍රතිලාභ ගෙවීම්	(1,541)	(11,428)	(11,428)
ගෙවිය යුතු ප්‍රතිලාභ	(1,784)	(1,126)	(1,126)
	60,783	**61,205**	**59,089**

12.2.1 වර්ෂය තුළ ආදායම් ප්‍රකාශනයට හඳුනාගත් වියදම්

ප්‍රවර්ථන සේවා පිරිවැය	4,406	4,130	4,130
කාලපරිච්ඡේදය සඳහා පොලී පිරිවැය	6,795	5,812	5,812
	11,201	**12,915**	**9,942**
හිමිකම් ප්‍රකාශය (පිටු අංක 3 බලන්න)			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත වූ ආයුගණක ලාභ/(අලාභ)	**(8,298)**	**2,645**	**10,943**

12.2.2. වෘත්තීය ජීවගත තක්සේරු සමාගමක් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගමේ පුපාලනාදන් මහතා විසින් 2022.12.31 දිනට පරිතෝෂික වගකීම සඳහා තක්සේරුවක් සිදු කරන ලදී.

ජීවගත තක්සේරු කරු විසින් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම තක්සේරු කිරීමේදී පහත උපකල්පන සහ දත්ත භාවිතා කරන ලදී.

	2022	2021
වට්ටම් අනුපාතය	18.0%	11.5%
වැටුප් වර්ධක අනුපාතය	15.0%	9.5%
සේවක පිරිවැටුම් අනුපාතය	3.0%	3.0%

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම

12.2.3 පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම

අනාගත ආයුකාලය සඳහා වූ උපලේඛන සැලකිල්ලට ගැනීමේදී ලන්ඩන් හි තක්සේරුකාර ආයතනය විසින් නිකුත් කරන ලද අංක A/1967/70 දරණ වගු චක්‍රය අදාල කරගෙන ඇත

මෙහිදී පුද්ගල විශ්‍රාම වයස අවුරු 60 ක් ලෙස හා අවුරුදු 60 සම්පූර්ණ වන උපන් දිනය සාමාන්‍ය විශ්‍රාමික වයස ලෙස උපකල්පණය කෙරේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව සේවකයෙකුට පාරිතෝෂික සඳහා වන වගකීම පැන නගින්නේ අඛණ්ඩ සේවයෙන් වසර 5 ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

12.2.4 සංවේදීතා විශ්ලේෂණය

අනෙක් සියලු උපකල්පන නොවෙනස්ව පවතින විට විචල්‍යයන් 1% කින් වෙනස්වීම සේවක ප්‍රතිලාභ කෙරෙහි වන බලපෑම පහතින් දැක්වේ.

	2022		
	වැඩිවීම් +1% රු. 000		**අඩුවීම් -1% රු. 000**
වට්ටම් අනුපාතය	57,102		64,961
වැටුප් වර්ධක අනුපාතය	65,197		56,840

		නැවත ප්‍රකාශිත	
	2022	2021	2021
	රු.000	රු.000	රු.000
සටහන් අංක :13			
විලම්භිත ආදායම් (විස්තරාත්මක තොරතුරු සඳහා කරුණාකර පිටු අංක 20 බලන්න)	**1,796,809**	**334,244**	**334,244**

සටහන් අංක :14

ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සඳහා කරුණාකර පිටු අංක 3 බලන්න.

සටහන් අංක : 15

වෙනත් අනාවරණය

කැපවීම් සහ අවිනිශ්චිතභාවයන්

අවිනිශ්චිත වගකීම්

මණ්ඩලයට එරෙහිව නඩු

අංක 2ඒ , හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ - 07 හි පිහිටි ඉඩම සම්බන්ධයෙන් පවතින තොරතුරු අනුව තිබිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් ජල සම්පත් මණ්ඩලයට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනිවි යැයි සහතික කිරීමක් සිදු කල නොහැකි බැවින් ජල සම්පත් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙය අසම්භාව්‍ය බැරකමක් වශයෙන් හඳුනා නොගන්නා ලදී.

සටහන 13

විලම්භිත ආදායම

විස්තරය	01.01.2022 දිනට ශේෂය	වර්ෂය තුල එකතුකිරීම්	වර්ෂය සඳහා අය කිරීම්		31.12.2022 දිනට ශේෂය
			ක්ෂය වීම් රු	ප්‍රත්‍යාගනන ගැලපීම්/ ඉවත් කිරීම්	
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ඉඩම්	-	-	-	-	-
ගොඩනැගිලි	44,007	-	(2,215)	-	41,792
මොටර් වාහන	86,570	40,947	(28,830)	-	98,687
යන්ත්‍ර උපකරන	133,532	1,409,662	(56,177)	(4)	1,487,013
රසායනාගාර උපකරන	40,929	(1)	(14,348)	-	26,580
ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ	9,796	12,511	(1,255)	-	21,052
පරීෂණක හා උපාන්ග	1,023	5,537	(491)	-	6,069
විද්‍යාත්මක උපකරණ	18,273	112,468	(15,734)	(1)	115,007
ගොඩනැගිලි (කෙරීගෙන යන වැඩ)	114	495	-	-	609
මුළු එකතුව	**334,244**	**1,581,619**	**(119,050)**	**(5)**	**1,796,809**

දේපල පිරියත උපකරණ සඳහා වූ සාධරණ අගයෙහි බලපෑම

විස්තරය	2020 වර්ෂය	2018 වර්ෂය	2017 වර්ෂය	2016 වර්ෂය	
		අතිරික්තය	ඌනතාවය	අතිරික්තය	ඌනතාවය
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
මෝටර් වාහන	15,100	-	-	916	-
යන්ත්‍ර උපකරණ	-	-	-	-	5,317
රසායණාගාර උපකරණ	-	-	-	-	631
ලී බඩු සවි කිරීම්	-	3,228	-	-	-
පරිගණක හා උපාංග	-	-	-	256	-
විද්‍යාත්මක උපකරණ	-	-	242	-	-
මුළු එකතුව	15,100	3,228	242	1,172	5,948
බලපෑම	මූල්‍ය තත්වය	මූල්‍ය තත්වය	ආදායම් ප්‍රකාශනය	මූල්‍ය තත්වය	ආදායම් ප්‍රකාශනය



විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IWM/A/WRB/FA/2022 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 ඔක්තෝබර් 06 දින

සභාපති,
ජල සම්පත් මණ්ඩලය.

ජල සම්පත් මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ජල සම්පත් මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ කොළඹ 07, හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.12,772,000ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස නිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් නිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් විසින් 2019 වර්ෂයේදී ඉකාමුඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පසුව ඉඩමේ හුක්තිය පිළිබඳව සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් නිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී, නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු නොකර අවුරුදු 45 ක් පමණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රයෙන් ඉවත්ව 2021 ජූලි 18 දින සිට ප්‍රධාන කාර්යාලය නාවල කොස්වත්ත ප්‍රදේශයේ පෞද්ගලික කුලී ගොඩනැගිල්ලකට ගෙන ගොස් තිබුණි. එසේ වුවද අදාළ නඩුව අවසන්ව හෝ ප්‍රාදේශිය ලේකම් විසින් ඉවත් කරගෙන නොමැති බැවින් ඒ පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8 හි 100 ඡේදය ප්‍රකාරව මූල්‍ය වාර්තා වල හෙළිදරව් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදී රු.217,242,201ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබුණු යන්ත්‍ර උපකරණ, රසායනාගාර උපකරණ සහ පරිගණක යනාදී වත්කම් පන්තීන් 3 කට අදාළ අයිතම 537 ක ඵලදායී ජීවිත කාලය අවසන් වීම හේතුවෙන් පොත් අගය ශූන්‍ය වී තිබුණු අතර එම වත්කම් සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට නොගැනීම හේතුවෙන් ඒවා සමාලෝචිත වර්ෂය තුළ භාවිතා කර තිබුණද ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් නළ ළිං ඉදිකරන බාහිර ආයතන හා ඒවායේ භූ විද්‍යා යන්ත්‍ර සහ භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචිය 2018 වර්ෂයේ සිට සිදුකර තිබුණි. මීට අදාළව සමාලෝචිත වර්ෂයේ රු.3,218,000 ක හා රු.329,000 ක ආදායම් ගිණුම්ගත කර තිබුණි. ඒ පිළිබඳ පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(i) උක්ත පරිදි මණ්ඩලය භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කර තිබුණද ඒ සඳහා මණ්ඩලයට කිසිදු නෛතික ප්‍රතිපාදනයක් ලැබී නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10හි 14ඡේදයට පටහැනිව උක්ත ලියාපදිංචි කිරීමේ හා ලියාපදිංචි අලුත් කිරීමේ ආදායම් මුදල් පදනම් මත

හඳුනාගෙන නිබුණි. තවද ප්‍රමිතියේ 39(අ) ඡේදය ප්‍රකාර මෙම ආදායම් හඳුනාගැනීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොනිබුණි.

(iii) වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන උපචිත ඳදනම් මත ගිණුම් නැඹීම වෙනුවට මෙහෙයුම් ආදායම් වලට අදාළ ඉකුත් වර්ෂවල අගයන් පසු වර්ෂයේ නැවත ප්‍රකාශ කර අලාභයට ගැළපීම් සිදු කර නිබුණි. ඒ අනුව 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් රු. 12,593,000 ක් හා රු. 23,910,000 ක් වූ අලාභය පසු වර්ෂවල රු. 10,973,000 හා රු. 16,988,000 ක් වශයෙන් සියයට 12.9 කින් හා සියයට 28.9 කින් අඩු වී නිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නැවත ප්‍රකාශ කර නිබුණු ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අදායම් සඳහා වූ සංසන්දනාත්මක අගයන් රු.6,896,000ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 හි 54 ඡේදයේ(අ) සිට (ඇ) දක්වා වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොනිබුණි.

(ඇ) වාරිමාර්ග අමාත්‍යාංශ වැය විෂයය අංක 198-2-03-23-2507-17 යටතේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ යුරෝ 20,629,921ක් හෙවත් රු.5,521,329,000ක් පිරිවැයක් දරා ක්‍රියාත්මක කර නිබෙන භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනට අවසන් කර නිබුණි. ව්‍යාපෘතියට අදාළව කොන්ත්‍රාත්කරු විසින් මෙරටට ආනයනය කරන ලද යන්ත්‍ර උපකරණ, වාහන, අමතර කොටස්, මෙවලම් හා අමුද්‍රව්‍යවලින් රු.1,581,619,000ක් වටිනා ලිබඩු උපකරණ, යන්ත්‍ර, මෝටර් වාහන, විද්‍යාත්මක උපකරණ හා පරිසණක වැනි ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ලබා දී නිබුණි. භූවමාරු නොවන ගනුදෙනු ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 49 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුව නිබුණු උක්ත ජංගම නොවන වත්කම්වල වටිනාකම් විලම්බිත ආදායමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නිබුණි.

(ඳ) වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රු.5,521,329,000 ක් වැය කර ක්‍රියාත්මක වූ ඉහත (ඇ) ඡේදය යටතේ දැක්වෙන භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ මණ්ඩලය වෙත භාරදී නිබූ වත්කම්වලට අමතරව දරා නිබුණු රු.3,939,710,000 ක පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කරන අධිතාක්ෂණික උපකරණ සහිත නළලිං

190ක් අදාළ නඩත්තු උපකරණ සමඟ මණ්ඩලයට පවරා ගෙන මෙම නළලිං 190ගි වටිනාකම නිසිපරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂවල භාණ්ඩාගාර හා වෙනත් ප්‍රදානයන් යටතේ ලැබී නිබුණු රු.334,244,000 ක් වූ වත්කම් 2021 දෙසැම්බර් 31 දිනට විලම්බිත ආදායමක් ලෙස දක්වා නිබුණු අතර අදාළ වටිනාකම් ඉකුත් වර්ෂවල ආදායම් ලෙස හඳුනාගත යුතු වුවද එසේ නොකර තවදුරටත් විලම්බිත ආදායමක් ලෙස දක්වා නිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගත යුතු උක්ත වත්කම්වලට අදාළ ක්‍රමක්ෂය රු.119,050,000 ක් ක්‍රමක්ෂය ගිණුමට බැර කිරීම වෙනුවට ස්ථාවර වත්කම් ක්ෂය ගිණුමට බැර කර නිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි 34 ඡේදය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් එම තොරතුරු හෙළිදරව් කර හෝ සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකළ ගනුදෙනු සිදු නොවුණු බවට මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොනිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ

හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

ඇතැම් විගණන වාර්තාවලට අදාළව මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මා නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කිරීමේදී එහි සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්

කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවකිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2(අ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ නියෝග.	
(i) 02 නියෝගය	නළ ලිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 72ක් පමණක් මණ්ඩලයේ ලියාපදිංචි වී තිබුණු අතර ලියාපදිංචි වී නොමැති ආයතන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබුණි. තවද ඉහත නියෝගය පරිදි ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියලු නළ ලිංවල දත්තයන් ඇතුළත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් ලියාපදිංචි ආයතන 72 කින් උක්ත වාර්තාව ලබා දී තිබුණේ ආයතන 3 ක් පමණි.
(ii) 03 නියෝගය	ජලය බෝතල් කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් සෑම මාස 6කට වරක්ම එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂා කරවාගෙන අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආයතන 40 කින් සම්මාලෝචිත වර්ෂයේ අවසානය වන විට ඉහත වාර්තා ලබා දී තිබුණේ එක් ආයතනයක් පමණි.

8

	(iii) 06 නියෝගය	ස්වභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් අනුගමනය කළ යුතු නියමයන් ඇතුළත් 1 සිට 5 දක්වා නියෝග ප්‍රකාරව කටයුතු නොකරන සංවිධාන හෝ පුද්ගලයන්ට එරෙහිව 1999 අංක 42 දරන පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තීය ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කර නොනිබුණි.
(ආ)	1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 10 හා 11 වගන්ති	අරමුදල සඳහා සේවා දායකත්වය සියයට 12ක් හා සේවක දායකත්වය සියයට 8ක් විය යුතු අතර ඊට වැඩි අනුපාතයකට එකඟ විය හැක. එසේ වුවද, මණ්ඩලයේ සේවා දායකත්වය සියයට 12 ක් වීමේදී සේවකයන්ගෙන් සියයට 10 ක් අයකර ගෙවා නිබුණද ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයාවෙත දැනුම් දී නොනිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ	
	(i) 2.2.1	මණ්ඩලය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක නිශ්චය කර හෝ සංයුක්ත සැලැස්මක් සකස් කර හෝ ඒ අනුව මණ්ඩලය මෙහෙයවීමට කටයුතු කර හෝ නොනිබුණි.
	(ii) 2.2.2 (ආ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කියවා අධ්‍යනය කිරීම සඳහා මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීම, තීරණ ගැනීමට හා වගවීම තහවුරු කිරීමට අවශ්‍ය මනා විශ්වාසදායී කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගැනීම, විගණන කමිටු ඇතුළු අනෙකුත් උප කමිටුවල

		නිරණ කාලීනව පසු විපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම් හා සම්බන්ධිත පාර්ශවයන්ගේ අවශ්‍යතා ඉටුවන, මූල්‍ය හා මූල්‍ය නොවන උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් පරිශීලන හිතකාමී පරිදි ආයතනයේ වෙබ් පිටුව මඟින් හෙළිදරව් කිරීම් යන අවශ්‍යතා ඉටුවන පරිදි ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර නොනිබුණි.
(iii)	2.2.3	අවදානම් කළමනාකරණය හා ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතීන්ගේ ප්‍රමාණවත්භාවය හා සඵලදායී ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානයට ලක් වී නොනිබුණි.
(iv)	2.4	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලය සමඟ වූ සම්බන්ධතා පිළිබඳ මණ්ඩලයේ ලේකම් වෙත වාර්ෂික ප්‍රකාශයක් සිදුකර නොනිබුණු අතර මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ එක් එක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් අදාළ හෙළිදරව් කිරීම් ද සිදුකර නොනිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) **භූගත ජල විමංසන ජාලයක් (Ground Water Monitoring Network) ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය.**

ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා පද්ධතියක් ස්ථාපනය කිරීමට, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය,පොළොන්නරුව,මොණරාගල සහ පුත්තලම

ලෙස තෝරා ගත් දිස්ත්‍රික්ක 4 ක ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. එකී ව්‍යාපෘතිය යුරෝ 20,629,921ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් නෙදර්ලන්තයේ රෝයල් අයිකල්කැම්ප් ආයතනය සමඟ 2017 ඔක්තෝබර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ යුරෝ 20,629,921.18 හෙවත් රුපියල් 5,521,329,000 න් සියයට 85 ක් එනම් යුරෝ 17,535,433 ක් නෙදර්ලන්තයේ රේබෝ බැංකුවෙන් (Rabo Bank) වාර්ෂිකව සියයට 1.45 බැගින් වූ සහන පොලී අනුපාතයක් මත වර්ෂ 10ක් තුළ සමාන වාරික 20 කින් ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ඉතිරි සියයට 15 වන යුරෝ 3,094,488.18 ක මුදල ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙනින්, වසර 3 ක සහන කාලයක්ත් පසු 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15 කින් ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ව්‍යාපෘති නිම කර තිබුණද එයට අදාළව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) නෙදර්ලන්ත රේබෝ බැංකුවෙන් ලබා ගෙන තිබුණු ණය මුදලින් රු.මිලියන 76.2 කට හෙවත් යුරෝ 433,288 කට අදාළ වැඩකටයුතු නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරු විසින් ඉටු කර නොතිබුණු අතර ණය ගිවිසුමෙහි 5.2 වගන්තිය අනුව සම්පූර්ණ ණය මුදල භාවිතයට නොගන්නේ නම් ඉතිරි වන මුදල ණය ආපසු ගෙවීමේ වාරික වලින් සමානුපාතිකව අඩු කරගත හැකි වුවත් ඉටු නොකළ කාර්යයන් පිළිබඳව මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය යටතේ බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමේ දන්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 259.1 ක් හෙවත් යුරෝ 1,473,462 ක් වෙන්කර තිබුණු අතර රු.මිලියන 329.8 ක් හෙවත් යුරෝ 1,875,447 ක අවිනිශ්චිත වෙන් කිරීමද දන්ත මධ්‍යස්ථානය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණි. මෙකී මුළු වටිනාකමින් සියයට 15 ක් වූ රු.මිලියන 544.2 ක් හෙවත් යුරෝ 3,094,488 ක් අත්තිකාරම් ලෙස නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් ඉඩම හිමිකාරිත්වය ලැබී ගොඩනැගිම් ඉදිකිරීම් ආරම්භ කර තොතිබුණ. මෙම දන්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිනොකිරීම නිසා ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ නිසිඵලය ලබාගත නොහැකි වී තිබුණි.

(iii) කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ජල විමංසන දන්ත පද්ධතිය වසර 05 ක් නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතු වූ

අතර ඒ සඳහා රු.මිලියන 106.5 ක් වෙවත් යුරෝ 605,894 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මේ යටතේ කොන්ත්‍රාත්කරු අමතර කොටස් 160 ක් සපයා තිබුණු අතර ඒවා අතරින් රත්මලාන වැඩබිම ගබඩාවේ තැන්පත් කර තිබුණු නඩත්තු උපකරණ අයිතම 41 ක් විධිමත්ව භාරගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල, ඩෙන්සිල් කොඩිබැකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩමක් 2016 දෙසැම්බර් 06 දිනැති අංක අමප/16/2500/724/099 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. මණ්ඩලයේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත එකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් වාර්ෂිකව රු. 2,700,000 ක බදු මුදලක් තීරණය කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමක් අත්සන් නොකර මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2023 මාර්තු දක්වා කුලිය වශයෙන් රු.23,344,253 ක් එම අධිකාරියට ගෙවා තිබුණි. මෙම ඉඩමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ සිට භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන්වී තිබුණද විධිමත් බදු ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් එය උපයෝජනය කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ විදුම් අංශයට විදුම් කළමණාකරුවකු, විදුම් නිලධාරීන් 11 දෙනෙකු ඇතුළු 68 දෙනෙකුගෙන් යුත් සහාය කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණු අතර එම කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් පිරිවැය වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු 41,478,196ක පිරිවැයක් දරා තිබුණි. එම අංශය සතු විදුම් යන්ත්‍ර 16 ක් අතරින් 8ක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පැවතුණු අතර අංශය විසින් 2016 වර්ෂයේ නළලිං 437 ක් ඉදි කර තිබුණද සමාලෝචිත වර්ෂය වන විට එය නළලිං 79 ක් දක්වා අඩාණ්ඩව පහළ ගොස් තිබුණි. අංශයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවය, මණ්ඩලය විසින් ඉදිකරනු ලබන නළලිං වල ප්‍රමිතිය හා කාර්යක්ෂමතාව පිළිබඳ සමාජය තුළ පැවති කීර්තිනාමය අඩාණ්ඩව පිරිහීම ඊට හේතු වී තිබුණද. ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර අවශ්‍ය නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) නාළ ලිං ඉදිකිරීමේ සේවා අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.15,919,957ක ශේෂයක් පැවතුණු අතර ඒ තුළ වර්ෂයකට වඩා පැරණි අදාළ කාර්ය නිමකර නොතිබුණු රු.1,637,828ක් වූ අත්තිකාරම් ශේෂයක් විය. අදාළ සේවා නොසැපයීම හේතුවෙන් මණ්ඩලය විසින් ලබාගත් රු.2,310,356ක් ආපසු ගෙවා

නිබුණු අතර ඒ තුළ නළ ලිං 4 ක් ඉදිකිරීම අසාර්ථක වීම හේතුවෙන් ආපසු ගෙවීමට සිදු වූ රු. 883,055ක්ද විය.

(ඉ) උතුරුමැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන ව්‍යාපෘති යටතේ කුරුලුනිකවැව හා මානේරුව ජේෂකර්ම මධ්‍යස්ථානයෙහි නළලිං 2ක් ඉදිකිරීමට රු. 467,500 ක් 2021 වර්ෂයේ මණ්ඩලයට ලබා දී තිබුණි. එම වර්ෂය තුළ නළලිං ඉදිකර නොතිබුණු අතර 2023 වර්ෂයේ දී එම නළලිං ඉදිකිරීමේදී උක්ත ගෙවූ මුදල ඉක්මවා රු.280,219 ක් වැය කිරීමට සිදුවී තිබුණි. මේ සම්බන්ධව අදාළ ගනුදෙනුකරුගේ පැමිණිල්ල මත පාරිභෝගික සේවා අධිකාරිය විසින් පැරණි ඇස්තමේන්තුව යටතේ අදාළ නළලිං ඉදිකර දියයුතු බවට කර තිබුණු නියෝගයට අනුව අදාළ නළලිං අතිරේක ගාස්තු අය කිරීමකින් තොරව නිමකර තිබුණි. මෙහිදී සේවා ගිවිසුම් අනුව නියමිත දිනට නළලිං ඉදි කර නොදීම හේතුවෙන් දැරීමට සිදු වූ අමතර පිරිවැය රු.280,219 ක මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතු බවට 2022 දෙසැම්බර් 25 දිනැති අංක 1430 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද අදාළ මුදල් මේ දක්වා අයකර ගැනීමට හා ඊට වගකිවයුතු සහකාර විදුම් අධිකාරීවරයාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පතක් පිළියෙල කිරීම සඳහා පෞද්ගලික නීතිඥයෙකු හා නීතිඥ සමාගමක සේවය ලබාගෙන විගණිත දිනය වූ 2023 ජූලි 31 වන විට රු. 620,000 ක් ගෙවා තිබුණු අතර පනත සංශෝධනය කළ යුතු බවට හඳුනාගෙන වසර 4 ක් ගතවූ පසුවද එම කාර්යය ඉටුකර නොතිබුණි.

(උ) මණ්ඩලය විසින් සිදුකරන විදුම් කටයුතු, ජලධාරිතා පරීක්ෂණ හා සාමාන්‍ය වාහන ධාවනයේදී සිදුවන අධික ඉන්ධන භාවිතය තුළ වංචා ඇතිවීම වළක්වාගැනීමට පියවරක් ලෙස අදාළ යන්ත්‍ර උපකරණවල හා වාහනවල ඉන්ධන සංවේදක උපකරණ හා ජී.පී.එස්. පද්ධති සවි කිරීම සඳහා 2019 සැප්තැම්බර් 18 දින පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. එහිදී විදුම් යන්ත්‍ර 7ක්, පොම්ප පද්ධති 2ක්, ක්‍රිව් කැබ 1ක්, කැබ් රථ 12ක් හා කොම්ප්‍රෙසර් පද්ධති 8ක් සඳහා උක්ත උපකරණ සවි කිරීමට අපේක්ෂා කර තිබුණද වසර 31/2කට අධික කාලයක් ගත වූ පසුවද විගණිත දින වූ 2023 මාර්තු 21 වීට මෙම පද්ධති සම්පූර්ණ කර තිබුණේ කැබ්රථ 12 ක් සහ විදුම් යන්ත්‍ර 3ක් සඳහා පමණකි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජල සම්පත් මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පණතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1.2 තත්වාගණනය කල මතය සඳහාපදනම			
	(අ)	ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ කොළඹ 07, හෙක්ටර්කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු 12,772,000.00 ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යායා ප්‍රාදේශීය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුන ද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේදී නඩුවක් ගොණු කර තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබඳ සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දි තිබියදී, නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු නොකර අවුරුදු 45 ක් පමණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රයෙන් ඉවත්ව 2021 ජුලි 18 දින සිට ප්‍රධාන කාර්යාලය නාවල, කොස්වත්ත ප්‍රදේශයේ පෞද්ගලික කුලී ගොඩනැගිල්ලකට ගෙනගොස් තිබුණි. එසේ වුවද අදාළ නඩුව අවසන් ව හෝ ප්‍රාදේශීය ලේකම් විසින් ඉවත් කරගෙන නොමැති බැවින් ඒ පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8 හි 100 ඡේදය ප්‍රකාරව මූල්‍ය වාර්තා වල හෙළිදව් කළ යුතු වුවත් එසේ සිදුකරගෙන නොතිබුණි.	**කළමනාකරණයේ අදහස් දැක්වීම.** 1978 වසරේ සිට ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලැබූ හෙක්ටර් කොබ්බැකඩුව මාවතේ පිහිටි ඉඩම දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගැනීමට ජල සම්පත් මණ්ඩලය ඉල්ලීමක් කරනු ලැබුවත් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දැනුම් දෙන ලද්දේ කෙටි කාලීන බදු පදනම මත වාර්ෂිකව රු.12,772,000.00 ක බදු මුදලකට ලබා දීමට හැකි බවයි. ඒ සඳහා ජල සම්පත් මණ්ඩලය එකඟව නොමැති අතර බදු ගිවිසුමකට එළඹී නොමැත. කෙටිකාලින බදු මුදල් නොගෙවීම නිසා ඉඩමෙන් අස්කිරීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලැබූ අතර උසාවිය මඟින් ඉවත් කිරීමේ නියෝග ලබා දෙන ලදී. මේ අතර මෙම ඉඩම ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගනු ලබන්නේ මෙගා පොලිස් වැඩ පිළිවෙල යටතේය. ඒ අනුව මෙම ඉඩමෙන් ඉවත් වීමට ජල සම්පත් මණ්ඩලයට නාගරික සංවර්ධන අධිකාරිය පර්.40ක ඉඩමක් බත්තරමුල්ලෙන් ලබා දෙන ලදී.කෙසේ වුවද අග්‍රාමාත්‍ය ලේකම්ගේ දැනුම් දීම මත එම ඉඩම අග්‍රාමාත්‍ය නිල නිවාසය සඳහා අත්පත් කර ගන්නා ලද අතර ජල සම්පත් මණ්ඩලය එම ඉඩමෙන් ඉවත් වී මාසික ගොඩනැගිලි කුලිය සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දෙන බැවින් ප්‍රධාන කාර්යාලය වෙනත් ගොඩනැගිල්ලකට ගෙනයන ලෙස දැනුම් දෙන ලදී.අදාල ලිපියේ පිටපතක් ඇමුණුම 01 මඟින් දක්වමි. ඉඩමෙන් ඉවත්වීම සඳහා ඉවත්වන ලෙස නීතිය අනුව දැනුම් දීමට අමතරව මෙම ඉඩම නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා ගෙන ඒ වෙනුවට බත්තරමුල්ල පර්චස් 40ක ඉඩමක් ලබා දී ඇති අතර තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන නොයන තත්වයක් මත මෙලෙස බැරකමක් නොපවතින බැවින් ඒ සඳහා මුල්‍ය ප්‍රතිපාදනයක් අවශ්‍ය නොවේ. තවද මණ්ඩලය මඟින් ඉදිරිපත් කරන ලද අවසාන ගිණුම් වාර්තාවේ සටහන් අංක 15 මඟින් මෙම කරුණ පිළිබඳ ප්‍රමිත අංක 08 ට අදාලව අදාල පැහැදිලි කිරීම් සිදු කර ඇත.

	(ආ)	2016 වර්ෂයේදී රු.217,242,201 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබුණු යන්ත්‍ර උපකරණ, රසායනාගාර උපකරණ සහ පරිගණක යනාදී වත්කම් පන්තීන් 3 කට අදාළ අයිතම 537 ක ඵලදායී ජීවිත කාලය අවසන් වීම හේතුවෙන් පොත් අගය ශූන්‍ය වී තිබුණු අතර, එම වත්කම් සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට නොගැනීම හේතුවෙන් ඒවා සමාලෝචිත වර්ෂය තුළ හාවිතා කර තිබුණ ද ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන කර නොතිබුණි.	2023.12.31 දිනට අදාල අවසන් ගිණුම් වලදී නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.
	(ඇ)	මණ්ඩලය විසින් නළ ළිං ඉදිකර බාහිර ආයතන හා ඒවායේ භූ විදුම් යන්ත්‍ර සහ භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචිය 2018 වර්ෂයේ සිට සිදු කර තිබුණි. මීට අදාළව සමාලෝචිත වර්ෂයේ රු 3,218,000 ක හා රු 329,000 ක අදායම ගිණුම්ගත කර තිබුණී ඒ පිළිබඳ පහත නිරීක්ෂණය සිදු කෙරේ.	2023.12.31 දිනට අදාල අවසන් ගිණුම් වලදී නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.
	(i)	උක්ත පරිදි මණ්ඩලය භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කර තිබුණ ද ඒ සඳහා මණ්ඩලයට කිසිදු නෛතික ප්‍රතිපාදනයක් ලැබී නොතිබුණි.	2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ "නල ළිං ඉදි කිරීම ජල සම්පත් මණ්ඩලය විසින් ගනු ලබන උපදෙස් අනුව සිදු කල යුතු" ලෙස සඳහන් කල පරිදි එම කටයුත්ත සිදු කිරීමට ප්‍රථමව නල ළිඳක් ඉදි කිරීමට සුදුසු ස්ථානයක් භූ භෞතික විද්‍යා පරීක්ෂණ මඟින් සොයාගත යුතුව ඇති එම පරීක්ෂණය පදනම් කර ගනිමින් භූජල විද්‍යාත්මක වාර්තාවක් ලබාගෙන එම වාර්තාව ඉහත පරිදි ජල සම්පත් මණ්ඩලයේ උපදෙස් අනුව ඉදි කිරීමට ඉදිරිපත් කල යුතුයි මෙම ගැසට් නිවේදනය නිකුත් කරන අවස්ථාව වන විට ජල සම්පත් මණ්ඩලයට අමතරව ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ හා බාහිර භූජල විද්‍යාඥයින් මඟින් මෙම සමීක්ෂණ කටයුතු සිදු කරන ලදි. ඉහත ගැසට් නිවේදනයට අනුව නියෝග ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන නොමැති බැවින් ඇතිවූ ගැටළු නිරාකරණය සිදුකිරීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත සුදුසු පරිදි සංශෝධනය කර අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. තවද ජල සම්පත් මණ්ඩලයේ පනත සංශෝධනය වන තුරු, අදාල ගැසට් නිවේදනයට අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා භූජල සමීක්ෂණ වාර්තා ජල සම්පත්

			මණ්ඩලය වෙත ලබාගෙන අවශ්‍ය උපදෙස් හා අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු සිදු කරන ලදි. එහිදී එම භූජල සමීක්ෂණ වාර්තා සඳහා අදාල නිර්දේශ ලබාදීමේදී එම වාර්තා ජල සම්පත් මණ්ඩලය වෙත යොමු කිරීමේදී ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ භූජල විද්‍යාඥයින්ට අමතරව බාහිර භූජල විද්‍යාඥයින් තෝරාගැනීමක් සිදු කරන ලදි. එහිදී එම භූජල සමීක්ෂණ වාර්තා ජල සම්පත් මණ්ඩලය වෙත යොමු කිරීමට පමණක් සුදුසුකම් ලත් බාහිර භූජල විද්‍යාඥයින් තෝරාගෙන ලියාපදිංචිය සිදු කරන ලදි. එබැවින් මෙම කටයුත්ත තවදුරටත් විධිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් අනුව කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.
	(ii)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 10 හි 14 ඡේදයට පටහැනිව උක්ත ලියාපදිංචි කිරීමේ හා ලියාපදිංචිය අලුත් කිරීමේ ආදායම මුදල් පදනම මත හඳුනාගෙන තිබුණි. තවද ප්‍රමිතියේ 39(අ) ඡේදය ප්‍රකාර මෙම ආදායම් හඳුනාගැනීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොතිබුණි.	පිළිගනිමි. 2023 වර්ෂයේදී නිවැරදි කරමි.
	(iii)	වර්ෂයට අදාළ ආදායම හඳුනාගෙන උපචිත පදනම මත ගිණුම් තැබීම වෙනුවට මෙහෙයුම් ආදායම් වලට අදාළ ඉකුත් වර්ෂ වල අගයන් පසු වර්ෂයේ නැවත ප්‍රකාශ කර අලාභයට ගැලපීම සිදු කර තිබුණි. ඒ අනුව 2020හා 2021 වර්ෂ වල පිළිවෙලින් රු 12,593,000 ක් හා රු 23,910,000 ක් වූ අලාභය පසු වර්ෂ වල රු 10,973,000 හා රු 16,988,000 ක් වශයෙන් සියයට 12.9 කින් හා සියයට 28.9 කින් අඩු වී තිබුණි.	පැහැදිලි කිරීම් අවශ්‍ය නොවේ.
	(iv)	සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන වල නැවත ප්‍රකාශ කර තිබුණු ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ආදායම සඳහා වූ සංසන්දනාත්මක අගයන් රු 6,896,000 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 3 හි 54 ඡේදයේ (අ) සිට (ඈ) දක්වා වූ තොරතුරු මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	**නඩත්තු වියදම්** 2021 වර්ෂයට අදාල ගෙවීම 2022 වසරේ සිදුකර ඇති බැවින් මෙම ගැලපීම කර ඇති කෙසේ වුවද 2023 වසරේ සිට උපචිත පදනම මත ගිණුම් පිළියෙල කිරීමේදී මෙම කරුණු වලක්වා ගැනීමට හැකි බව සඳහන් කරමී

	(ඈ)	වාරිමාර්ග අමාත්‍යාංශ වැය විෂයය අංක 198-2-03-23-2507-17 යටතේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ යූරෝ 20,629,921 ක් හෙවත් රු 5,521,329,000 පිරිවැයක් දරා ක්‍රියාත්මක කර තිබෙන භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. ව්‍යාපෘතියට අදාලව කොන්ත්‍රාත්කරු විසින් මෙරටට ආනයනය කරන ලද යන්ත්‍ර උපකරණ, වාහන, අමතර කොටස්, මෙවලම් හා අමුද්‍රව්‍ය වලින් රු 1,581,619,000 ක් වටිනා ලී බඩු උපකරණ, යන්ත්‍ර, මෝටර් වාහන, විද්‍යාත්මක උපකරණ හා පරිෂණක වැනි ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ලබා දී තිබුණි. හුවමාරු නොවන ගණුදෙනු ගිණුම්ගත කිරීම් සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 49 ඡේදයේ ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස හදුනාගත යුතුව තිබුණු උක්ත ජංගම නොවන වත්කම් වල වටිනාකම විලම්භිත අදායමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.	ව්‍යාපෘතියට අදාලව වීම රු. 3,940,201,785 ක වටිනාකමින් යුත් වත්කම් මණ්ඩලයට 2022.12.31 දින වන විට භාරදී නොමැති බැවින් මණ්ඩලයේ අවසන් ගිණුම් වලට වීම වත්කම් අගය ඇතුලත් කර නොමැති බව සඳහන් කරමි. ඒ බවට ප්‍රතිපත්තීන් වල අංක 11 යටතේ හෙලිදරව් කර ඇත.
	(ඉ)	වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රු 5,521,329,000 ක් වැය කර ක්‍රියාත්මක වූ ඉහත (ඈ) ඡේදය යටතේ දැක්වෙන භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ මණ්ඩලය වෙත භාර දී තිබූ වත්කම් වලට අමතරව දරා තිබුණු රු 3,939,710,000 ක පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කරන අධීතාක්ෂණික උපකරණ සහිත නළ ලිං 190 ක් අදාල නඩත්තු උපකරණ සමග මණ්ඩලයට පවරා ගෙන මෙම නළ ළිං 190 හි වටිනාකම නිසි පරිදි හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කල යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.	ව්‍යාපෘතිය යටතේ මුලික ගිවිසුමට අනුව නිමාන නල ලිං 150ක් සිදුකොට ඇති අතර එම ව්‍යාපෘතියෙහි අසම්භාව්‍ය වෙන් කිරීම් යටතේ කැබිනට් මණ්ඩලය මඟින් පත්කරනු ලැබූ ව්‍යාපෘතියෙහි ඇගයුම් කමිටුවෙහි අනුමැතියට යටත්ව ජල සම්පත් මණ්ඩලය සතුව පැවති නිමාන නල ලිං 40 කද භූගත ජල සම්පත් කළමණාකරනයෙහි අවශ්‍යතාවය මත යාපන අර්ධද්වීපයේද මෙම තත් කාලීන උපකරණයන් ස්ථාපිත කරන ලදි. ඒ අනුව නිමාන පද්ධතියෙහි ස්ථාන 190 හි සාරාංශගත විස්තර සමඟ ඒ සඳහා ස්ථාපිත කල උපකරණයන් සහ වටිනාකම් සමඟ අවශ්‍ය ලියකියවිලි වත්කම් ලෙස ජල සම්පත් මණ්ඩලයෙහි ගිණුම් තැබීම සඳහා පිළියෙල කොට ඇති අතර අදාල ලියකියවිලි ගිණුම් අංශය වෙත භාරදීමට මේ වන විට සැලසුම් කොට ඇත.
	(ඊ)	ඉකුත් වර්ෂ වල භාණ්ඩාගාර හා වෙනත් ප්‍රදානයන් යටතේ ලැබී තිබුණු රු 334,244,000 ක් වූ වත්කම් 2021 දෙසැම්බර් 31 දිනට විලම්භිත අදායමක් ලෙස දක්වා තිබුණු අතර අදාල වටිනාකම් ඉකුත් වර්ෂ වල ආදායමක් ලෙස හදුනා ගත යුතු වුවද එසේ නොකර තවදුරටත් විලම්භිත අදායමක් ලෙස දක්වා තිබුණි.	පිළිගනිමි. 2023 වර්ෂයේදී නිවැරදි කරමි.

	(ඇ)	සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හදුනා ගත යුතු උක්ත වත්කම් වලට අදාල ක්‍රමක්ෂය රු 119,050,000 ක් ක්‍රමක්ෂය ගිණුමට බැර කිරීම වෙනුවට ස්ථාවර වත්කම් ක්ෂය ගිණුමට බැර කර තිබුණි.	පිළිගනිමි. 2023 වර්ෂයේදී නිවැරදි කරමි.
	(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි 34 ඡේදයේ ප්‍රකාරව සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු වුවත් මණ්ඩලයේ ප්‍රධාන කළමණාකරන කාර්ය මණ්ඩලයෙන් එම තොරතුරු හෙළිදරව් කර හෝ සම්බන්ධිත පාර්ශව සමග සිදු කළ ගණුදෙනු සිදු නොවුණු බවට මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.	සම්බන්ධිත පාර්ශවයන් වෙනුවෙන් ගෙවන ලද දීමනා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 04 - 1 යටතේ අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු ලෙසින් දක්වා ඇති අතර ඊට අමතරව ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අංක 09 යටතේ මේ පිළිබඳව හෙලිදරව් කර ඇත.
2.2.2		**නීතිරීති /විධානයට යොමුව**	**කළමනාකරණයේ අදහස් දැක්වීම**
	(අ) (i)	1964 අංක 29 දරණ ජල සම්පත් මණ්ඩල පනතේ 16 වනන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළනියෝගී 02 නියෝගය නල ලිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 72 පමණක් මණ්ඩලයේ ලියාපදිංචි වී තිබුණු අතර ලියාපදිංචි වී නොමැති ආයතන මොනවාද යන්න හදුනා ගැනීම සදහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබුණී තවද ඉහත නියෝග පරිදි ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියලු නළ ලිං වල දත්තයන් ඇතුලත් වාර්ථාවක් සෑම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් ලියාපදිංචි ආයතන 72 කින් උක්ත වාර්ථාව ලාබා දී තිබුනේ ආයතන 03 ක් පමණී	2021 වර්ෂයේ නොවැම්බර් මස ජල සම්පත් මණ්ඩලයේ මේ දක්වා ලියාපදිංචි වී ඇති සියළුම විදුම් ආයතන වෙත 2022 වර්ෂය සඳහා ලියාපදිංචි වන ලෙස ලිඛිතව දැනුම් දෙන ලදි. නමුත් 2022 වර්ෂය සඳහා බාහිර විදුම් ආයතන හා විදුම් යන්ත්‍ර 72 ක් ලියාපදිංචි විය. නැවත සියළුම විදුම් ආයතන දැනුවත් කර ලියාපදිංචිය යාවත්කාලීන කරන ලෙස ද දැනුම් දෙන ලදි. ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති බාහිර විදුම් ආයතන මඟින් ඉදි කරනු ලබන නල ළිං පිළිබඳ විස්තර 2022 වර්ෂයේ විදුම් ආයතන 03 කින් පමණක් විදුම් වාර්තා ඉදිරිපත් කර ඇත. අදාල විදුම් වාර්තා ඒවන ලෙස ලිඛිතව සියළු විදුම් ආයතන දැනුවත් කරන ලදි. ඉදිරියේදී ඉදිකරනු ලබන නල ළිං සඳහා විදුම් වාර්තා ජල සම්පත් මණ්ඩලය වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. එසේ නොකරන විදුම් ආයතනයන්ට නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
	(ii)	**03 නියෝගය** ජලය බෝතල් කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතනයක් හෝ පුද්ගලයකු ස්වාභාවික ජල උල්පතක්	ජලය බෝතල් කිරීමේ කර්මාන්තයේ සහ බීම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතන මඟින් මාස 06 කට වරක් අදාල භූගත ජල ප්‍රභවයෙහි ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමේදී මේ වන තෙක්

		හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කර ගනු ලබන්නේ නම් සෑම මාස 06 කට වරක්ම එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂා කරවා ගෙන අදාල විශ්ලේෂණ වාර්ථාව අනුමැතිය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු වුවත්, මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආයතන 40 කින් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ඉහත වාර්ථා ලබා දී, තිබුණේ එක් ආයතනයකින් පමණි.	ආයතන 31 ක් එවා ඇති අතර 2022 වර්ෂයේ එක් ආයතනයකින් පමණක් අදාල වාර්තා ලබාදී ඇත. එබැවින් ලියාපදිංචි සියළුම ආයතන වෙත ලිඛිතව අදාල තොරතුරු ලබාදෙන ලෙස ලිඛිතව දන්වා ඇති අතර වාර්තා ඉදිරිපත් නොකල ආයතන සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු සිදු කරමින් පවතියි.
	(iii)	**06 නියෝගය** ස්වාභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූ ගත ජලය භාවිතා කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් අනුගමනය කල යුතු නියමයන් ඇතුලත් 1 සිට 5 දක්වා නියෝග ප්‍රකාරව කටයුතු නොකරන සංවිධාන හෝ පුද්ගලයන්ට හෝ එරෙහිව 1999 අංක 42 දරණ පනතින් සංශෝධිත 1964 අංක 29 දරණ ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්ති ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.	ජල සම්පත් මණ්ඩලය වෙත වාණිජ අරමුණු සඳහා භාවිතා කරනු ලබන භූගත ජල ප්‍රභවයන්හි ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා ලබා දී නොමැති හඳුනාගත් ආයතන සඳහා නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
	(ආ)	1981 අංක 26 දරණ සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධිත) පනතේ 10 හා 11 වගන්ති අරමුදල සඳහා සේව්‍ය දායකත්වය සියයට 12 ක් හා සේවක දායකත්වය සියයට 8 ක් වියයුතු අතර ඊට වැඩි අනුපාතයට එකඟ විය හැක. එසේ වුවද මණ්ඩලයේ සේව්‍ය දායකත්වය සියයට 12 ක් වීමේදී සේවකයන්ගෙන් සියයට 10 ක් අයකර ගෙවාතිබුණද ඒ සම්බන්ධයෙන් කොමසාරිස් වරයා වෙත දැනුම් දී නොතිබුණි.	ජල සම්පත් මණ්ඩලය විසින් 1981 ජුලි මස සිට මේ දක්වා සේවක අර්ථසාධක අරමුදලට මුදල් බැර කිරීම ලෙස සේවක දායකත්වය 10 % හා ජල සම්පත් මණ්ඩලයේ දායකත්වය 12% ක් ලෙස දායක මුදල් බැර කිරීමට කටයුතු සිදු කර ඇත.සේවක දායකත්වය 10 % ක් වීම සේවක මහත්ම මහත්මීන්ට ඉතිරියක් බැවින් මේ දක්වා සේවක මහත්ම මහත්මීන්ගෙන් විරෝධතාවයක් පැන නැගී නොමැත.
	(ඇ) (i) 2.2.1	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හදුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ මණ්ඩලය සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක නිශ්චය කර හෝ සංයුක්ත සැලැස්මක් සකස් කර හෝ ඒ අනුව මණ්ඩලය මෙහෙයවීමට කටයුතු කර හෝ නොතිබුණි.	සටහන් කර ගතිමි.

	(ii) 2.2.2	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කියවා අධ්‍යයනය කිරීම සඳහා මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීම, තීරණ ගැනීමට හා වග වීම තහවුරු කිරීමට අවශ්‍ය මනා විශ්වාසදායී කළමණාකරන තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම, විගණන කමිටු ඇතුළු අනෙකුත් උප කමිටු වල තීරණ කාලීනව පසු විපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා සම්බන්ධිත පාර්ශවයන්ගේ අවශ්‍යතා ඉටු වන , මූල්‍ය හා මූල්‍ය නොවන උපරිම තොරතුරු පරිශීලන හිතකාමී පරිදි ආයතනයේ වෙබ් පිටුව මඟින් හෙළිදරව් කිරීම යන අවශ්‍යතා ඉටුවන පරිදි ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර නොතිබුණි.	මේ සඳහා විශේෂිත දැනුම හා අත්දැකීම් ඇති නිලධාරීන් පත්කිරීමට අවශ්‍ය වුවත් තනතුරු ඇති කිරීමට ලේකම්වරයාගෙන්ද ඉල්ලීම් කලද, එය අනුමත නොවූ අතර දැනට කළමනාකරණ සහකාර වරයෙකු පත් කිරීම සිදු විය.
	(iii) 2.2.3	අවදානම් කළමනාකරණය හා ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතීන්ගේ ප්‍රමාණවත්භාවය හා සඵලදායී ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානයට ලක් වී නොතිබුණි.	සටහන් කර ගතිමි.
	(iii) 2.2.4	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලය සමග වුසම්බන්ධතා පිළිබඳ මණ්ඩලයේ ලේකම් වෙත වාර්ෂික ප්‍රකාශයක් සිදු කර නොතිබුණු අතර මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ වක් වක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් අදාල හෙළිදරව් කිරීම්ද සිදු කර නොතිබුණි	2022 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ගැනීමට සටහන් කර ගතිමි.
2.2.3		2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ බලතල ,කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.	සටහන් කර ගතිමි.
2.3		**වෙනත් කරුණු**	**කළමනාකරණයේ අදහස් දැක්වීම.**
		භූ ගත ජල විමංසන තොරතුරු ජාලයක් (Groundwater monitoring network) ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය. ශ්‍රී ලංකාවේ භූ ගත ජලයේ පවතින ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තත්වයන් කළමනාකරණය කිරීම සඳහා පද්ධතියක් ස්ථාපනය කිරීමට, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය වකුගඩු රෝගය විශාල වශයෙන් හිවිසුමෙහි 5.2 වගන්තිය අනුව සම්පූර්ණ ණය මුදල භාවිතයට නොගන්නේ නම් ඉතිරි	ඇමුණුම 2 මඟින් දක්වා ඇත.

		වන මුදල ණය ආපසු ගෙවීමේ වාරික වලින් සමානුපාතිකව අඩු කර ගත හැකි වුවත් ඉටු නොකළ කාර්යයන් පිළිබඳ මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර නොතිබුණි. ව්‍යාප්ත වී ඇති අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල සහ පුත්තලම ලෙස තෝරා ගත් දිස්ත්‍රික්ක 04 ක ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරණ අමාත්‍ය මණ්ඩල තීරණ මගින් අනුමැතිය ලබා දී තිබුණි. එකී ව්‍යාපෘතිය යුරෝ 20,629,921 ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීම සඳහා වාර්මාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් නෙදර්ලන්තයේ රෝයල් අයිකල්කෑම්ප් ආයතනය සමග 2017 ඔක්තෝම්බර් 03 දින ගිවිසුමකට එලඹ තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ යුරෝ 20,629,921.18 හෙවත් රු. 5,521,329,000 න් සියයට 85 ක් වනමි යුරෝ 17,535,433 ක් නෙදර්ලන්තයේ රේබෝ බැංකුවෙන් (සෘණද ඊබන) වාර්ෂිකව සියයට 1.45 බැගින් වූ සහන පොලී අනුපාතය මත වර්ෂ 10 ක් තුළ සමාන වාරික 20 කින් ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ඉතිරි සියයට 15 වන යුරෝ 3,094,488.18 ක මුදල ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින් , වසර 3 ක සහන කාලයකින් පසු 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15 කින් ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ව්‍යාපෘතිය නිම කර තිබුණද එයට අදාලව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.	
	(i)	නෙදර්ලන්ත රේබෝ බැංකුවෙන් ලබා ගෙන තිබුණු ණය මුදලින් රු. මිලියන 76.2 කට හෙවත් යුරෝ 433,288 කට අදාළ වැඩකටයුතු නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරු විසින් ඉටු කර නොතිබුණු අතර ණය ගිවිසුමෙහි 5.2 වගන්තිය අනුව සම්පූර්ණ ණය මුදල භාවිතයට නොගන්නේ නම් ඉතිරි වන මුදල ණය ආපසු ගෙවීමේ වාරික වලින් සමානුපාතිකව අඩු කර ගත හැකි වුවත් ඉටු නොකළ කාර්යයන් පිළිබඳ මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය දැනුවත් කර නොතිබුණි.	
	(ii)	ව්‍යාපෘතිය යටතේ බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමේ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා රු. මිලියන 259.1 ක් හෙවත් යුරෝ 1,473,462 ක් වෙන් කර තිබුණු අතර රුපියල්	ඇමුණුම 2 මඟින් දක්වා ඇත.

		මිලියන 329.8 ක් හෙවත් යුරෝ 1,875,447 ක අවිනිශ්චිත වෙන් කිරීමිද දත්ත මධ්‍යස්ථානය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණි. මේකී මුළු වටිනාකමින් සියයට 15 ක් වූ රු. මිලියන 544.2 ක් හෙවත් යුරෝ 3,094,488 ක් අත්තිකාරම් ලෙස නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් ඉඩම් හිමිකාරිත්වය ලැබී නොතිබීම හේතුවෙන් දත්ත මධ්‍යස්ථානය ඉදි කර නොතිබුණි. මෙම දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි නොකිරීම නිසා ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ නිසි ලෙස ලබා ගත නොහැකි වී තිබුණි.	
	(iii)	කොන්ත්‍රාත්කරු ගිවිසුම ප්‍රකාරව ජල විමංසන දත්ත පද්ධතිය වසර 05 ක් නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතු වූ අතර ඒ සඳහා රු. මිලියන 106.5 ක් හෙවත් යුරෝ 605,894 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මේ යටතේ කොන්ත්‍රාත්කරු අමතර කොටස් 160 ක් සපයා තිබුණු අතර ඒවා අතරින් රත්මලාන වැඩබිම ගබඩාවේ තැන්පත් කර තිබුණු නඩත්තු උපකරණ අයිතම 41 ක් විධිමත්ව භාරගෙන ගිණුම්ගත කර නොතිබුණි.	ඇමුණුම 2 මඟින් දක්වා ඇත.
	(ආ)	නාගරික සංවර්ධන අධිකාරියට අයත් බත්තරමුල්ල,ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩමක් 2016 දෙසැම්බර් 06 දිනැති අංක අමප/16/2500/724/099 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩය වෙත ලබා දීමට තීරණය කර තිබුණි. මණ්ඩලයේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමට යෝජිත ඒකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් වාර්ෂිකව රු. 2,700,000 ක බදු මුදලක් තීරණය කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමක් අත්සන් නොකර මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2023 මාර්තු දක්වා කුලිය වශයෙන් රුපියල් 23,344,253 ක් එම අධිකරියට ගෙවා තිබුණි. මෙම ඉඩමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳාහා 2018 වර්ෂයේ සිට භූ ගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත	අංක 2 ඒ, හෙක්ටර් කොබ්බැකඩුව මාවත,කොළඹ 07, ඉඩමේ ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර තිබු අතර එම ඉඩමට 2013-2017 දක්වා එකතු වූ බදු මුදල රු.56,409,666.00 ක් ලබාගැනීම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් ජල සම්පත් මණ්ඩලයට විරුද්ධව නඩු පවරා තිබුණි.එම ඉඩමෙන් ජල සම්පත් මණ්ඩලය ඉවත් කිරීමට උසාවිය විසින් ඉඩමෙන් පිටව යාම සඳහා සිතාසි යවනු ලැබ තිබුණි.මේ අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2016 දී අමාත්‍ය මණ්ඩල තීරණයක් යටතේ ජල සම්පත් මණ්ඩලය හෙක්ටර් කොබ්බැකඩුව මාවත ඉඩමෙන් ඉවත් වීමටද එම ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමටද ඒ වෙනුවෙන් බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බැකඩුව මාවතේ පර්චස් 40.ක ඉඩමක් ජල සම්පත් මණ්ඩලයට ලබාදීමටද තීරණය වී තිබුණි.ඒ අනුව එම ඉඩම තබාගැනීම සඳහා 2017 සිට බදු මුදල් ගෙවීමට සිදු විය. මෙම ඉඩම තබාගැනීමේ පරමාර්ථය වුයේ නෙදර්ලන්ත ව්‍යාපෘතිය යටතේ ජල සම්පත් මණ්ඩලයේ

		කිරීම සඳහා නියමු ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන් වී තිබුණද විධිමත් බදු ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් එය උපයෝජනය කර නොතිබුණි.	රසායනාගාරය හා දත්ත මධ්‍යස්ථානය ගොඩනැගීමටය.මේ දක්වා මෙම ඉඩම සඳහා බදු ගිවිසුම අත්සන් කිරීමට නොහැකි වුයේ ඉඩම් සංවර්ධන පනතේ 6(1) වගන්තිය යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් අනුමැතිය ලබා නොදුන් හෙයිනි.මෙයට හේතු පාදක වුයේ හෙක්ටර් කොබ්බැකඩුව මාවතේ ඉඩම සඳහා හිඟ බදු මුදල වශයෙන් 2013-2017 දක්වා කාලය සඳහා රු. 56,409,666.00 ක් ගෙවීමට සිදුව තිබු නිසාය. මෙම හිඟ බදු මුදල කපා හැරීම සඳහා ඉඩම් අමාත්‍යංශ ලේකම් හා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් සමග පැවති සාකච්ජාවේදී තීරණය වූ පරිදි අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට දැනට කටයුතු කරමින් පවතී.
	(ඇ)	මණ්ඩලයේ විදුම් අංශයට විදුම් කළමණාකරුවකු, විදුම් නිලධාරීන් 11 දෙනෙකු ඇතුළු 68 දෙනෙකුගෙන් යුත් සහාය කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණු අතර එම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් , අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් පිරිවැය වශයෙන් සමාලෝචිත වර්ෂය තුල රු. 41,478,196 ක පිරිවැයක් දරා තිබුණි. එම අංශය සතු විදුම් යන්ත්‍ර 16 ක් අතරින් 8 ක් පමනක් ක්‍රියාකාරී තත්වයේ පැවතුණු අතර අංශය විසින් 2016 වර්ෂයේ නල ළිං 437 ක් ඉදි කර තිබුණ ද සමාලෝචිත වර්ෂය වන විට එය නල ළිං 79 ක් දක්වා අඛණ්ඩව පහල ගොස් තිබුණි. අංශයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවය මණ්ඩලය විසින් ඉදි කරනු ලබන නල ළිං වල ප්‍රමිතිය හා කාර්යක්ෂමතාව පිළිබඳ සමාජය තුල පැවති කීර්තිනාමය අඛණ්ඩව පිරිහීම ඊට හේතු වී තිබුණ ද ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර අවශ්‍ය නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2017 මාර්තු මස 17 වන දින ගැසට් පත්‍රය අනුව නළලිං ඉදිකරනු ලබන ආයතන නියාමනය කිරීමේ කටයුතු එම වර්ෂයේ සිට ආරම්භ කරන ලදී. ඒඅනුව නල ලිං විදුම් ආයතන, විදුම් යන්ත්‍ර සහ භූ ජල සම්ක්ෂණ කරනු ලබන භූ ජල විද්‍යඥයින් ලියාපදිංචි කරන ලදී.(භූ ජල විද්‍යඥයින් නලලිං ඉදිකිරීමේ කාර්යය සඳහා වාර්තා පමණක් ලබා දීමට) ඒ අනුව 2016 වර්ෂයෙන් පසුව නල ලිං ඉදිකිරීම සඳහා බාහිර විදුම් ආයතන වලට ඉඩකඩ ලබාදීම හේතුකොට ගෙන ජලසම්පත් මණ්ඩලය විසින් ඉදිකළ ළිං ප්‍රමාණයේ යම් අඩු වීමක් දක්නට ඇත. බාහිර විදුම් ආයතන ලියාපදිංචිය නිසා මණ්ඩලයේ ආදායම් තත්වයේ යම් වැඩිවීමක් සිදුවි ඇත .
	(ඈ)	නල ළිං ඉදි කිරීමේ සේවා අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට රු. 15,919,957 ක ශේෂයක් පැවතුණු අතර ඒ තුල වර්ෂයකට වඩා පැරණි අදාල කාර්ය නිම කර නොතිබුණ රු. 1,637,828 ක් වු අත්තිකාරම් ශේෂයක් විය. අදාල සේවා නොසැපයීම හේතුවෙන් මණ්ඩලය විසින් ලබා ගත් රු. 2,310,356 ක් ආපසු ගෙවා තිබුණු අතර ඒ තුල නල ළිං 04 ක් ඉදි කිරීම අසාර්ථක වීම හේතුවෙන් ආපසු ගෙවීමටට සිදු වු රු. 883,055 ක් ද විය.	2022.12.31 දිනට අත්තිකාරම් ගිණුමේ පැවති රු 15,919,957.00 මුදලට අදාල සේවාවන් ප්‍රමාද වීමට හේතු සහ ඊට වගකිවයුතු නිලධාරීන් හදුනාගැනීම සඳහා මූලික විමර්ශනයක් පැවැත්වීමට කමිටුවක් පත්කරන ලදී.එම කමිටුවේ නිර්දේශ මත වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. මණ්ඩලය මගින් ඉටුකරන ලබන සේවාවන් ප්‍රමාදයකින් තොරව සිදුකර දීම හා ඒවා පියවර වශයෙන් ඉටුකිරීම අධීක්ෂණය කිරීමට හැකිවන සේ රැකියා විස්තර හා වැඩ පියවර

			ලේඛන ගත කොට ඒවා විධිමත් පරිදි නිගමනය කිරීමට අංශ ප්‍රධානීන්ට වගකීම පැවරීමට කටයුතු කරනු ලැබේ. නළ ළිං 04 ඉදිකිරීම අසාර්ථක වීමට හේතු සහ ඊට අදාල වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගනු ලැබේ.
	(ඉ)	උතුරු මැද පලාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන ව්‍යාපෘති යටතේ කුරුලුනිකවැව හා මානේරුව පේෂකර්ම මධ්‍යස්ථානයෙහි නල ළිං 02 ක් ඉදි කිරීමට රු. 467,500 ක් 2021 වර්ෂයේ මණ්ඩලයට ලබා දී තිබුණි. එම වර්ෂය තුල නල ළිං ඉදි කර නොතිබුණු අතර 2023 වර්ෂයේදී එම නල ළිං ඉදි කිරීමේදී උක්ත ගෙවූ මුදල ඉක්මවා රු. 280,219 ක් වැය කිරීමට සිදු වී තිබුණි. මේ සම්බන්ධව අදාල ගනුදෙනු කරුගේ පැමිණිල්ල මත පාරිභෝගික සේවා අධිකාරිය විසින් පැරණි ඇස්තමේන්තුව යටතේ අදාල නල ළිං ඉදිකර දිය යුතු බවට කර තිබුණු නියෝගයට අනුව අදාල නල ළිං අතිරේක ගාස්තු අය කිරීමකින් තොරව නිම කර තිබුණි. මෙහිදී සේවා ගිවිසුම් අනුව නියමිත දිනට නල ළිං ඉදිකර නොදීම හේතුවෙන් දැරීමට සිදු වූ අමතර පිරිවැය රු. 280,219 ක මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගත යුතු බවට 2022 දෙසැම්බර් 25 දිනැති අංක 1430 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද අදාල මුදල් මේ දක්වා අය කර ගැනීමට හා ඊට වගකිව යුතු සහකාර විදුම් අධිකාරිවරයාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.	වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇති අතර එම නිලධාරීන්ගෙන් විනයානුකූල කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.
	(ඊ)	ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාල කෙටුම්පතක් පිළියෙල කිරීම සඳහා පෞද්ගලික නීතීඥයකු හා නීතීඥ සමාගමක සේවය ලබා ගෙන විගණිත දිනය වූ 2023.ජූලි 31 වන විට රු. 620,000 ගෙවා තිබුණු අතර පනත සංශෝධනය කල යුතු බවට හදුනාගෙන වසර 04 ගතවූ පසුවද එම කාර්ය ඉටු කර නොතිබුණි.	2017 සකස් කරන ලද කෙටුම්පත තවදුරටත් වර්ධනය කරමින් 2022දී ඇති වූ වෙනත් ප්‍රවණතා සැලකිල්ලට ගෙන නව නීතීඥ සමාගමක් මඟින් සංශෝධනය අවසන් කර ඇත. කෙටුම්පත සකස් කර අවසන් කර ගරු ඇමතිතුමාට ඉදිරිපත් කර ඇති අතර එහිදී මතු වූ සංශෝධනයන් කර නැවත ගරු ඇමතිතුමාට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. මුල් පිටපත් ඇති නෛතික කරුණු පදනම් කර ගෙන ඉදිරි සංශෝධන කර ගෙන ගිය බැවින් මෙය නිෂ්කාර්ය වියදමක් නොවේ. අමත්‍යාංශයේ නීති නිලධාරියෙකු නොමැති බැවින් මෙම කටයුතු ගරු අමාත්‍යතුමාගේ

			නීති උපදේශක සහ ජනාධිපති කාර්යාලයේ නීති උපදේශකවරයෙකු සම්බන්ධකරගෙන ඉදිරි කටයුතු සිදු කරමින් පවති.
	(උ)	මණ්ඩලය විසින් සිදු කරන විදුම් කටයුතු ජල ධාරිතා පරීක්ෂණ හා සාමාන්‍ය වාහන ධාවනයේදී සිදු වන අධික ඉන්ධන භාවිතය තුල වංචා ඇති වීම වලක්වා ගැනීමට පියවරක් ලෙස අදාල යන්ත්‍ර උපකරණ වල හා වාහන වල ඉන්ධන සංවේදක උපකරණ හා ජී.පී.එස් පද්ධති සවි කිරීම සඳහා 2019 සැප්තැම්බර් 18 දින පෞද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එලඹී තිබුණි. එහිදී විදුම් යන්ත්‍ර 07 ක් පොම්ප පද්ධති 02 ක් ක්‍රිව් කැබ් 01 , කැබ් රථ 12 ක් හා කොම්ප්‍රෙසර් පද්ධති 08 ක් සඳහා උක්ත උපකරණ සවි කිරීමට අපේක්ෂා කර තිබුණද වසර 3 1/2 කට අධික කාලයක් ගතවු පසුවද විගණිත දින වු 2023 මාර්තු 21 විට මෙම පද්ධති සම්පූර්ණ කර තිබුනේ කැබ් රථ 12 ක් සහ විදුම් යන්ත්‍ර 03 සඳහා පමණකි.	විදුම් යන්ත්‍ර, වායු පීඩන යන්ත්‍ර, ජෙනරේටර් හා කැබ්රථ යනාදියට පි.වී.එස් උපාංග 30 ක් සවිකිරීම නිම කරන ලද අතර කැබ්රථ හැර අනෙක් යන්ත්‍රෝපකරණ වලට ඉන්ධන යෙදීම වැඩබිම් වල බැරල් වලින් නිකුත් කරනු ලැබීම නිසා ගණනය කිරීමේ අපහසුතාවක් ඇතිවී තිබුණු අතර පසුව මැනුම් උපකරණ ලබා දී එම ගැටළුව විසඳන ලදී.2020 හා 2021 වසර වල පැවති කොවිඩ් 19 වසංගත තත්වය නිසා කේෂ්ත්‍ර වලට කටයුතු යන්ත්‍රෝපකරණ යෙදවීම සිමා වීමත් හා යන්ත්‍රෝපකරණ වල හටගත් කාර්මික දෝෂයන් නිසාත් තොරතුරු වාර්තා යාවත්කාලීන නොවිණි.පසුව පරීක්ෂා කර කේෂ්ත්‍රයේ ක්‍රියාත්මක වන ඒකකයන්හි වාර්තා පරීක්ෂා කර ඒවාට පමණක් ගෙවීමට කටයුතු කර ඇත.

.....
R.P ලියනාරච්චි
අභ්‍යන්තර විගණක

2022 වර්ෂය තුල ජල සම්පත් මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්හි ප්‍රගතියේ සාරංශය

ශ්‍රී ලංකාව තුළ භූගත ජලය කළමනාකරණය පිළිබඳ වගකීම දරන ආයතනය වන්නේ ජල සම්පත් මණ්ඩලයයි. ඒ අනුව ජල සම්පත් මණ්ඩලය විසින් භූ ගත ජලය සම්බන්ධ පර්යේෂණ, නිමින කටයුතු, නියාමන කටයුතු, සහ ගංගා ද්‍රෝණි මට්ටමින් භූගත ජලයෙහි තිරසාර සංවර්ධන කටයුතු සඳහා මුලිකත්වය ලබා දී ඇත. දැනට ජල සම්පත් මණ්ඩලය ප්‍රධාන වශයෙන් ජල සම්පත් පිලිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්යයට උර දෙමින් භූගත ජල නියාමනය සහ කළමනාකරණය පිළිබඳව දැඩි අවධානයක් යොමු කරමින් පවතී.

ඒ අනුව, ජල සම්පත් මණ්ඩලය මඟින් 2022 වර්ෂය සඳහා සැලසුම් කල පරිදි පහත සඳහන් ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. මුලික වශයෙන් ව්‍යාපෘති සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් ප්‍රධාන අංශ 3කට වෙන් කල හැක.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති, උත්පාදිත අරමුදල් යටතේ සිදු කරන ක්‍රියාකාරකම් සහ විදේශ ආධාර යටතේ ක්‍රිතයාත්මක වන ව්‍යාපෘති ලෙස වේ.

භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

2022 වර්ෂයේදී ව්‍යාපෘති 9ක් සිදු කරන ලදී.

භූ ගත ජලය සඳහා සංවේදී ප්‍රදේශ තුළ දීර්ඝ කාලින භූගත ජල නියාමන ව්‍යාපෘතිය (LTGM) යටතේ, දිවයිනේ ප්‍රදේශ 12ක පමණ භූගත ජල මට්ටම සහ භූගත ජලයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කරනු ලැබේ. ජල සාම්පල එක් රැස් කිරීම සඳහා ඉලක්කගත ජල සාම්පල 2095 න් 98% ක ප්‍රගතියක් ළඟා කරගන්නා ලද අතර එක් රැස් කරන ලද සාම්පල 2095 (ඉලක්කගත) න් 48%ක ප්‍රකමාණයක රසායනික විශ්ලේෂණය සිදු කර ඇත.

කාළගුණික වෙනස්වීම් මත ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ජලධරයන් වලට ඍජුව හා වක්‍රාකාරව සිදුවන බලපෑම් අධ්‍යයනය (SICC) යටතේ, භූගත ජලයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවයේ විචලනය පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ බටහිර සහ නැගෙනහිර වෙරළබඩ තීරය තෝරා ගන්නා ලදී. ඉලක්ක ගත භූ සමීක්ෂණ 10 සහ නල ළිං ඉදි කිරීම (10) යන කටයුතු වලින් 100% ප්‍රගතියක් ලග කරගන්නා ලදී. එමෙන්ම ඉලක්කගත ජල සාම්පල 220ක් එක්රැස් කිරීම සහ ක්ෂේත්රයයේදී රසායනික පරීක්ෂාවට ලක් කිරීමේ කටයුතු 84% ක ප්‍රගතියක් ලඟා කරගන්නා ලදී. විද්‍යාගාරය තුලදී ජල සාම්පල රසායනික විශ්ලේෂණයට ලක් කිරීමේ කටයුතු වල 31%ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.

මා ඔය ගංගා ද්‍රෝණිය තුල භූජල විද්‍යාත්මක තක්සේරුව හා භූ ගත ජල ආරෝපණය සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම (Ma-Oya) යටතේ, භූ ගත ජල මට්ටම් සහ භූ ගත ජලයේ ගුණාත්මක භාවය මුලිකව පරීක්ෂා කිරීම සඳහා ඉලක්කගත සාම්පල 100 එක්රැස් කරන ලදී (ප්‍රගතිය 100%). ඉලක්කගත භූ විද්‍යා සමීක්ෂණ 50න් ද 100% ක ප්‍රගතියක් ඇති කර ගන්නා ලදී. මීට අමතරව ගමුරු නළ ළිං ඉදි කිරීමේ කටයුතු වල 50%ක ප්‍රගතියක් ලඟා කර ගන්නා ලදී.

භූ ගත ජලය සම්බන්ධ ගැටළු පිළිබඳ සංයුක්ත පරීක්ෂණ යටතේ ඉලක්කගත රැස්වීම් සහ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ 100න් 80%ක ප්‍රගතියක් ඇති කරගෙන ඇත. මීට අමතරව භූගත ජලය සම්බන්ධ ගැටළු පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ ඉලක්කගත වැඩසටහන් 15 න් 12%ක ප්‍රගතියක් ලඟා කර ගන්නා ලදී.

ශ්‍රී ලංකාව සඳහා භූගත ජල සිතියම් සකස් කිරීම යටතේ දත්ත එක්රැස් කිරීම, සකස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ සිතියම් සකස් කිරීම යන ක්‍රියාකාරකම් වල 100%ක ප්‍රගතියක් අත් කරගන්නා ලදී. රටේ භූ ගත ජල සම්පත පිළිබඳව අවදානම් තත්ත්ව සිතියම් සහ ඵලදායිතාවය පිළිබඳව සිතියම් සකස් කිරීම 70%ක ප්‍රගතියක්ද, අවසන් සිතියම් සහ වාර්තාව සකස් කිරීම 60%ක ප්‍රගතියක්ද ලඟා කරගෙන ඇත.

යටිතල පහසුකම් සංවර්ධනය, විද්‍යාත්මක උපකරණ වල ක්ෂමතාවය වර්ධනය කිරීම සහ ආයතනය තුල නිපුණතා සංවර්ධනය කිරීම යටතේ 2022 වසර තුල, ජලයේ pH මැනීමේ උපකරණ 2ක් පමණක් මිලදී ගන්නා ලදී.

ජල අංශයට අදාල නියඟ, ගංවතුර, භූ ගත ජලය දූෂණය වීම ආදී හදිසි ආපදා තත්ත්ව සඳහා ක්‍රියාත්මක

වීමයටතේ ඉලක්කගත මුලික භූගත ජල සමීක්ෂණ කටයුතු 10 න් 40%ක ප්‍රගතියක් අත් කර ගත් අතර ඉලක්කගත නිෂ්පාදන නළ ළිං 10 ක් ඉදි කිරීමේ කටයුතු වලින් 60%ක ප්‍රගතියක් ලඟා කරගන්නා ලදී.

උත්පාදිත අරමුදල්

උත්පාදිත අරමුදල් යටතේ, වාණිජ්‍යමය ක්‍රියාකාරකම්, භූ ගත ජල නියාමන කටයුතු සහ පර්යේෂණ මට්ටමින් සිදු කරන වානජ්‍ය ව්‍යාපෘති සිදු කරන ලදී.

භූ ගත ජල සමීක්ෂණ (ඉලක්කය-425, ප්‍රගතිය-451 ප්‍රගතිය 106%), නළ ළිං ඉදි කිරීම (ඉලක්කය - 100, ප්‍රගතිය 55 (55%), ජල ධාරිතා පරීක්ෂණ (ඉලක්කය - 175, ප්‍රගතිය 159 (91%), නළ ළිං පිරිසිදු කිරීම (ඉලක්කය - 10, ප්‍රගතිය 04(44%), ජල සාම්පල රසායනික විශ්ලේෂණය (ඉලක්කය -900, ප්‍රගතිය 1044(116) ආදී ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

මීට අමතරව භූගත ජල නියාමන කටයුතු යටතේ, පුද්ගලික විදුම් ආයතන 52ක් ලියාපදිංචි කරන ලදී. විදුම් යන්ත්‍ර 72ක් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කරන ලදී. බාහිර භූ ජල විද්‍යාඥයින් 10ක් ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි කරන ලදී. බාහිර භූ ජල විද්‍යාඥයින් විසින් යොමු කරන ලද භූ ජල විද්‍යා සමීක්ෂණ වාර්තා 583ක් අනුමත කරන ලදී. ජල මනු 04ක් සවි කරන ලදී. භූගත ජලය භාවිතා කරන ආයතන (600) වලින් භූ ගත ජලය භාවිතය පිලිබඳ තොරතුරු චික්රැස් කරන ලදී. භූගත ජලය සම්බන්ධ ගැටළු හා නියාමන කටයුතු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 20ක් පවත්වන ලදී. තවද බාහිර විදුම් නිලධාරීන් 15 දෙනෙකු පුහුණු කරන ලදී.

තවද, දියවන්නා ඔය උප ද්‍රෝණිය ආශ්‍රිතව සහ නොරොච්චෝලේ ලක්විජය බලාගාරය අශ්‍රිතව පර්යේෂණ මට්ටමින් සිදු කරන වානිජ්‍ය ව්‍යාපෘති දෙකක් සිදු කරන ලදී.

විදේශ ආධාර යටතේ සිදු කරන ව්‍යාපෘති.

භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතිය මෙම ආධාර යටතේ සිදු කරන ලදී. මෙහිදී, මල්වතුඔය, කුඹුක්කන් ඔය, මදුරු ඔය ගංගා ද්‍රෝණි වල සහ යාපනය අර්ධද්වීපය, පුත්තලම යන ප්‍රදේශ වල පරීක්ෂණ නළ ළිං 190ක් ස්ථාපිත කරන ලද අතර ඒවායේ භූ ගත ජලය පිලිබඳ දත්ත ලබා ගන්නා උපකරණ සවි කරන ලදී.

විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් හා විගණන වාර්තා වල පෙන්වා දී ඇති ගිණුම්කරණ හා කළමනාකරණ දුර්වලතා නිවැරදි කිරීම පිණිස ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග

1. විගණන වාර්ථාවෙන් පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩුපාඩු ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

2. භූගත ජල නියාමන කටයුතු ක්‍රිමවත්ව පවත්වාගෙන යාම සඳහා වන කරුණු ජල සම්පත් පනතට ඇතුලත් කිරීම සඳහා සංශෝධන ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය සඳහා ගරු ඇමතිතුමාට සහ අමාත්‍යාංශ ලේකම්තුමාට යොමුකර ඇත.

3. භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලින් වාර්තා වී ඇති අනවශ්‍ය තොග හදුනාගෙන ඉවත් කිරීම සිදුකර ඇත.

4. නෙදර්ලන්ත ව්‍යාපෘතිය

   (1) මෙම ව්‍යාපෘතිය විසින් භාරදීමට නියමිත භාණ්ඩ සහ පරීක්ෂණ නළ ලිං ගිණුම් පොත්වලට ගැනීම සඳහා කටයුතු සලසා ඇත.

   (2) පැරණි නළ ලිං 190 කින් ස්වයංක්‍රීව ලබාගනු ලබන දත්ත දෛනිකව රත්මලාන දත්ත මධ්‍යස්ථානය වෙත ලබාදෙනු ලබන දත්ත අතර එම දත්ත ගබඩා කිරීම විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය අංශයට ලබාදීමට සැලසුම් කර තිබේ.

ජල සම්පත් මණ්ඩලයේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා 2022 වර්ෂය තුලදී ගන්නා ක්‍රියාමාර්ග

(1) ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන කාර්යයන් නිම කිරීම සඳහා භූගත ජල නියාමන (Netherland) ව්‍යාපෘතිය යටතේ ලැබී ඇති විදුම් උපකරණ හා භූජල විද්‍යා උපාංග උපයෝජනය කර ගැනීමට සැලසුම්කර ඇත.

(2) ජල සම්පාදන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල දෙපාර්තුමේන්තුව හා ජල සම්පත් මණ්ඩලය එකතුව සම්පත් හා හැකියාවන් හුවමාරු කරගනිමින් කාර්යක්ෂමතාවය ඉහල නැංවීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

.

(3) භූගත ජල නියාමන කටයුතු තවදුරටත් විධිමත් කිරීම සඳහා වාණිජ අරමුණෙන් ජලය උකහාගෙන සිදුකරනු ලබන ජල බෝතල් හා බීම නිෂ්පාදන කර්මාන්ත සඳහා අනුමැතිය ලබාදීමේදී ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනයෙන් හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ අදාල අංශ හා ඒකාබද්ධ වී කටයුතු කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස්කර ගැනීමට ජල සම්පත් මණ්ඩලය මුලික වී කටයුතු කිරීම.

(4) ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා භූ ජල අංශයෙන් උපදෙස් ලබාදීම එම කමිටු හරහා සිදුකරන ලදී.

රසායනාගාර කටයුතු ප්‍රවර්ධනය සඳහා අප ජලය කළමනාකරණය සඳහා රසායනාගාරයක් රත්මලාන පරිශ්‍රයේ ඉදිකරන ලදී. රසායනාගාරවලට අවශ්‍ය රසායනද්‍රව්‍ය නොඅඩුව ලබාදීම සහ රසායනාගාර තත්වය ඉහල දැමීම සඳහා Accreditation අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම.